වාර්ෂික වාර්තාව
2019

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය

පටුන

සාමාන්‍යාධිකාරිතුමාගේ ප්‍රකාශය

1 පොදුහැඳින්වීම

අපගේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ	01
සංස්ථාපිත තොරතුරු	02
අධ්‍යක්ෂ මණ්ඩලය	03
ආයතනයේ සංවිධාන ව්‍යුහය	04
සංස්ථාපිත කළමනාකරණය	05
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිස්ත්‍රික් කාර්යාල ජාලය	06 - 07

2 සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	08
විගණන හා කළමනාකරණ	08
මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම	09
අභ්‍යන්තර පාලනය	09
විධායක කළමනාකරණය	09
අවධානම් කළමනාකරණය	09 - 10
පාරිසරික ගැටළු	11

3 ප්‍රධාන ක්‍රියාකාරකම් වාර්තාකරණය 11 - 13

-

4 මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාශය	14 - 17
දේපළ කළමනාකරණ කොට්ඨාශය	18 - 20
ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය	21 - 25
මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය	26 - 41
නීති අංශය	42 - 43
සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය	44 - 47

5 මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

අයකිරීම් ක්‍රියාකාරීත්වය	48 - 55
අභ්‍යන්තර විගණන අංශය	56
තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය	57 - 65
ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගම	66 - 67

6 මුල්‍යමය ප්‍රකාශන

මුල්‍ය තත්ව ප්‍රකාශනය	68
මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	69
ගිණුම් ප්‍රතිපත්ති	70 - 79
මුල්‍ය ප්‍රකාශනවල සටහන්	80 - 104

7 විගණකාධිපති වාර්තාව 105 - 118

සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පුරවැසියෙකුටම ස්ථීර නිවසක් ලබා දීමේ අරමුණින් 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන **"සැමට සෙවණ"** නිවාස වැඩ සටහන යටතේ 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩ සටහන ක්‍රියාවට නැංවීමේදී අභියෝග රැසකට මුහුණ දීමට සිදුවූ වර්ෂයක් ලෙස මෙම වසර හැඳින්විය හැකිය.

අනපේක්ෂිත මොහොතක මුළු රටම අස්ථාවරත්වයට පත්කරමින් සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව වර්ෂය අවසානයේ සිදුවූ දේශපාලන හා පරිපාලන වෙනස්කම් සමග සැලසුම් කරන ලද සංවර්ධන වැඩ සටහන සංශෝධනය කර ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලදි.

වර්ෂය ආරම්භයේ සැලසුම් කල වැඩ සටහන් හා ව්‍යාපෘති සැලසුම් කල පරිදි ආරම්භ කිරීමට හැකි වුවද අනපේක්ෂිත ලෙස වර්ෂය අවසාන භාගයේ මුහුණ දීමට සිදුවූ අභියෝග හමුවේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති හා වැඩ සටහන් අවසන් කිරීමේ සැබෑ අභියෝගයකට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මුහුණ දුන් තීරණාත්මක වසරක් ලෙස 2019 වර්ෂය හඳුන්වා දිය හැක. මුළු රටම අකර්මන්‍ය කරමින් සෑම ක්ෂේත්‍රයකම සිදුවූ පසුගාමී තත්වය හමුවේ බොහෝමයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන පවත්වාගෙන යාමේ අර්බුදයකට මුහුණ පා තිබූ මොහොතක ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සිය සංවර්ධන කටයුතු අඩාලවීමට නොදී වර්ෂය තුල ණය ආපසු අයකිරීම්, කුලී හා දේපළ අලෙවියෙන් අභ්‍යන්තරිකව රුපියල් මිලියන 5985.6 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල එකතුකර ගැනීමට හැකිවීම ජයග්‍රහණයකි. වර්ෂය තුල ආයතනය පවත්වාගෙන යාමේ වියදම් වශයෙන් රුපියල් මිලියන 3598/- ක මුදල සම්පූර්ණයෙන්ම අභ්‍යන්තරිකව එකතු කරනු ලබන අරමුදලින් යොදාගෙන සේවක සුභසාධනයද අඩුවක් නොකොට පවත්වාගෙන යාමට හැකිවීම ආයතනයක් වශයෙන් නිහතමානීව ආඩම්බර විය හැකි කරුණකි.

මෙම අසීරු අවස්ථාවේ වුවද 2019 වර්ෂය තුල රජයේ ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 11,000/- කට වැඩි ප්‍රමාණයක් නිවාස ක්ෂේත්‍රය තුල ආයෝජනය කිරීමට හැකි වූ අතර, වර්ෂය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් නිවාසකරණය සඳහා සෘජුවම කළ ආයෝජනය රුපියල් මිලියන 13,000/- ක් පමණ වේ. මෙම ආයෝජනයන් තුලින් නිවාස 77,755 ක ඉදිකිරීම් ආරම්භ කිරීමටත්, එයින් නිවාස 31,833 ක වැඩ අවසන් කර ජනතාවට පදිංචිවීමට අවස්ථාව සැලසීමට හැකිවිය. එහිදී නිවසක් හෝ ඉඩමක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ස්ථීර නිවසක් ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක කල උදාගම්මාන වැඩ සටහන යටතේ වැඩ අවසන් කර සියළුම යටිතල පහසුකම් සහිතව නිවාස ව්‍යාපෘති 141 ක් ජනතා අයිතියට පත්කිරීමට කටයුතු කරන ලදි. එමෙන්ම නිවාස සංවර්ධන ක්‍රියාවලිය හා සමගාමීව ප්‍රතිලාභී පවුල් වල දේපළ අයිතිය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ සටහන් තුලින් සින්නක්කර ඔප්පු 1224 ක් පිරිනැමීමට හැකිවිය.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අභියෝග රාශියක් මැද කැපවීමෙන් ක්‍රියාකල සමස්ථ සේවක ප්‍රජාවට හද පිරි ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ලලිත් එදිරිසිංහ
සාමාන්‍යාධිකාරී (වැ.බ)

1. පොදු හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇති මෙම අදිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ උප කාර්යාල 09 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලබයි.

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු නිවසක් හිමිකර දීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සහන මිලට නිවසක් ඉදිකර ලබාදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම. එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකරදීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව අපගේ අරමුණු වන්නේ ....

- මහල් නිවාස හා වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරිමෙහිලා කෙළින්ම නියුක්තවීම.
- නිවාස හිගය අඩු කිරිම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරිම සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරිම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනත්ත කුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමානවන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියළු අංශවලට අදාළවන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරිම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකරවිය හැකි වෙනත් සියළුම ක්‍රියාකාරකම්වල යෙදීම.

පරමාර්ථ


- අඩු ආදායම්ලාභී පවුල් වලට නිවාස ඉදිකර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- අන්ත දුගී පවුල් වලට නිවාස ඉදිකරගැනීම සඳහා සහාය ලබාදීම.
- මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නිවාස පහසුකම් සැලසීම සඳහා ඍජුව සම්බන්ධවීම හා සම්බන්ධීකරණය කිරිම.
- මධ්‍යම ආදායම් ඇති පවුල් සඳහා දූරිය හැකි මිලකට නිවාස ඉදිකිරිම පිණිස අදාළ ඉදිකිරිමේ කටයුතු සිදුකරන්නන්හට පහසුකම් සැපයීම.
- නිවාස ඉදිකිරිමේ අරමුණු සඳහා ඉඩම් කැබලි ඍජුව ලබාදීම හෝ පහසුකම් සැලසීම.
- නිවසක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරිම.
- පැරණි නිවාස සංකීර්ණයන්වලට ජීවත් වීමට සුදුසු ප්‍රසන්න පරිසරයක් තහවුරු කිරිම.
- නාගරික අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස සපයාදීම.
- කාර්යක්ෂම ගුණාත්මක සහ ස්ථිරසාර සේවාවක් සැපයීම.

1.2 සංස්ථාපිත තොරතුරු

නම	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නෛතික භාවය	:	1979 අංක 17 දරණ පනත
සංස්ථාපිත වර්ෂය	:	1979
ලියාපදිංචි කාර්යාලය	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහලේකම් කාර්යාලය, අංක 34 , සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය	:	2421606 , 2431707 , 2430410 , 2431722 2421748 , 2380874
ෆැක්ස්	:	2434892
විද්‍යුත්තැපෑල	:	chairman@nhda.lk
වෙබ් අඩවිය	:	www.nhda.lk
විගණකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
උපදේශන නීතිඥවරු	:	නීතිපති නීතිපති දෙපාර්තමේන්තුව හල්ස්ඩෝෆ් , කොළඹ 12.
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව , ආයතනික ශාඛාව , ඇව්ලන් චතුරශ්‍රය , කොළඹ 01.
	:	මහජන බැංකුව , මූලස්ථාන ශාඛාව, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල විස්තරය



1. **සභාපති**
එල්. එස්. පලන්සූරිය මහතා
නො.06 , සුදර්ශන පාර ,
හීල් වීදිය,
දෙහිවල



2. **උප සභාපති**
කරුණාරත්න අතුකෝරල මහතා,
අංක 58, දික්හේනපුර ,
මූනගම ,
හොරණ.



3. **ක්‍රියාකාරි අධ්‍යක්ෂ**
කේ. ජී. වික්‍රම මහතා,
නො.55ඒ. උඩුමුල්ල පාර.
බත්තරමුල්ල.



4. **සාමාජික**
ආර්. ඒ. චූලනන්දා මහත්මිය,
අතිරේක ලේකම් ,
අංක 17/43, 5 වන පටුමග, පුබුදු මාවත.
මත්තේගොඩ.




5. **සාමාජික**
අමල් වික්‍රමතුංග මහතා
134/එෆ්, නාගහවත්ත පාර,
දළුගම,
කැළණිය.

6. **සාමාජික**

ඒ. ඩී. එල්. පී. කලංසූරිය මහතා

7. **සාමාජික**
එස්. පී. වී. එස්. එම්. ගුණසේකර මහතා

1.4 ආයතනයේ සංවිධාන ව්‍යුහය



1.5 සංස්ථාපිත කළමනාකරණය

එම්. එස්. වීරසිංහ මහත්මිය
සාමාන්‍යාධිකාරී (2019 ඔක්තොබර් දක්වා) /
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

පී. එම්. එල්. පී. එදිරිසිංහ මහතා
වැ.බ. සාමාන්‍යාධිකාරී (2019 ඔක්තෝබර් සිට)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන)
වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක)

ඊ. ඒ. ඩී. එස්. එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

එච්. එච්. ලීලානන්ද මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමනාකරණ හා අලෙවි)

ඒ. කේ. පුෂ්පා රෝහිණී මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

පී. ඒ. එස්. පී. ආරියවංශ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)

එම්. ප්‍රේමතිලක මහතා
වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා ප්‍රගති)

ආර්. එම්. යු. ඩබ්. රත්නායක මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

නීතිඥ මනෝරි ටී. ඔලබොඩුව
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

1.6 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලන දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත වී ඇති ආකාරය



දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන් හා දුරකථන අංක

දිස්ත්‍රික් කාර්යාලය	ලිපිනය	දුරකථන අංකය	ෆැක්ස්	ඊ මේල්
අම්පාර	පොලිස් නිවාස පාර , අම්පාර.	063-2222045	063-2222045	dmampara@nhda.lk
අනුරාධපුර	අංක 390 , බණ්ඩාරනායක මාවත, නව නගරය, අනුරාධපුර.	025-2222649	025-2222649	dmanuradhapura@nhda.lk
බදුල්ල	ක්ලිනික් පාර, බදුල්ල.	055-2222113	055-2222113	dmbadulla@nhda.lk
මඩකලපුව	සරවනා පාර , කල්ලඩි , මඩකලපුව.	065-2224473	065-2224473	dmbatticaloa@nhda.lk
කොළඹ	246 බී , හයිලෙවල් පාර , කොට්ටාව.	011-2178224	011-2178224	dmcolombo@nhda.lk
කොළඹ නගර-උ	පරිසර මාවත , මාළිගාවත්ත , කොළඹ 10.	011-445546	011-2435146	dmccity@nhda.lk
කොළඹ නගර-ද	280/11, මැනිංටවුන් නිවාස ක්‍රමය, ඇල්විටිගල මාවත, කොළඹ 08.	011-679857	011-2669753	dmmtown@nhda.lk
ගාල්ල	ඊ-කෝට් බිල්ඩින්, පෙල්ඩර් විදිය, කොටුව , ගාල්ල.	091-2234232	091-2234232	dmgalle@nhda.lk
ගම්පහ	වලව් වත්ත, ගම්පහ.	033-2226017	033-2234265	dmgampaha@nhda.lk
හම්බන්තොට	42 , අලුත් පාර , හම්බන්තොට.	047-2220263	047-2220263	dmhambantata@nhda.lk
යාපනය	වන සංරක්ෂණ කාර්යාල පටුමග, ඡුන්ඩික්කුලි , යාපනය.	021-2222039	021-2226941	dmjaffna@nhda.lk
කළුතර	3 වන මහල, කච්චේරි සංකීර්ණය , කළුතර.	034-2221299	034-2222298	dmkalutara@nhda.lk
මහනුවර	කච්චේරි සංකීර්ණය , යටිනුවර විදිය, මහනුවර.	081-2223139	081-2223139	dmkandy@nhda.lk
කෑගල්ල	අඹන්පිටිය, ගලිගමුව නගරය (කෑගල්ල)	035-2229737	035-2229738	dmkegalle@nhda.lk
කිළිනොච්චිය	155 වැනි සැලපුම් කණ්ඩුව (ඒ-9 නුවර පාර) කිලිනොච්චිය	021-2285757	021-2285757	dmkilinochchi@nhda.lk
කුරුණෑගල	05, මිහිඳු මාවත , කුරුණෑගල.	037-2222014	037-2222014	dmkurunegala@nhda.lk
මන්නාරම	පල්ලිමුණේ පාර, මන්නාරම.	023-2222315	023-2222141	dmmannar@nhda.lk
මාතලේ	833/ඒ , අළුවිහාරේ , මාතලේ.	066-2222134	066-2222134	dmmatale@nhda.lk
මාතර	දුම්රියපල පාර, මාතර.	041-2222986	041-2222986	dmmatara@nhda.lk
මොණරාගල	වැල්ලවාය පාර, මොණරාගල .	055-2276202	055-2276202	dmmonaragala@nhda.lk
මුලතිව්	ඒ-9 නුවර පාර, මාන්කුලම් (මුලතිව්)	021-2060033	021-2060022	dmmullaitivu@nhda.lk
නුවරඑළිය	උඩුපුස්සැල්ලාව පාර, හාවාඑළිය (නුවරඑළිය)	052-2222925	052-2222925	dmneliya@nhda.lk
පොලොන්නරුව	පුලතිසිපුර , හිගුරක්ගොඩ (පොලොන්නරුව)	027-2246362	027-2246362	dmpolonnaruwa@nhda.lk
පුත්තලම	තම්මැන්නාගම , ආණමඩුව (පුත්තලම)	032-2263425	032-2263425	dmputtalam@nhda.lk
රත්නපුර	නව නගරය , රත්නපුර.	045-2228996	045-2228996	dmrathnapura@nhda.lk
ත්‍රිකුණාමලය	බලාගාරය පාර , ත්‍රිකුණාමලය.	026-2222503	026-2222503	dmtrinco@nhda.lk
වවුනියාව	උද්‍යාන පාර , වවුනියාව.	024-2222214	024-2222050	dmvavuniya@nhda.lk

2. සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම් දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනයේ ප්‍රමිතීන් මෙන්ම රාජ්‍ය ව්‍යාසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදි ආයතන අමාත්‍යාංශ මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිටම උත්සාහ කරන අතර, ගරු අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන තීරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා අමාත්‍යාංශය මගින් ලබාදෙන නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම.

2.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වෙන අතර අවශ්‍යතාවය අනුව මසකට රැස්වීම් කිහිපයක් වුවුද පැවැත්වීමට සිදුවේ. අයවැයට සාපේක්ෂකව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයක් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. 2019 වසර තුල රැස්වීම් වාර 17 ක් පවත්වන ලදි.

2.2 විගණන හා කළමනාකරණ කමිටු

සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරු 03 දෙනකුගෙන් සමන්විත විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමට අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා රජයේ විගණක අධිකාරි සමගින් ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහභාගී වේ.

විගණන හා කළමනාකරණ කමිටු මගින් ගිණුම් හා මුල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාල නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ. 2019 වසර තුල විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 05 ක් පවත්වා ඇත.

විගණන හා කළමනාකරණ කමිටු විසින් ගිණුම් හා මුල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කරන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාළ නීති රීති අනුව අභ්‍යන්තර පාලනය, ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2019 වර්ෂයේ පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් හා බාහිර නිළධාරීන් එනම් මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ, රජයේ විගණක, නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක කළමනාකරණ කමිටු සාමාජිකයින් ලෙස සේවය කර ඇත.

1. එම්. ඩී. නවරත්න මහතා - සභාපති
   (අධ්‍යක්ෂ මුදල් අමාත්‍යාංශය)

2. කේ. අතුකෝරළ මහතා - සාමාජික
   (උප සභාපති / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

3. කේ. ජී. වික්‍රම මහතා - සාමාජික
   (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

4. ආර්. එස්. සමරක්කොඩි මහතා - සාමාජික
   (ප්‍රධාන අභ්‍යන්තර විගණක -
   නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය)

5. වී. ඩී. සීතා මහත්මිය
   (විගණන අධිකාරි - රජයේ විගණන) - සාමාජික

2.3 මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම

ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්, සභාපති, උප සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරී හා සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, දිස්ත්‍රික් කළමනාකරුවන්, අමාත්‍යාංශයට සම්බන්ධිත ආයතන වල ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සතිපතා ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.

2.4 අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම් වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් ක්‍රියාත්මක කර ඇත. නියෝජ්‍ය සමාන්‍යාධිකාරි කොට්ඨාශ අනුව එම කොට්ඨාශයන්හි අංශ අනුව ධුරාවලියවකට වගකීම් ඉහළ සිට පහලට බෙදා හැර ඇත. එසේම එක් අයෙකුගේ රාජකාරිය තවත් අයෙකුගේ රාජකාරිය තුලින් ස්වයංක්‍රියව පරීක්ෂාවකට භාජනය වන පරිදි රාජකාරි බෙදා හැර තිබේ.

ඒ හා සමානව අධ්‍යක්ෂ මණ්ඩලය මනාව සැකසුනු මාසික වාර්තා කරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර, වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර, සියළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශවල කටයුතු පිළිබඳ සාකච්ජා කරනු ලබයි. මිල කමිටු , දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු , දේපල අනු කමිටු හා අභියාචනා කමිටු, විනය කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත. අවශ්‍යතාවය පරිදි එම කමිටුවලද රැස්වීම් පවත්වා තීරණ ගනු ලැබේ.

2.5 විධායක කළමනාකරණය

ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමග කලාප හා උප කාර්යාල 09 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/දිස්ත්‍රික් කළමනාකරු හා කළමනාකරු සතු වේ.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු / දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරි වෙත වාර්තා කල යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරි විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කල යුතුය.

2.6 අවධානම් කළමනාකරණය

විශාල සේවාදායකයන් සමුහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල් කරුවන්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මුල්‍යමය සහ මුල්‍යමය නොවන අවධානම් රාශියකට මුහුණු දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම අරමුණු ළඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමනාකාරීත්වයේ උපදෙස් මත ප්‍රතිපත්තීන් , ක්‍රියාමාර්ග සහ අවධානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික මෙන්ම ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස අරමුණු ලගාකර ගැනීම සිදු කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් හා පාලනය කළහැකි පද්ධතීන් වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමග සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්වයේ ප්‍රමාණත්මතාවය පිළිබඳව ස්වාධින අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලබයි.

2.6.1 ද්‍රවශීලී අවධානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවධානමට ගොදුරුවේ. ඒවායේ කාලය ඉකුත් අවස්ථාවලදි මුල්‍යමය වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැන නැගුණ අවස්ථාවලදි ඒවායෙහි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම, ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වන බව තහවුරු කිරීම ආදි ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයින් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජේෂ්ඨ කළමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ලඟාකර ගැනීම සඳහා,

- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ගප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල්ඉපයීමේ ක්‍රියාමාර්ග බාලානුරූපීව නැවත සලකා බැලීම.
- පවතින මිල ගණන් සමාලෝචනයට ලක් කරන අතරම, තරඟකරුවන්ගේ මිල ගණන් විශ්ලේෂනයක් සිදු කිරීම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මග පෙන්වීම.

ප්‍රධානයන් , අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

2.6.2 වෙළඳපොල අවධානම

මිල සංවේදි වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩු හා සම්බන්ධව මෙම අවධානම ප්‍රදාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමග ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල දෝලනය වීම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ.

වෙළඳ පොලේ නිවාස සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් නිවාසයන්හි මිල ඉහලයාමේ අවදානම පාලනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන වල මැදිහත්වීම අවශ්‍යවේ.

රුපියල අවප්‍රමාණය වීමත් සමග ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහල යාම විශේෂයෙන් වහල සෙවිලි ද්‍රව්‍ය , ටයිල් වර්ග හා නාන කාමර අයිතම වල සිදුව ඇති අධික මිල ඉහල යාමේ අවධානම හා ශ්‍රමය සඳහා වන වියදම් වල ඉහල යාම වෙළඳ පොල මිල ගණන් වලට නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළඳ පොල අවධානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවා දායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළඳ පොලට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

2.6.3 මෙහෙයුම් අවධානම

භාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට ඉාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇතිවේ.

සංවිධානය තුල යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරී පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියක් අවධානම් පාලනය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලැබේ.

උද්ධමනය ඉහල යාමත් සමග පාරිභෝජන වියදම් ඉහලයාම හේතුවෙන් පුද්ගල ඉතිරිකිරම් පහල යාම හේතුවෙන් ණය ආපසු ගෙවීම අඩුවීමත් ඒ තුලින් සංවර්ධන වැඩසටහන් වලට කරන අහිතකර බලපෑම් හා නිවාස ඉදිකිරීමේදී අපේක්ෂිති ප්‍රතිලාභී දායකත්වය නොලැබීමේ අවධානම.

ඵලදායි ක්‍රියාකාරී අවධානම් කළමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂාකරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත විශ්ලේෂණයහා වාර්තාකරණය
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩ සටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන් වල ක්‍රියාකාරීත්වය

මෙහෙයුම් අවධානම් පාලනය කිරීම මධ්‍යම කළමනාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වා ගැනීම සඳහා මුදල්, විගණන හා අනෙකුත් සහායක සේවා අංශ මගින් මහඟු කාර්යයක් ඉටු කරයි.

වටිනා දේපල ප්‍රමාණයනක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරයතුල දී සාර්ථකත්වය ලඟාකර ගැනීම අපේක්ෂා කළහැකිය.

2.7 පාරිසරික ගැටළු

මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති , ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ අදාළ පළාත් පාලන ආයතන වල නිර්දේශ වලට අනුව පරිසර සංවර්ධන වැඩ පිලිවෙල ක්‍රියාත්මක කරමින් පරිසරයට අවම හානියක් වන ආකාරයට හා පරිසරයට ගැලපෙන ව්‍යෘපෘති ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත හා යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග , අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීති රීති මගින් සභාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට වඩා යහපත් පරිසරයක් සහතික කිරීම.

ජනාධිපති විශේෂ කාර්යය සාධන බලකා වැඩ සටහන් යටතේ පරිසර සංවර්ධනය අරමුණු කරගෙන ආදර්ශ ගම්මාන වැඩ සටහන යටතේ නිවැසියන්ට ඒ ඒ පරිසරයට ගැලපෙන පැළ වර්ග හා ඔසු උයන් නිර්මාණය කිරීම තුලින් පරිසර පද්ධති සංතුලිත කිරීම හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

නිවාස වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී ස්වභාවික විපත් විශේෂයෙන් නාය යාමේ අවධානම සහිත ප්‍රදේශ , ගංවතුරෙන් හා සුනාමි අවධානම් ඇති ප්‍රදේශ මෙන්ම උග්‍ර ජල භිග ඇති කඳුකර ප්‍රදේශවල නිවාස ඉදිකිරීමේදී ඇති අවධානම.

තුස්ත විපත් හා බෝවන රෝග වැනි ව්‍යවසන පිළිබඳ අවධානම.

3. ප්‍රධාන ක්‍රියාකාරකම්

විවිධ උපායමාර්ග හා ක්‍රියාකරකම් තුලින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවන ලදි.

3.1 අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස

ණය පහසුකම් ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම

- සහනදායී වාර්ෂික පොලියක් යටතේ පීවත්වන නිවස වැඩිදියුණු කර ගැනීමට හෝ නව නිවසක් ඉදිකර ගැනීමට ණය පහසුකම් ලබාදීම.
- නිවසක් හෝ ඉඩමක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ණය ආධාර ලබාදීම තුලින් ආදර්ශ ගම්මානවල නව නිවාස ඉදිකිරීම.
- වැඩිදියුණු කලයුතු නිවාස සංවර්ධනය කිරීම සඳහා බැංකු හා ඒකාබද්ධව සොදුරු පියස ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

3.1.1 ණය + ආධාර ලබාදීම තුලින් අර්ධ වශයෙන් නිම් නිවාස නිමහම් තත්වයට පත්කිරීම

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා ණය + ආධාර නිවාස සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම තුලින් අර්ධ වශයෙන් නිම් නිවාස නිමහම් තත්වයට පත්කිරීම.

3.1.2 මූල්‍යාධාර ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම

- නිවසක් හෝ ඉඩමක් නොමැති , ණය මුදල් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් දිළිඳු පවුල් සඳහා ග්‍රාම ශක්ති උදාගම්මාන තුලින් නව නිවාස ඉදිකිරීම.
- උතුරු නැගෙනහිර පළාත් වල පැවති යුද්ධය හේතුවෙන් අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ආධාර ලබාදීම තුලින් නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.
- දිළිඳු , ආබාධිත හා අසරණ පවුල් මෙන්ම රටට වැඩදායි සේවාවක් ඉටුකල විශේෂ සාමාජිකයන් සිටින පවුල් වෙනුවෙන් සෙවණ ආධාර ලබාදීම තුලින් නව නිවාස ඉදිකිරීම.

3.1.3 වකුගඩු රෝගී සාමාජිකයන් සිටින පවුල් වල නිවාස අවශ්‍යතා ඉටුකිරීම

3.1.4 ඉන්දියානු ආධාර වැඩසටහන

- ඉඩමක් හෝ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉන්දියානු රජයේ මූල්‍යාධාර තුලින් උතුර හා දකුණ පළාත්වල නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.

3.1.5 පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් පවුල් වල නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම

3.2 විරු සුම්තුරු නිවාස වැඩසටහන

- රට දැය වෙනුවෙන් දිවිපිදූ හා පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරු සාමාජිකයින් වෙනුවෙන් ආධාර ලබාදීම තුලින් නිවාස අවශ්‍යතා සපුරාලීම.

3.3 මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස

- ස්ථීර මාසික ආදායම් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් හා මැදි අදායම්ලාභී හා ඉහල ආදායම්ලාභී ව්‍යාපාරිකයින් සඳහා රාජ්‍ය හා පෞද්ගලික දායකත්වය තුලින් නව නිවාස ලබාදීමට සියලු පහසුකම් සහිත මහල් නිවාස ඉදිකිරීම.

3.4 රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය හවුල්ව නිවාස ඉදිකිරීම වර්ධනය කිරීම.

- යෝග්‍ය භූමි හඳුනාගැනීම.
- කැමති පාර්ශවයන් කැඳවා සුදුසු සංවර්ධකයින් සමග සාකච්ජා කිරීම සහ යෝජනා ලබා ගැනීම.
- යෝජනා ඇගයීම සහ සංවර්ධකයින් තෝරා ගැනීම.
- ව්‍යාපෘති සැලසුම් නිර්මාණය කිරීම හා ඒකාබද්ධ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සහ තත්වය සහතික කිරීම.
- අළෙවිකරණය සහ නිවාස විකුණුම්.
- කළමනාකරණ සංස්ථා පිහිටුවා ගැනීමෙන් ප්‍රතිලාභීන් දිරිගැන්වීම් සිදු කිරීම.

3.5 ජනාවාස ආශ්‍රිත මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

3.6 පැරණි නිවාස ක්‍රම නවීකරණය

- පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මහල් නිවාස අළුත් වැඩියා කිරීම.

3.7 නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම

- නිවාස යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම.
- ප්‍රජා සංවර්ධන සංවිධාන නිර්මාණය කිරීම.
- නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.
- අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.
- අවශ්‍යතාවය මත මුල්‍යමය සහාය සැපයීම.
- ඉදිකිරීම් වල තත්වය / අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.
- යටිතල පහසුකම් ඇති කිරීම / සම්බන්ධතාවය පැවැත්වීම.

3.8 නාගරික සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති)

- යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
- මැනුම් කටයුතු සිදුකිරීම.
- මුල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
- සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
- අයිතිය පැවරීම.

3.9 ඉඩම් කට්ටි ලබාදීම.

- යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
- යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- කැබැලි සැලසුම් පිළියෙල කිරීම.
- අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ඉඩම්ලාභීන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම.
- අවශ්‍යනම් ණය දෙන ආයතන සමග සම්බන්ධතාවය ඇති කරගැනීම.
- තෝරාගත් ඉඩම් ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.
- නිශ්චිත කාල පරාසයක් තුල එම ඉඩම් වල ප්‍රතිලාභීන්ට නිවාස ඉදිකර ගැනීමට මග පෙන්වීම.

3.10 ණය අයකිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

- වාර්ෂික ඉලක්ක ලබා දීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන පිලියම් යෙදීම.
- ණයකරුවන්ට තම ණය වාරික ආපසු ගෙවීමේ වගකීම හා ණය ගෙවීමේ වැදගත්කම තුලින් නැවත නිවාස සංවර්ධනයට එම මුදල් යෙදවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අයකිරීම් නියෝජිතයින් හා අයකිරීම් නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

3.11 නිවාස සම්බන්ධ උපදේශන සේවා

- දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- යෝග්‍යතා වාර්තා සකස් කිරීම.
- අවශ්‍ය අවස්ථාවේදි නිවාස සැලසුම් සැපයීම.
- ප්‍රමාණ / ද්‍රව්‍ය ලයිස්තු / පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සැලසුම් සඳහා අනුමැතියන් ලබා ගැනීම.
- ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ව සහතික වීම.

3.12 නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් අධිකාරියට පැවරීම.

- පොදු ප්‍රදේශ / විවෘත ස්ථාන වල මායිම් සලකුණු කිරීම.
- මිනින්දෝරු සැලසුම් පිලියෙල කිරීම.
- පළාත් අධිකාරියෙන් එකඟතාවය ලබා ගැනීම.
- ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.
- අඩු වියදම් තාක්ෂණික ක්‍රම පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.

3.13 කුසලතා වර්ධනය සඳහා පුහුණුව

- වෘත්තිය ආයතන සහ නියෝජ්‍ය ආයතන සමග සාකච්ඡා කර පුහුණු සැසි සංවිධානය කිරීම.
- වෘත්තිය පුහුණු අවස්ථා සැකසීම.
- මූලික උපකරණ සහාය සැපයීම.
- ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.
- වාසිදායි රැකියා සඳහා උපකාරවීමට දත්ත බැංකුවක් තුල පවත්වාගෙන යාම.
- කුසලතා ඇති පුද්ගලයන්ගේ තොරතුරු නාමාවලියක් පවත්වාගෙන යාම.

3.14 නිවාස තොග හා නිවාස අවශ්‍යතාව පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.

- ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමග සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශී කිරීම.
- පළාත් අධිකාරි සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
- කමිටුව භාර ගත් දත්ත පෙල ගැස්වීම.
- දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
- අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.
- ඔප්පුවක් මගින් දේපල පැවරීම.
- නිවාස හිමියන්ට දැනුම් දීම.

4 මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාශය

සැමට සෙවණ නිවාස වැඩසටහන

2019 වර්ෂය තුල ***සැමට සෙවණ නිවාස වැඩසටහන*** යටතේ පහත සඳහන් නිවාස වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

1. **උදා ගම්මාන වැඩසටහන**

- ආදර්ශ ගම්මාන ණය වැඩසටහන
- ග්‍රාමශක්ති ආධාර ගම්මාන වැඩසටහන
- උතුරු/නැගෙනහිර අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ආධාර වැඩසටහන (අම්පාර දිස්ත්‍රික්කය හැර)
- ඉන්දියානු ආධාර නිවාස ව්‍යාපෘති

2. **විසිරි නිවාස සංවර්ධන වැඩසටහන**

- විසිරි නිවාස ණය වැඩසටහන
- විසිරි නිවාස ණය + ආධාර වැඩසටහන
- ග්‍රාම ශක්ති විසිරි නිවාස ආධාර වැඩ සටහන
- සෙවණ ආධාර නිවාස වැඩසටහන
- සොඳුරු පියස බැංකු ණය වැඩසටහන

3. **විරු සුමිතුරු නිවාස ආධාර වැඩසටහන**

4. **වකුගඩු රෝගී පවුල් වෙනුවෙන් ක්‍රියාත්මක නිවාස ආධාර වැඩසටහන**

5. **වැලිඔය විශේෂ ආධාර නිවාස ව්‍යාපෘතිය**

6. **ගංවතුරෙන් හානියට පත් නිවාස සංවර්ධන වැඩසටහන**

7. **සිරස නිවාස වැඩසටහන**

8. **පාස්කු ප්‍රහාරයෙන් විපතටපත් පවුල් සඳහා වූ නිවාස වැඩසටහන**

9. **නිවාස ආශ්‍රිත සහායක සේවා**

- ග්‍රාමීය ජනාවාස වල යටිතල පහසුකම් සංවර්ධනය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකල නිවාස ව්‍යාපෘති වල යටිතල පහසුකම් හා ගොඩනැගිලි නවීකරණය කිරීම.

10. **පදිංචිකරුවන්ගෙ අයිතිය තහවුරු කිරීම සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.**

ග්‍රාමීය හා අර්ධ නාගරික අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස

1. උදා ගම්මාන වැඩ සටහන

1.1 ආදර්ශ ගම්මාන වැඩ සටහන

ජීවත් වීම සඳහා ස්ථීර නිවසක් නොමැති හා නිවසක් ඉදිකර ගැනීම සඳහා තමාට හෝ කලත්‍රයාට ඉඩම් කොටසක හිමිකාරිත්වය නොමැති පවුල් තෝරාගනිමින් සහභාගීත්ව ක්‍රමවේදය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එක් පවුලක් සඳහා රු.600,000/- ක ණය මුදලක් හා රු.150,000/- ක ද්‍රව්‍ය ආධාරයක් ලබාදෙනු ලබන අතර ප්‍රාදේශීය ලේකම් සම්බන්ධීකරණයෙන් ඉඩම් කැබැල්ලක් ලබාදී නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම මෙහි අරමුණයි. ඒ යටතේ අඩු ආදායම්ලාභී පවුල් හා වෘත්තිකයින් ඉලක්ක කරගනිමින් වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහන උතුරු පළාත , ත්‍රිකුණාමලය හා මඩකලපුව හැර සෙසු දිස්ත්‍රික් 18 ආවරණය වන පරිදි ව්‍යාපෘති 470 ක් ආරම්භ කිරීමට සැලසුම් කල අතර ඒ යටතේ නව නිවාස 12843 ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 10,762.5 ක් ඇස්තමේන්තු කරන ලදි. රාජ්‍ය අයවැය මගින් 2019 වර්ෂය සඳහා වෙන්වූ ප්‍රතිපාදන සීමාව තුල රුපියල් මිලියන 1790.0 ක් ඇස්තමේන්තු කල අතර ඒ යටතේ නිවාස 2500 ක් පමණක් වර්ෂය තුල වැඩ අවසන් කිරීමට සැලසුම් කරන ලදි. මීට අමතරව 2018 න් අවිච්ඡේදවූ නිවාස ව්‍යාපෘති 477 ක නව නිවාස 5573 ක වැඩ ආරම්භ කිරීමටත් රාජ්‍ය අයවැය මගින් වෙන්වූ ප්‍රතිපාදන සීමාව තුල නිවාස 3250 ක් පමණක වැඩ අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 1971.0 ක් ඇස්තමේන්තු කරන ලදි.

ඒ අනුව වර්ෂය තුල නව ව්‍යාපෘති 455ක නව නිවාස 9,870ක ඉදිකිරීම් ආරම්භ කළ අතර අවිච්ඡේද ව්‍යාපෘතිවල නිවාස 4,683ක් අළුතින් ආරම්භ කළ අතර නිවාස 1,869ක වැඩ අවසන් කරන ලදී. වර්ෂය තුල වැය කළ සමස්ථ මුදල රුපියල් මිලියන 2,855.551කි.

1.2 ග්‍රාම ශක්ති ආධාර ගම්මාන වැඩසටහන

ඉඩමක් හෝ නිවසක් නොමැති ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාව නොමැති දිළිඳු පවුල් තෝරාගෙන
රු. 750,000/- ක ආධාර මුදලක් හා ප්‍රාදේශීය ලේකම් සම්බන්කරණයෙන් ඉඩම් කොටසක් ලබාදී ව්‍යාපෘති ලෙස (ගම්මාන) මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයේ ව්‍යාපෘති 90ක නිවාස 2,369 ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1,776.75 ක මුදලක් ඇස්තමේන්තු කළ අතර, රාජ්‍ය අයවැය මඟින් වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුල 2019 වර්ෂය සඳහා රුපියල් මිලියන 430ක් ඇස්තමේන්තු කරන ලදී. වර්ෂය තුල නිවාස 250ක් අවසන් කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව 2019.12.31 වන විට ව්‍යාපෘති 76ක නිවාස 2,219ක ඉදිකරීම් ආරම්භ කිරීමට කටයුතු කළ අතර, වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 7ක් වේ. ඒ සඳහා වර්ෂය තුළ ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 134.668කි. ඊට අමතරව 2018 වර්ෂයෙන් අවිච්ඡේද වූ නිවාස 303ක වැඩ අවසන් කිරීමට හා අළුතින් නිවාස 704ක වැඩ ආරම්භ කිරීමට ඇස්තමේන්තු කරන ලදී. අවිච්ඡේද නිවාස 303ක වැඩ අවසන් කළ අතර, යෙදවූ මුදල රුපියල් මිලියන 393.58 ක් වේ.

1.3 උතුරු/ නැගෙනහිර පළාත්වල අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන

උතුරු/නැගෙනහිර පළාත්වල පැවති යුධමය වතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් සඳහා නව නිවාස ඉදිකිරීම මෙම වැඩ සටහනේ අරමුණයි. එක් පවුලත් සඳහා ජාතින නිවාස සංවර්ධන අධිකාරිය රු: 600,000/- ක ආධාර මුදලක් සමඟ රු: 150,000/- ක ද්‍රව්‍ය ආධාර ලබාදීම කළ අතර, දිස්ත්‍රික් ලේකම් හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සම්බන්ධීකරණයෙන් ඉඩම් කැබැල්ලක් ලබාදීමට කටයුතු කරන ලදී.
මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයේ ව්‍යාපෘති 407ක නිවාස 9,192ක ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 4,596ක මුදලක් ඇස්තමේන්තු කළ අතර, රාජ්‍ය අයවැය මඟින් වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුල 2019 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,020.465ක් ඇස්තමේන්තු කරන ලදී.
වර්ෂය තුල නිවාස 750ක් අවසන් කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව 2019.12.31 වන විට ව්‍යාපෘති 437 ක නිවාස 11,157ක ඉදිකරීම් ආරම්භ කිරීමට කටයුතු කළ අතර, වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 33ක් වේ. ඒ සඳහා වර්ෂය තුළ ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 1,350.5 කි. ඊට අමතරව 2018 වර්ෂයෙන් අවිච්ඡේද වූ නිවාස 3,200 ක වැඩ අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 972.146ක් ඇස්තමේන්තු කරන ලදී. අවිච්ඡේද නිවාස 889ක වැඩ අවසන් කළ අතර, එම ව්‍යාපෘතිවල අළුතින් නිවාස 965ක් ආරම්භ කළ අතර වැය කළ මුදල රුපියල් මිලියන 986.264 ක් වේ.

1.4 ඉන්දියානු ආධාර නිවාස වැඩ සටහන

ඉන්දියානු රජයේ ප්‍රධානයක් ලෙස ලැබුණු අරමුදල් භාවිතා කරමින් අඩු ආදායම් ලාභී පවුල් 1200 ක් සඳහා එක් පවුලකට නිවස ඉදිකිරීම වෙනුවෙන් රු: 500,000/- බැගින් නිවාස ආධාර ලබා දුන් අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් තවත් අමතරව රු: 250,000/- ක ආධාර මුදලක් ලබාදී නිවාස ඉදිකිරීම ක්‍රියාත්මක කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබාදුන් රු: 250,000/- න් රු: 150,000/- ක් ලබාදෙනු ලැබුවේ ද්‍රව්‍ය ආධාර ලෙසයි.

2019 වසරේ මෙම වැඩ සටහන එක් ගම්මානයක නිවාස 24 බැගින් නිවාස ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කරන ලදී. ඉන් නිවාස 600 ක ව්‍යාපෘති 25 ක් දකුණු පළාත කේන්ද්‍රකර ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද , ඉතිරි නිවාස 600 කින් යුත් නිවාස ව්‍යාපෘති 25 ක් උතුරු පලාතේද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

මෙම වැඩසටහන යටතේ දකුණු පළාතේ ව්‍යාපෘති 22ක නිවාස 519ක් ඉදිකිරීම් ආරම්භ කළ අතර, උතුරු පළාත් වැඩසටහන යටතේ ව්‍යාපෘති 10 ක නිවාස 278ක ඉදිකිරීම් ආරම්භ කරන ලදී. වර්ෂය තුළ වැය කළ සමස්ථ මුදල රුපියල් මිලියන 82.824 කි.

2. විසිරි නිවාස සංවර්ධන වැඩ සටහන

ඉඩමක හිමිකාරිත්වය ඇති එහෙත් පදිංචි වීම සඳහා ස්ථිර නිවසක් අහිමි පවුල්, පදිංචි නිවසේ වැඩ අවසන් කරගත නොහැකි පවුල් හා පදිංචි ස්ථිර නිවස ප්‍රමාණවත් නොවීම මත නිවස පුළුල් කිරීම අරමුණුකර ගනිමින්, ඔවුන් පදිංචි ඔවුන් සතු ඉඩම්වල විසිරි පදනමින් නිවාස ඉදිකිරීම සඳහා සහාය වීම මෙම වැඩ සටහනේ අරමුණයි.

2.1 විසිරි නිවාස ණය වැඩ සටහන

උපරිම මාසික ආදායම රු: 30,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභීන් හට ඉහත නිර්ණායකයන් යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රු: 200,000/- සිට රු: 500,000/- දක්වා 5% ක වාර්ෂික පොලී ප්‍රතිශතයක් යටතේ නිවාස ණය මුදල් ලබා දී නිවාස ඉදිකිරීමට සහාය වීම මෙම වැඩසටහන යටතේ සිදුකරන ලදී.

නිවාස ණය වැඩසටහන යටතේ 2019 වර්ෂය තුළ නිවාස 15,000 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 1,100ක් ඇස්තමේන්තු කරන ලදී. ඒ අනුව වර්ෂය තුළ නව නිවාස 1,268ක් හා වැඩිදියුණු නිවාස 28,285 ක් සංවර්ධන කළ අතර එයින් නිවාස 3,258ක වැඩ අවසන් කරන ලදී. වර්ෂය තුළ වැය කළ මුදල රුපියල් මිලියන 1,572.102 කි.

2.2 විසිරි නිවාස ණය ආධාර වැඩ සටහන

මෙම වැඩ සටහන යටතේ උපරිම මාසික ආදායම රු: 7,500/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභීන් හට තමන් ජීවත්වන නිවස අළුත් වැඩියා කර ගැනීමට හෝ අඩක් නම කළ නිවාස වල වැඩ අවසන් කර ගැනීම සඳහා 5% ක පොලී ප්‍රතිශතයක් යටතේ රු: 60,000.00 ක ණය මුලක් සමඟ රු: 40,000.00 ක ආධාර මුදලක් ලබා දීම තුලින් අර්ධ වශයෙන් නිමකළ නිවාස නිමි තත්වයට පත් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

මෙම වැඩසටහන යටතේ නිවාස 3,000ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.150ක් ඇස්තමේන්තු කරන ලදී. ඒ අනුව වර්ෂය තුළ නිවාස 2,345ක සංවර්ධන කටයුතු ආරම්භ කළ අතර, එයින් නිවාස 198ක වැඩ අවසන් කරන ලදී. වර්ෂය තුළ වැයකළ මුදල රු.මි. 55.425 කි.

2.3 සෙවණ ආධාර වැඩ සටහන

විවිධ මාධ්‍ය මගින් හෙළිදරවු කරනු ලබන හා ඉතා දිළිඳු හා අසරණ පවුල් මෙන්ම රටට කීර්තියක් ගෙනදෙන විශේෂිත පුද්ගලයන් සිටින පවුල්වල නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීම සඳහා සෙවණ පාලක මණ්ඩලයේ අනුමැතිය යටතේ සෙවණ අරමුදල් භාවිතා කරමින් මෙම වැඩසටහන ක්‍රියාමත්මක කරන ලදී.
ඒ අනුව 2019 වසර තුල නිවාස 200ක් ඉදිකිරීම සඳහා රු.මි. 30ක මුදලක් සෙවණ අරමුලින් ඇස්තමේන්තු කරන ලදී. වර්ෂය තුල පවුල් 131කට ප්‍රතිලාභ ලබා දී ඇති අතර, එයින් නිවාස 3ක වැඩ අවසන් කරන ලදී. ඒ සඳහා රු: මිලි : 17.063 ක මුදලක් වැයකරන ලදී.

2.4 සොඳුරු පියස ණය වැඩසටහන

දිවයින පුරා විසිරිව ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල උපරිමය වර්ග අඩි 1500 ක ප්‍රමාණයේ නිවාස අළුත්වැඩියා කිරිම හා පවතින නිවස වර්ග අඩි 1500 දක්වා පුළුල් කර ගැනීම සඳහා රාජ්‍ය බැංකු මගින් වාර්ෂික පොළිය 6.75% ක සහන පොලියක් යටතේ රු: 200,000/- ක ණය මුදලක් සමග තාක්ෂණ සහය ලබා දීම මේ යටතේ සිදුකරන ලදී.

ණය මුදලේ සමස්ථ පොලිය 13.5% ක් වන අතර, රජය මගින් 6.75% ක පොලියක් දරනු ලබයි. යම් හෙයකින් ණයකරු විසින් ණය වාරික ගෙවීම පැහැර හරින්නේ නම් රජය විසින් දරනු ලබන පොලී ප්‍රතිශතයද ණය ලාභියාගෙන් අයකර ගැනීමට හැකියාව ඇත.

මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයේ ආරම්භ කල නිවාස සංඛ්‍යාව 6,474 කි. ඉන් ඉදිකිරීම් අවසන් කල සංඛ්‍යාව 4,714 ක් වන අතර, ඒ සඳහා වියදම් කල මුදල රු: මිලි: 999.82 කි.

3. විරු සුමිතුරු නිවාස ආධාර වැඩ සටහන

යුද්ධයෙන් මියගිය හා පූර්ණ අබාධිත තත්වයට පත් රණවිරු සාමාජිකයන්ගේ පවුල්වල ජීවන තත්වය උසස් කිරීමේ අරමුණින් එම පවුල්වල නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි. නව නිවසක් සඳහා රුපියල් ලක්ෂ 12 ක් හා වැඩිදියුණු නිවසක් සඳහා රුපියල් ලක්ෂ 8 ක ආධාර මුදල් ක් සමග ආරක්ෂක අමාත්‍යාංශයේ ශ්‍රම දායකත්වයෙන් මෙම නිවාස සංවර්ධනය සිදුකරනු ලබයි.

මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂය තුළ නිවාස 500 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 140ක් ඇස්තමේන්තු කරන ලදී. ඒ අනුව නිවාස 680ක ඉදිකිරීම් ආරම්භ කළ අතර, වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 64 ක් වේ. ඒ සඳහා රු: මිලි: 150.324 ක් වැය කර ඇත.

4. වකුගඩු රෝගීන් සඳහා වූ නිවාස ආධාර වැඩ සටහන

කායික වකුගඩු රෝගයෙන් පීඩාවට පත් නිවාස අහිමි හා පදිංචියට සුදුසු මට්ටමට නිවසේ වැඩ කොටස් නිම කර ගත නොහැකි පවුල් වෙනුවෙන් ස්ථිරසාර නිවසක් ඉදිකර දීම මෙහි මූලික අරමුණයි. නව නිවසක් වෙනුවෙන් රු: 500,000/- ක් හා වැඩි දියුණු නිවසක් වෙනුවෙන් රු: 200,000/- ක ආධාර මුදලක් සමග තාක්ෂණ සහය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබාදෙනු ලබයි.
මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයට ඇස්තමේන්තු කර ඇති ආධාර මුදල රු: මිලි: 130ක් වන අතර, සංවර්ධනය කරන නිවාස සංඛ්‍යාව 1000 ක් වේ. 2019 වර්ෂය අවසන් වන විට සංවර්ධන කටයුතු ආරම්භ කළ නිවාස සංඛ්‍යාව 1189 ක් වේ. වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 177 ක් වේ. ඒ සඳහා යෙදවූ මුදල රු: මිලි: 129.045 ක් වේ.

5. වැලිඔය විශේෂ ආධාර නිවාස ව්‍යාපෘතිය

නැවත පදිංචි කිරීමේ වැඩ සටහන යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයේ මහවැලි සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල මහවැලි අධිකාරිය මගින් පදිංචි කරන ලද පවුල්වල නිවාස අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතියකි. මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇති ආධාර මුදල රු: මිලි: 66.3 ක් වන අතර, ඉදිකිරීමට සැලසුම් කර ඇති නිවාස සංඛ්‍යාව 256 ක් වේ. 2019 වසර තුල මෙම වැඩ සටහන සඳහා රු: මිලි: 33.648 ක මුදලක් වැය කර ඇති අතර, සංවර්ධනය කළ නිවාස සංඛ්‍යාව 147කි.

ප්‍රදේශයේ පවතින උග්‍ර ජල හිඟය නිවාස ඉදිකිරීමේ ප්‍රගතිය අඩුවීමට හා ඉදිකරනු ලබන නිවාසවල ප්‍රතිලාභීන් පදිංචිවීම අඩු වීමට බලපා ඇත.

6. ගංවතුර ආධාර නිවාස වැඩ සටහන

2018 වසරේ දෙසැම්බර් මාසයේ දී උතුරු පලාතේ කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වල ගංවතුර උවදුරින් හානියට පත් නිවාස 4996 ක් මූලික පහසුකම් සහිත ආරක්ෂිත නිවාස බවට පත් කිරීම තුලින් ඔවුන්ගේ ජන ජීවිතය සාමාන්‍ය තත්වයට ගෙන ඒම මෙම වැඩ සටහනේ මූලික අරමුණයි.

මෙහිදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නව නිවසක් සඳහා රු.ලක්ෂ 05 ක ආධාර මුදලක් සහ වැඩිදියුණු නිවසක් සඳහා රු.ලක්ෂ 03 ක ආධාර මුදලක් සමග තාක්ෂණ සහය ලබාදෙනු ලබයි.

මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයට ඇස්තමේන්තු කළ මුදල රු: මිලියන 1,291.679 ක් වන අතර, වසර අවසන් වන විට ඉදිකිරීම් ආරම්භ කළ නිවාස සංඛ්‍යාව 4818 ක් වන අතර, වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 36 කි. වර්ෂය තුළ වියදම්කල මුදල රු: මිලි: 747.809 කි.

7. සිරස නිවස ආධාර නිවාස වැඩ සටහන

MBC නෙට්ව(ර්)ක් (පුද්ගලික) සමාගමේ සහය ඇතිව හඳුනා ගන්නා ඉතා දිළිඳු පවුල්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආධාර ලබාදීමේ නිර්ණායකයන් යටතේ සුදුසුකම් පරීක්ෂාකර ඉන් සුදුසුකම් සපුරා ඇති පවුල් තෝරාගෙන ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීමට දායක වෙමින් මෙම " සිරස නිවස " නිවාස ආධාර වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලැබීය.

මූලික පහසුකම් නොමැතිව පැල්පත්වල හා අනෙකුත් අඩු පහසුකම් නිවාස වල දිවිගෙවන පවුලේ සාමාජිකයන් සුවකල නොහැකි රෝගාබාධ වලින් පෙලීම හේතුවෙන් අතිශය දිළිඳු භාවයට පත් හෝ ස්ථීර නිවාස අහිමි ජනතාවගෙන් තෝරාගත් පවුල් වල නිවාස ගැටළුව නිරාකරණය කර ආර්ථික හා සාමාජයීය සංවර්ධනයක් තුලින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීම මෙම වැඩ සටහනේ අරමුණ වේ. මේ යටතේ දිස්ත්‍රික් 25 ක නිවාස 25 ක් ඉදිකිරීමට සැලසුම් කරන ලදී.

මේ සඳහා MBC නෙට්ව(ර්)ක් (පුද්ගලික) සමාගම මගින් පහත සඳහන් ද්‍රව්‍ය ආධාර ලබාදෙනු ඇත.

1. වහලය සඳහා සෙවිළි තහඩු
2. ජලනල හා ජලනල උපාංග
3. නිවසට අවශ්‍ය තීන්ත ආලේපන හා පොටි
4. නිවසේ විදුලිය සැපයීමට අදාල උපකරණ (වයර් නොමැතිව)
5. වතුර ටැංකිය හා ඊට අදාල උපාංග

මෙම වැඩසටහන යටතේ නිවාස 25 ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයට ඇස්තමේන්තු මුදල රු: මිලි: 12.5 ක් වන අතර, එම වසර අවසන් වන විට නිවාස 22 ක ඉදිකිරීම් ආරම්භ කළ අතර, ඒ සඳහා වැයකල මුදල රු: මිලි: 5.73 කි. වර්ෂය තුල නිවාස 05 ක් නිම කර ඇත.

8. පාස්කු ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා නිවාස වැඩසටහන

පාස්කු ඉරුදින කතෝලික දේවස්ථාන තුනක් (කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, මඩකලපුව සියෝන් දේවස්ථානය) මුල්කර ගනිමින් එල්ලකල ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතටපත බැතිමතුන් 276 කගේ නිවාස අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට රු.මි. 283.427ඇස්තමේන්තු කරන ලදී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක නිවාස වැඩ සටහන් වලට අදාල නිවාස ඉදිකිරීමට ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය උපයෝගී කරගත්තද මෙම ප්‍රතිලාභීන් මුල්‍ය දායකත්වය එම කාර්යයට ලබාගැනීමේ ගැටළුවක් පවතින බැවින් නිවාස ඉදිකිරීම සඳහා වන සම්පූර්ණ වියදම නිවාස අධිකාරිය විසින් දැරීමට සිදුව තිබේ. නිවාස ඉදිකර ගැනීමේ කටයුත්තු ඍජු ඉදිකිරීම් ක්‍රමවේදය ඔස්සේ ඉදිකිරීමට සැලසුම් කර තිබුනද බොහොමයක් ප්‍රතිලාභීන් තම නිවාස ඉදිකර ගැනීමට එකඟවීම හේතුවෙන් එක් ප්‍රතිලාභියෙකු සඳහා නව නිවසක් ඉදිකිරීමේදී හා නිවසක් වැඩිදියුණු කිරීමේදී, ආපසු අයනොකරන ආධාර මුදලක් ලෙස ලබාදීමට කටයුතු කරන ලදී.

මෙම වැඩ සටහන යටතේ 2019 වර්ෂයේ නිවාස 276 ක් ඉදිකිරීම සඳහා රු. මිලි. 283.427 ක මුදලක් ඇස්තමේන්තු කර තිබු අතර, ඉදිකිරීම් ආරම්භ කල නිවාස 190 ක් සඳහා රු. මිලි. 15.215 ක් වැය කර ඇත.

දේපළ කළමනාකරණ කොට්ඨාශය

මෙම අධිකාරියට අයත් නිවාස ක්‍රමවල නිවාස හා ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8/1 වගන්තියට අනුව අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල මගින් 2019 වර්ෂය තුල යොමු කරන ලද ප්‍රතිලාභීන්ගේ ලිපිගොණු සංඛ්‍යාව 1800කි. ඒ අතරින් පරීක්ෂාවට ලක්කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත ඔප්පු සකස් කිරීම සඳහා යොමු කල ලිපි ගොණු සංඛ්‍යාව 1018 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන වෙත පහත සඳහන් ක්‍රම වේදයන්ට අනුව ඉඩම් පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

- ❖ රජයේ ඉඩම් අඥා පනත යටතේ දීමනා පත්‍ර මගින් රජය සතු ඉඩම් පවරා ගැනීම.
- ❖ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පෞද්ගලිකව ඉඩම් පවරා ගැනීම.
- ❖ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඇති බලතල ප්‍රකාරව ටෙන්ඩර් පටිපාටියට අනුව පුද්ගලික ඉඩම් මිලදී ගැනීම.
- ❖ පරිත්‍යාග යටතේ පෞද්ගලික ඉඩම් පවරා ගැනීම.
- ❖ වෙනත් රාජ්‍ය ආයතන සතු පෞද්ගලික ඉඩම් පවරා ගැනීම.

ඉලක්ක සපුරා ගැනීම

- ➢ 2019 වර්ෂයේදී ඉඩම් 15 ක හිමිකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගෙන ඇත.
- ➢ රජයේ ඉඩම් අඥා පනත යටතේ දීමනා පත්‍ර මගින් පවරා ගත යුතු ඉඩම් 298 ක කටයුතු දැනටමත් නිම වෙමින් පවතී.
- ➢ 2019 වර්ෂය තුල ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව 44 වන වගන්තිය යටතේ සහතිකය මගින් ඉඩම් 02 පවරා ගෙන ඇත
- ➢ 44 වගන්තිය ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන් වන්දි හා පොලි ගෙවා අවසන් කරන ලද , ඉඩම් ගණන 09 කි. ඉඩම් හිමිකම් පරීක්ෂණ අවසන් කර අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් අත්පත් කිරීමේ පනතේ 17 වන වගන්තිය යටතේ වන්දි හා පොලි ගෙවීම සඳහා ඉඩම් 19 ක් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.
- ➢ 2019 වසරේදී ඉඩම් 15ක් සඳහා වන්දි, වන්දි පොලි, මූලික තැන්පතු වශයෙන් රුපියල් 41,237,542.60 ක මුදලක් ගෙවා ඇත.
- ➢ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් අනතුරුව ඉඩම් 16 ක අයිතිය ලබා ගැනීම සඳහා ඔප්පු ලබා ගැනීමේ අවසන් අදියරට පැමිණ ඇත.
- ➢ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා තවදුරටත් වන්දි ගෙවීමටත්, වන්දි ගෙවා ඇති ඉඩම් ගැටළු 66 ක් හඳුනා ගෙන එම ඉඩම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට අදාලව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- ➢ පුද්ගලික ඉඩම් මිලදී ගැනීම යටතේ රුපියල් 360,035,000.00 ක මුදලක් වැය කර අක්කර 130 රූඩ් 00 පර්. 3.83 ක ප්‍රමාණයෙන් යුතු ඉඩම් 22 ක් මිලදී ගෙන ඇත. එම ඉඩම් සින්නක්කර ඔප්පු මගින් ලියාපදිංචි කර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගෙන ඇත.
- ➢ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අදාල ලබාදී ඇති ඉඩම් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත වන්දි ලබා ගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

2019 වර්ෂයේදී මැණුම් අංශය මගින් සිදු කරන ලද රාජකාරී පහතින් දක්වේ.

මැණුම් කටයුතු සිදුකොට අවසන්ව ඇති හිස් ඉඩම්								
අංකය	දිස්ත්‍රික්කය	ඉඩමේ නම	කාර්යය	පිඹුරු අංකය	ප්‍රමාණය			
					අ.	රූ.	පර්.	හෙ.
1	කොළඹ	මාළිගාවත්ත දුම්රිය මහල් නිවාස ඉඩම	සහාධිපත්‍ය මැනීම	541	1	2	9.68	0.6315
2	එම	ඇන්ඩර්සන් 2047	පර්. 7 ක් වෙන් කිරීම	459	0	0	7.00	0.0171
3	එම	රණජයගම-මු.පි.කො 7206 හි කැ. අංක 2881 හා 2882	අනු බෙදුම් කිරීම	579	0	0	16.41	0.0415
4	එම	මත්තේගොඩ බුදු මැදුර අසල ඉඩම අංක 2473 හා 7/9 5 මැනීම	අනු බෙදුම් කිරීම	587ඒ	0	3	29.52	0.3782
5	එම	සිද්ධාර්ථපුර මු.පි.කො 6759 හි කැ. අංක 3378 හා 3391	අනු බෙදුම් කිරීම	613	0	0	11.52	0.0291
6	එම	හෝමාගම කලුමුතුකැටිය අංක 309 හි කැ. අ. 39	අනු බෙදුම් කිරීම	590	0	0	19.4	0.3526
7	එම	කම්මල්වත්ත මහල් නිවාස	සහාධිපත්‍ය මැනීම					0.1424
8	එම	සොයිසාපුර මු. පි. කො. 7984 න් කෝවිල සඳහා	පර්.6ක් වෙන් කිරීම	588	0	0	6.0	0.0152
9	එම	සොයිසාපුර T2 මහල් නිවාස	සහාධිපත්‍ය මැනීම	494	0	0	20.22	0.0511
10	එම	හල්පෙවත්ත බොරලුතැන්න	අනු බෙදුම් කිරීම	අවසන් කර නොමැත	14	0	3.840	5.7763
11	එම	අයර්වත්ත	අනු බෙදුම්	450				0.7325
		අයර්වත්ත	අනු බෙදුම්	457ඒ				1.3867
		අයර්වත්ත	අනු බෙදුම්	457				0.3787
12	එම	කෝට්ටේ සියඹලාවත්ත මැ.නි. 30 මු.පි.A 4942හි කැ.අ.17	මායිම් නිරවුල් කිරීම සඳහා		0	0	38.2	0.0961
13	එම	අම්බනවත්ත මු.පි.ගම් 2274හි කැ.අ.92	ජල ටැංකිය සඳහා	581	0	2	30.0	0.2782
14	ගම්පහ	රන්පොකුණගම-ගම් 147හි කැ.අ. 1220හා2101	ගුරුගම්මානය	530	2	2	15.13	1.0496
15	මහනුවර	හන්තානවත්ත අංක 1291 හි කැ.අ.2	පර්චස් 06 ක් වෙන්කිරීම	මෙම ඉඩමේ බෑවුම අනුව අවම අනුබෙදුම පර්චස් 20 කි.	0	0	27.71	0.0701
16	එම	හන්තානවත්ත මු.පි.මහ.3580 හි කැ.අ.29	පර්චස් 30 ක් වෙන් කිරීම	620	0	0	30.0	0.0759
17	එම	වටපුලුව වත්ත අංක 102 හි කැ.අං 4 හා 8	අනු බෙදුම් කිරීම	562	0	0	10	0.0253

18	කැගල්ල	පොල්පැරෝව වත්ත මු.පි.කැ 2186 හි කැ.අං.150	ගොඩනැගිල්ල වත්ත මු.පි.කැ 2186 හි කැ.අං.150	ගොඩනැගිල්ල සමඟ පර්චස් 6 ක් වෙන් කිරීම	ගොඩනැගිල්ල සමඟ පර්චස් 6 ක් වෙන් කළ නොහැක			0.0481
19	ගාල්ල	උමල්ගම මු.පි.ගා 658 හි කැ.අං.855	මායිම් නිරවුල් කිරීම					1.428
20	හම්බන්තොට	වීරකැටිය	අනු බෙදුම් කිරීම	452				8.1521
21	මාතර	කිඹුලාගලහේන මු.පි.මාර 1417	අනු බෙදුම් කිරීම	621				0.1659
එකතුව								**21.3222**

නිවාස අලෙවි කිරීම - 2019					
අනු අංකය	වර්ෂය	හැහැර කළ පුද්ගලයා	නිවාස යෝජනා ක්‍රමය	වටිනාකම	ලැබී ඇති අනුමැතිය
1	2019	පී.බී.සුජීව සම්පත්	ආරාමය පෙදෙස E35/17/1/1	1,852,500	ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය
2	2019	වාසනා ද සිල්වා (බදු පදනමින්)	සොයිසාපුර T/2/4	15,500	ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

2019 - ජනවාරි සිට දෙසැම්බර් දක්වා - යාබද/බදු බැහැර කිරීම

අනු අංකය	දිස්ත්‍රික්කය	පිඹුරු අංකය	කැබලි අංකය	ප්‍රමාණය	තක්සේරුව	වෙනත්
01	ගම්පහ	මු.පි.ගම් 147	979	පර්.60	වාර්ෂික බදු 192,000.00	ඉදිරි කටයුතු කිරීමට දි.කළ ගම්පහ වෙත දක්වා ඇත.
02	කොළඹ	664	09	පර්.10.87	වාර්ෂික බදු 370,000.00	දි.කළ වෙත දන්වා ඇත.
03	අනුරාධපුරය	අ.ගම්.අං 02.අ.ති.16	442	රූඩ් 2 පර්.29	මාසික 5200.00	දි.කළ වෙත දන්වා ඇත.
04	කොළඹ	2065/72	02,03	පර්.6.87 හා පර්.6.28		දි.කළ වෙත දන්වා ඇත.
05	කැගල්ල	261	02	පර්.5.54	යාබද තක්සේරුව ලබාගැනීම	දි.කළ වෙත දන්වා ඇත.
06	ගම්පහ	1347	01	පර්.0.85	වර්තමාන - 34,000	දි.කළ වෙත දන්වා ඇත.
07	කොළඹ	344	01	පර්.7.20	වාර්ෂික බදු - 1,600,000.00	දි.කළ වෙත දන්වා ඇත.
08	කළුතර	2344	01	පර්.98.42	වාර්ෂික බදු - 12000.00	දි.කළ වෙත දන්වා ඇත.
09	මහනුවර	2532	15	පර්.79.27 (පිටපතක් අමුණා ඇත.)	වාර්ෂික බදු - 557,400.00	දි.කළ වෙත දන්වා ඇත.

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශ වලින් සමන්විත වේ.

- ඉංජිනේරු අංශය
- වාස්තු විද්‍යා අංශය
- ප්‍රමාණ සමීක්ෂණ අංශය
- සැලසුම් අංශය
- විදුලි අංශය
- නඩත්තු අංශය
- ව්‍යාපෘති අංශය
- පාලන අංශය
- පරිශ්‍ර අංශය

2019 වර්ෂය තුලදී පහත සඳහන් වැඩ සටහන් මඟින් සියලු ජන කොටස් වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කර ඇත.

- **මහල් නිවාස ප්‍රතිසංස්කරණ වැඩසටහන (නගමු පුරවර)**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර ඇති පැරණි මහල් නිවාස ව්‍යාපෘතිවල නිවැසියන්ට හා කළමනාකරණ කමිටු / සංස්ථා මැදිහත්ව සිදු කළ නොහැකි නවීකරණ අළුත්වැඩියාවන් හා සියළු යටිතල පහසුකම් නවීකරණ සිදුකර නිවැසියන්ට හිතකර ජනාවාස බවට පත්කිරීම, කළමනාකරණ සංස්ථා ස්ථාපිත කර නිවාස ක්‍රම නඩත්තු කිරීමේ වගකීම නිවැසියන්ට භාරදීම නගමුපුරවර වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

01. ගම්පෙරළිය නිවාස වැඩසටහන

භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වෙන් කළ මුදල රුපියල් මිලියන 300.00 කී. මේ යටතේ ව්‍යාපෘති 6 ක නවීකරණ වැඩ යෝජිතව තිබු අතර ඉන් 2 ක් සුදුසුකම් සපුරා ඇති ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ක්‍රියාත්මක කර නැත.

	ව්‍යාපෘතිය	**ප්‍රතිලාභී පවුල් ගණන**	**ඇස්තමේන්තු මුදල රු.මි (10%+5%+15%)**	**ප්‍රගතිය 2019.12.31 දිනට**
1	වේළුවනාරාම නිවාස ක්‍රමය	136	33.6	100%
2	මව්ලානාවත්ත නිවාස ක්‍රමය අදියර I අදියර II	 62 56	 38.64 33.93	 30% 30%
3	නිව්හැම් නිවාස ක්‍රමය	105	50.05	22%
4	ශාන්ත ජේම්ස් වීදිය නිවාස ක්‍රමය	180	54.61	90%
			210.29	

02. නගමු පුරවර 2019 නවීකරණ වැඩසටහන

නගමු පුරවර වැඩසටහන සඳහා 2019 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 200.0ක් වෙන් කරන ලදී. මේ යටතේ ව්‍යාපෘති 33 ක යටිතල පහසුකම් හා නවීකරණ කටයුතු සිදුකිරීමට යෝජිතව තිබිණි. ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 20 ක පමණක් නවීකරණ කටයුතු සිදුකර ඇත.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ඇස්තමේන්තු මුදල රු.මි	භෞතික ප්‍රගතිය 2019.12.31 දිනට
1	මැද මාවත (Central road) නිවාස ක්‍රමය අළුත්වැඩියාව	48	15.00	55 %
2	ශාන්ත සෙබස්තියන් නිවාස ක්‍රමයේ A, B, C, ගොඩනැගිලි හා ප්‍රජාශාලාව අළුත්වැඩියාව	95	38.13	95 %
3	මොහිදීන් මස්ජිඩ් නිවාස ක්‍රමයේ ඩී ගොඩනැගිල්ලේ නිවාස 8 හි වැසිකිළි අළුත්වැඩියාව	08	1.82	5 %
4	කාක දූපත නිවාස ක්‍රමයේ ප්‍රජාශාලාව නවීකරණය , කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම.	353	0.80	100 %
5	ෆොබස් ලේන් නිවාස ක්‍රමයේ පවතින වැසිකිලි හා නාන කාමර අළුත්වැඩියා කිරීම.	-	6.81	20 %
6	ඇන්ඩර්සන් අදියර II නිවාස වී සහ ඩබ්ලිව් ගොඩනැගිලි වල සේවක වැසිකිළි හා ජල පොම්පාගාර අළුත්වැඩියාව.	16	4.80	10 %
7	සොයිසාපුර නිවාස ක්‍රමයේ අංක ඒ/3/1/4 නිවසෙහි ජල රෝධනය කිරීම.	01	0.30	2 %
8	නාරාහේන්පිට මෙල් වත්ත නිවාස ක්‍රමයේ මළ නාලිකා පද්ධතිය වැඩි දියුණු කිරීම සහ වෙනස්කම් සිදු කිරීම.	1792	19.50	කොළඹ නගර සභාව මඟින් ඇස්තමේන්තු සකස් කරමින් පවතියි.
9	මැල්වත්ත අඩු ආදායම් නිවාස ක්‍රමයේ ඉතිරි අළුත්වැඩියාවන් සිදු කිරීම..		10.00	වැඩ අවසන් බිල්පත් ගෙවීමට ඇත.
10	සාංචිආරච්චිවත්ත නිවාස ක්‍රමයේ ගොඩනැගිලි 07 අළුත්වැඩියා කිරීම.	221	9.30	15%
11	මැනිං ටවුන් නිවාස ක්‍රමය BP ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම.	40	8.49	100 %
12	මිහිදු මාවත නිවාස ක්‍රමයේ B සහ C ගොඩනැගිලි අළුත්වැඩියාව.	24	3.50	60%
13	ගෝතමීපුර නිවාස ක්‍රමයේ මළ නාලිකා පද්ධතිය අළුත්වැඩියාව - අදියර III	48	8.00	කොළඹ නගර සභාව මඟින් ඇස්තමේන්තු සකස් කරමින් පවතියි.
14	නිවාස ක්‍රමවල පොම්පාගාර නඩත්තු	-	4.50	50%
15	මැනිං ටවුන් නිවාස ක්‍රමයේ ගොඩනැගිලි නවීකරණය	-	8.50	35%
16	ජයවඩනගම පොකුණ නවීකරණය කිරීම	-	8.60	35%
17	797 වත්ත නිවාස ක්‍රමයේ අදියර IV ගොඩනැගිල්ලේ ජල ටැංකි ආවරණය	16	0.73	100%
18	අබ්දුල් හමීඩ් නිවාස ක්‍රමය නවීකරණය	56	12.3	60%
19	ජල්තර මළ නාලිකා පද්ධතිය අළුත්වැඩියාව	-	0.66	100 %

03. නගමු පුරවර 2018 (අවිච්ඡේද ව්‍යාපෘතිය)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	කොන්ත්‍රාත් මුදල රු.මිලි	ප්‍රගතිය 2019.12.31 දිනට
1	සමගිපුර නිවාස ක්‍රමයේ අදියර මල පවාහන පද්ධතිය හා වැසිකිළි පද්ධති අළුත්වැඩියාව	87	16.66	100%

04. අභ්‍යන්තර උත්පාදන යටතේ සිදු කර ඇති ව්‍යාපෘති 2019

	ව්‍යාපෘතිය	කොන්ත්‍රාත් වටිනාකම රු.මිලි
1	5 වන මහලේ සාමාන්‍යාධිකාරි කාර්යාලයේ පැන්ට්‍රි කබඩ් ඉදිකිරීම	0.13
2	හම්බන්තොට දිස්ත්‍රික් කළමනාකරුගේ කාර්යාල නවීකරණය	2.45
3	දියවන්නා ගාර්ඩින් නො. 115 නිවස අළුත්වැඩියා කිරීම - වික්‍රමසිංහපුර, බත්තරමුල්ල	0.24
4	ප්‍රධාන කාර්යාලයේ නි.සා (මුදල්) කාර්යාලය පාර්ටිෂන් කිරීම	0.1
5	මුල්ලේරියාව හිඹුටු උයන මළ පිරිපහදු පද්ධතිය නඩත්තු කටයුතු හා ක්‍රියාත්මක කිරීම.	1.0

➢ රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ නිවාස සංවර්ධන ව්‍යාපෘති

මෙම වැඩසටහන මධ්‍යම පාන්තික නිවාසලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා පිහිටුවන ලැබූ ක්‍රමවේදී වැඩසටහනකි. දේශීය /විදේශීය පුද්ගලික ආයතන සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය , රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ ගිවිසුමකට එළඹ පෙර විකුණුම් පදනම යටතේ මෙම නිවාස ඉදිකරනු ලැබේ.

2019 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවැති ව්‍යාපෘති

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ප්‍රගතිය 2019.12.31 දිනට
1	යක්කල, සියනෑ උයන සොබා උයන නිවාස ව්‍යාපෘතිය	42	80%
2	කළුගල පල්ලේ කැලේ රීජන්සි උද්‍යාන නිවාස ව්‍යාපෘතිය අදියර I අදියර II	21	 85 % 50 %
3	මහනුවර හන්තාන රෙසිඩන්සීස් නිවාස ව්‍යෘපාතිය	102	5%

➢ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති

මධ්‍යම පාන්තික ප්‍රජාවට වසර 05 ක් තුළ නිවාස ලක්ෂ පහක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණයි.

මෙම ව්‍යාපෘතිය සාර්ථකව සිදු කිරීම සඳහා බත්තරමුල්ල , පැලවත්ත, CHPB ගොඩනැගිල්ලේ මධ්‍යම පාන්තික නිවාස ව්‍යෘපෘති ඒකකයක් පිහිටුවා ඇති අතර අමාත්‍යාංශයේ සෘජු අධික්ෂණය යටතේ සියළු රාජකාරි එම ඒකකය වෙත පවරා ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී උපදෙස් ලබා දීම හා මෙහෙයවීම සිදු කෙරේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු පහත සඳහන් ඉඩම් වල තෝරාගෙන ඇති සංවර්ධනකරුවන් වෙතින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

ප්‍රගතිය

දඹුවවත්ත, රාගම- ලාවන්‍ය හයිට්ස්	-	නිවාස 116	45%
නුගගහකනත්ත වත්ත පානදුර - සිබ්‍රිස්	-	නිවාස 196	45%
ජල්තර දෙවන අදියර , අතුරුගිරිය-ග්‍රීන් වැලි	-	නිවාස 352	88%
මවුන්ට් ක්ලිෆර්ඩ් රේන්ජ්, හෝමාගම	-	නිවස 860	90%

➢ පාලම් සහ ඇල මාර්ග ඉදිකිරීම්

පාලම් -

ක්‍රොන්තාත්කරු	:	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
උපදේශන හා සේවා සැපයීම	:	මාර්ග සංවර්ධන අධිකාරිය

2019 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය වෙත වෙන් කරන ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම ඉදිකිරම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2019 වර්ෂයේදී පාලම් 4ක් ඉදිකර ඇති අතර ඒවායේ ප්‍රගතිය 2019.12.31 දිනට 45 % කී. 2018 අවිච්ඡේද ව්‍යාපෘති යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාලම් 23 ක් ඉදිකර ඇත. මෙයින් පාලම් 10 ක වැඩ අවසන් කර ඇති අතර පාලම් 13 ක ප්‍රගතිය 70 % කී.
මූල්‍යමය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉහත ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී ඇත.

ඇල මාර්ග -

ක්‍රොන්තාත්කරු	:	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
උපදේශන හා සේවා සැපයීම	:	වාරිමාර්ග දෙපාර්තමේන්තුව

2018 වර්ෂයේදී ආරම්භ කරන ලද රන්මිණිතැන්න ඇල මාර්ගය දීර්ඝ කිරීමේ කටයුතු වල ප්‍රගතිය 2019.12.31 දිනට 37 % ක් වේ.

➢ ප්‍රජා ජල ව්‍යාපෘති

හම්බන්තොට දිස්ත්‍රික්කයේ උග්‍ර ජල හිඟතාවය පවතින ප්‍රදේශ වල ජනතාව වෙනුවෙන් පවතින ජල ව්‍යාපෘති වල ධාරිතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එම ව්‍යාපෘති වැඩිදියුණු කිරීම හා අළුත්වැඩියා කිරීම් සිදුකර ඇති අතර මෝදී ගම්මානය සඳහා පානීය ජලය සැපයීමට විශේෂ ජල ව්‍යාපෘතියක් අළුතින් ආරම්භ කර ඇත.

මෙම ජල ව්‍යාපෘතින්හි ක්‍රොන්තාත් ආයතනය ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කර ඇත. මේ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කිරීම් රුපියල් මිලියනය 158 කි.

එම ජල ව්‍යාපෘති වල ප්‍රගතිය පහත පරිදි වේ.

	2019.12.31 දිනට ප්‍රගතිය
ප්‍රජා ජල ව්‍යාපෘති 14	100 %
මෝදි ගම්මාන විශේෂ ජල ව්‍යාපෘතිය	5 %
ලුණුගම්වෙහෙර කිරිදි ඔය ජල ව්‍යාපෘතියේ අළුත්වැඩියාව	35 %

තවද 2018 වර්ෂයේ ආරම්භ කර ඇති ජල ව්‍යාපෘති 10 ක වැඩ 2019.12.31 දින වන විට අවසන් කර ඇත.

- **ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශයන්හි පවත්නා අවශ්‍යතාවය මත භාහිර ආයතන විසින් ලබා දුන් ආධාර උපයෝගී කර ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත. මෙහිදී කොන්ත්‍රාත්කරු ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කර ඇති අත. ව්‍යාපෘති ගණන 6 කි. ඉන් ව්‍යාපෘති 3 ක වැඩ අවසන් කර අතර ඉතිරි ව්‍යාපෘති 3 හි ප්‍රගතිය 2019.12.31 දිනට 30 % කි.

- **පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති**

2019 වර්ෂයේ දී මහල් 5 කින් යුත් හා නිවාස 30 කින් යුක්ත තංගල්ල නිවාස ව්‍යාපාතියේ ඉදිකිරීම් ආරම්භ කර ඇත. 2019.12.31 දිනට ප්‍රගතිය 10 % කි.

තවද අනුරාධපුර දහයියාගම, හම්බන්තොට, කොහොලන්කල ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය පලාත් පාලන අනුමැතීන් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතින් ලබා ගෙන ඇත.

- **ප්‍රසම්පාදන කටයුතු**

මහල් නිවාස හා යටිතල පහසුකම් නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් 2019 වර්ෂය තුළ කැඳවා ඇති ටෙන්ඩර් ගණන 34 කි. ව්‍යාපෘති 21 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපි නිකුත් කර ඇත.

- **පොම්පාගාර නඩත්තු කටයුතු**

හිඹුටු උයන හා මුල්ලේරියාව නිවාස ක්‍රමයේ මලපවාහන නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුවෙකු ලවා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත.

- **විදුලි නඩත්තු කටයුතු**

සේවා අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලයේ සහ නිවාස ක්‍රම වල විදුලි නඩත්තු කටයුතු සිදු කර ඇත.

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාසය පහත සඳහන් අංශ වලින් සමන්විත වේ.

1. මානව සම්පත් කළමනාකරණ අංශය
2. පාලන අංශය
3. මාණ්ඩලික නිවාස අංශය
4. අරක්ෂක අංශය
5. පුහුණු අංශය
6. විනය අංශය
7. සෙවණ අධ්‍යන කේන්ද්‍රය
8. සුභ සාධක සංගමය

1. මානව සම්පත් කළමනාකරණ අංශය

2019 වර්ෂය තුල මානව සම්පත් අංශයේ සිදු වූ වෙනස්කම්

1.1 2019.12.31 දින දක්වා කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

අනු අංකය	සේවා මට්ටම	අනුමත සංඛ්‍යාව	භෞතික කාර්ය මණ්ඩලය			
			ස්ථිර	කොන්ත්‍රාත්	දෛනික	ද්විතීයන
01	ජ්‍යෙෂ්ඨ	115	100	-	-	-
02	තෘතීය	157	397	-	-	-
03	ද්විතීය	899	994	-	-	-
04	ප්‍රාථමික	205	224	-	-	-
		1376	1715	2637	74	01

1.2 2019.12.31 දිනට පහත සඳහන් පරිදි බඳවා ගැනීම් කර ඇත.

සෘජු බඳවා ගැනීම්				නැවත සේවයට බඳවා ගැනීම් (විශ්‍රාම ගැන්වීමෙන් පසු)		එකතුව
ස්ථිර		කොන්ත්‍රාත්	දෛනික	විධායක	විධායක නොවන	
විධායක	විධායක නොවන					
-	13	1685	02	1	10	1711

❖ තවද 2019 වර්ෂය තුලදී කොන්ත්‍රාත් හා දෛනික පදනමේ සිටි සේවකයින් 119 ක් සඳහා ස්ථිර පත්වීම් ලබා දී ඇත.

1.3 2019 වර්ෂය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා ලබාදෙන ලද උසස්වීම් (අභ්‍යන්තර)

අනු අංකය	සේවා මට්ටම	උසස් වීම්
01	ජ්‍යෙෂ්ඨ	38
02	තෘතීය	07
03	ද්විතීය	-
04	ප්‍රාථමික	-
	එකතුව	45

1.4 වර්ෂය තුල විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් කිරීම්, ධූරය අත්හැර යෑම් හා ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	සේවා මට්ටම	විශ්‍රාම ගැන්වීම	සේවය අවසන්	ඉල්ලා අස්වීම්	ධූරය අතහැර යෑම
01	ජ්‍යෙෂ්ඨ	12	09	05	-
02	තෘතීය	47	08	68	01
03	ද්විතීය	16	10	45	07
04	ප්‍රාථමික	19	04	24	15
	එකතුව	**94**	**31**	**142**	**23**

1.5 මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටියදී අදාළ වර්ෂය තුල මරණයට පත් වූ සංඛ්‍යාව 04 කි.

1.6 මෙම අධිකාරියේ ප්‍රායෝගික පුහුණුව ලබන පුහුණු ලාභීන් පහත පරිදි වේ.

පුහුණුවට බඳවාගත් පුහුණු ලාභීන් සංඛ්‍යාව - 284

දැනට පුහුණුව ලබන පුහුණු ලාභීන් සංඛ්‍යාව - 21

2. පාලන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පාලන අංශය ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිපාලන චක්‍රලේඛ නිකුත් කිරීම, අතිකාල, සංයුක්ත දීමනා, ගමන් වියදම් දීමනා, ගෙවල් කුලී දීමනා ඇතුළු අනෙකුත් දීමනා අනුමත කිරීම හා කාර්යාල කළමනාකරණ උපදෙස් නිකුත් කිරීම, දෛනික තැපෑල කළමනාකරණය, දෛනික පැමිණීම, පිටවීම හා නිවාඩු කළමනාකරණය, ආපදා ණය, ප්‍රසාද දීමනා, දිරි දීමනා, හා විවේක නිවාඩු දීමනා ගෙවීම්, වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් කිරීම්, ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිලි රක්ෂණ කිරීම ඇතුළු පරිපාලන කටයුතු සඳහා මැදිහත් වන අංශය වේ. මෙම අංශය යටතේ පහත සඳහන් කටයුතුද සිදු කරනු ලබයි.

01. විදුලි සෝපාන සේවා

02. පිළිගැනීමේ නිලධාරී සේවා

03. දේශන ශාලා 5 මහලෙහි ශ්‍රවණාගාරය පවත්වා ගැනීම හා නඩත්තු කටයුතු

04. ස්වයංක්‍රීය දුරකථන සේවාව හා අභ්‍යන්තර දුරකථන නඩත්තු කටයුතු

05. පොත් බැඳීම් කටයුතු

06. නිවාස දෙපාර්තමේන්තුවට අයත් ලේඛණාගාරය නඩත්තුව

07. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ලේඛණාගාරය නඩත්තුව

මෙම අංශය තුල පහත සඳහන් අයුරින් සේවකයින් අනුයුක්තව සේවය කරනු ලබයි.

තනතුර	සේවා කාණ්ඩය	සේවක සංඛ්‍යාව
කළමනාකරු	JM 1-1-i	01
පරිපාලන නිලධාරී	JM 1-1-ii	02
කළමනාකරණ සහකාර	MA 1-ii-i	01
කළමනාකරණ සහකාර	MA 1-ii-iii	06
පිළිගැනීමේ නිලධාරී	JM 1-1-ii	01
ලේඛණ භාරකරු	PL 1-i	02
පරිගණක ක්‍රියාකරු	MA 1-ii-i	01
ල.ය.ලේ	JM 1-i-ii	01
විදුලි සෝපාන ක්‍රියාකරු	PL 1-i	02
කාර්යාල කාර්ය සහායක	PL 1-i	01
කාර්යාල සහයක (ඉහත කාර්යාල සහයකයින් 06 දෙනාගෙන් ලිපිකරු රාජකාරි සඳහා දෙදෙනෙක්ද. විදුලි සෝපාන ක්‍රියාකරුවන් ලෙස දෙදෙනෙක්ද, දුරකථන හුවමාරුවේ එක් අයෙකු වශයෙන් සේවය කරයි	PL 1-iii	06
සංචාරක බංගලා භාරකරු	PL ii-ii	01
එකතුව		**25**

04. 2019 වර්ෂයේ ප්‍රසාද දීමනා සේවකයින් වෙත ලබා දී ඇති අතර, ආපදා ණය, යැපීම් දීමනා හා සංයුක්ත දීමනා ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම හා දිස්ත්‍රික් කාර්යාලවල කුලී දීමනා ගෙවීම් කටයුතු අනුමත කිරීමේ කටයුතුද සිදුකර ඇත.

ආපදා ණය ඉල්ලුම් කර ඇති සේවකයින් ගණන	ආපදා ණය ගෙවූ මුදල රුපියල්
59	14,025,000.00

05. ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලබන සාමාජිකයන්හට වෛද්‍ය ප්‍රතිලාභ පහත සඳහන් ආකාරයෙන් ගෙවීම් කර ඇති අතර, දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්තව සේවය කරන සේවකයින්ටද මෙම ප්‍රතිලාභ ලබා දීමට අදාල චක්‍රලේඛ නිකුත් කර ඇත.

	ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු		ප්‍රතිලාභ ලද සාමාජිකයින් ගණන	මුදල(රු.)
01	භාහිර ප්‍රතිකාර (රු)		460	6,789,859.00
02	නේවාසික ප්‍රතිකාර පරීක්ෂණය හා වෛද්‍ය ගාස්තු (රු)		21	624,644.00
03	නේවාසික ප්‍රතිකාර ශල්‍යකර්ම හා වෛද්‍ය සේවා ගාස්තු (රු)		13	616,291.00
04	බරපතල සැත්කම් වෙනුවෙන් වෛද්‍ය වියදම් (රු)	බරපතල සැත්කම්	09	506,163.00
05		පිළිකා රෝගය	02	160,670.00
06	රජයේ රෝහල් සඳහා නේවාසික ප්‍රතිකාර (රු)		29	56,400.00
07	බෝවන හා වසංගත රෝග (රු)		03	15,200.00
08	ඛා.නි.2016/04 හි 08 ජේදය අනුව ප්‍රතිලාභ (රු)		02	4800.00

වර්ෂයට අදාළ වියදම් :-

	විස්තරය	(රු.)
01.	කාර්යාලීය දුරකථන	-
02.	තැපැල් වියදම්	968,535.00
03.	ආරාධනා පත් සිසුගාමී තැපෑල	432.164.00
04.	සුළු වියදම් (Petty Cash)	54,080.00
05.	ප්‍රධාන කාර්යාලය රක්ෂණ අවරණය	1,615,285,00
06.	40 වන සංවත්සරය	1,816.984.00
07.	නිවාසකරණය පුවත්පත් එකතුව	39,047.50
08.	මාතලේ දිස්ත්‍රික් කාර්යාල ගෙවල් කුලී (125,000 * 12)	1,500.000.00
09.	හම්බන්තොට කලාප කාර්යාලය (107,100*12) = 1,285,200.00 එම කාර්යාලයේ ලීබඩු සඳහා (12,000*12) = 144,000.00 වීරකැටිය කලාප කාර්යාලය (40,000*12) = 480,000.00	1,909,200.00
10.	මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ රක්ෂණය	107,511.48
11.	දකුණු පළාත් කළමනාකරු කාර්යාලය ගොඩනැගිලි කුලිය (58,800*12)	705,600.00
12.	ප්‍රධාන කාර්යාලය පුවත්පත් සඳහා වියදම	884,230.00
13.	දුෂ්කර සේවා ගෙවල් කුලී දීමනාව ලබා දී ඇත	-
14.	යතුරු පැදි දීමනා ලබා දී ඇත	-
15.	සුළු මුදල් අග්‍රිමය මඟින් 2019 වර්ෂය තුලදී මිලදි ගැනීම් වෙනුවෙන් වැය වූ මුදල	6,435.00

3. මාණ්ඩලික නිවාස ණය අංශය

සම්පාදනය කල ඉලක්ක :

2019 වර්ෂයට මාණ්ඩලික නිවාස ණය සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල.

	රුපියල්
ප්‍රධාන කාර්යාලය	195,000,000.00
දිස්ත්‍රික් කාර්යාල	232,700,000.00
එකතුව	**427,700,000.00**

එම ප්‍රතිපාදන වලින් පහත සඳහන් ආකාරයට නිවාස ණය අනුමත කරන ලදී.

වැටුප් කාණ්ඩ පරාසය	ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාල		ගෙවා ඇති මුළු මුදල (රු)
	සේවක සංඛ්‍යාව	මුදල (රු)	සේවක සංඛ්‍යාව	මුදල (රු)	
HM 2-1-MA 5-2	03	2,155,000.00	03	2,988,700.00	5,143,700.00
MA 2-2-MA 1-2	-	-	10	12,354,000.00	12,354,000.00
PL 1-PL3	-	-	-	-	-
එකතුව	03	2,155,000.00	13	15,342,700.00	17,497,700.00

අනුමත ප්‍රතිපාදන සහ වැයවූ මුදල හා ඉතිරිය පහත දක්වා ඇත.

කාර්යාලය	අනුමත ප්‍රතිපාදන (රු)	ගෙවූ මුදල (රු)	ඉතිරිය (රු)
ප්‍රධාන කාර්යාලය	195,000,000.00	2,155,000.00	192,845,000.00
දිස්ත්‍රික් කාර්යාලය	232,700,000.00	15,342,700.00	217,357,300.00
මුළු මුදල	**427,700,000.00**	**17,497,700.00**	**410,202,300.00**

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

දිස්ත්‍රික් කාර්යාල වලින් නිවාස ණය අනුමැතිය සඳහා ලැබුණු ලිපිගොණු බොහොමයක ලිපිලේඛණ අඩුපාඩු සහිත වූ බැවින් එම ලේඛණ පරීක්ෂා කර බලා අදාල දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කර එම අඩුපාඩු සම්පූර්ණ කරවා ප්‍රමාදයකින් තොරව ණය අනුමැතියට යොමු කිරීම. ප්‍රධාන කාර්යාලයේද ණය අනුමැතියට යොමු කිරීම් හා ගෙවීම් කටයුතු කිරීම කළමනාකරණ කමිටු තීරණ අනුව 2019 අගෝස්තු මස සිට මාණ්ඩලික නිවාස ණය ගෙවීම තාවකාලිකව නතර කරන තෙක් ප්‍රමාදයකින් තොරව සිදුකිරීම. මාණ්ඩලික නිවාස ණය ලිපිගොණුවක් සකස් කර ණය පිරිනැමීම සඳහා අනුමැතිය ලබා ගෙවීම් කටයුතු අවසන් වන තෙක් අනුපිළිවෙලින් කළ යුතු කාර්යයන් පිළිබඳව ලේඛණයක් සකස් කර දිස්ත්‍රික් කාර්යාලවල කළමනාකරණ සහකාරවරුන් දැනුවත්කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.

ඉලක්ක කරා ළඟා වීමේදී මුහුණ පෑමට සිදු වූ ගැටළු

2017-10-24 දිනෙන් වසර 03 ක පරිවාස කාලය අවසන් වී ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින්ගේ තනතුරේ පත්වීම ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කළ පසු ඔවුන්ගෙන් පිරිසක්ද නිවාස ණය ඉල්ලුම් කරනු ඇතැයි යන පදනම මත 2019 වර්ෂයට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනු ලැබුවද එම කාර්ය මණ්ඩලයේ තනතුරේ පත්වීම් ස්ථිර කරනු ලැබුවේ 2019 දෙසැම්බර් මස බැවින් ඔවුන්ට 2019 වර්ෂයේ මාණ්ඩලික නිවාස ණය ඉල්ලුම් කිරීමට ඇති අවස්ථාව අහිමි වීම හේතුවෙන් ප්‍රතිපාදන වැයවීම පහත වැටීම.

කළමනාකරණ කමිටු තීරණයක් අනුව 2019 අගෝස්තු මස සිට මේ දක්වාම මාණ්ඩලික නිවාස ණය ගෙවීම් කිරීම තාවකාලිකව නතර කර ඇති බැවින් ප්‍රතිපාදන වැයවීම පහත වැටීම.

මාණ්ඩලික නිවාස ණය අංශයේ තිදෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලය එක් ස්ථානයකට ස්ථානගත නොකිරීම හේතුවෙන් රාජකාරි කිරීමේදී තොරතුරු හුවමාරු කරගැනීමේදී අසීරුතාවයන්ට මුහුණ පෑමට සිදුවූ අතර, අංශයට කාර්යාල සහයකවරයෙකු නොමැතිවීම නිසා වෙනත් අංශ වෙත ලිපි/ලිපිගොණු යැවීමේදී අපහසුතාවයන්ට පත්වීම.

4. ආරක්ෂක අංශය

ජාතික නිවාව සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව දිස්ත්‍රික් කාර්යාල සතු චංචල/නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කරමින් ආයතනික කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීම වෙනුවෙන් කැපවීමෙන් වැඩකරන අංශයක් ලෙස ආරක්ෂක අංශය හඳුනාගත හැකිය. ප්‍රධාන කාර්යාලයට අනුයුත්කව මෙම අංශය තුල මේ වන විට පහත සඳහන් නිලධාරීන් සේවය කරනු ලබයි.

01. සම්පාදනය කළ ඉලක්ක

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය, අධිකාරිය සතු චංචල/නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීම සඳහා පූර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.

ii. පසුගිය වසරේ අප්‍රේල් මස 21 වන දින සිදුවූ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් ආයතනය තුල ආරක්ෂක කටයුතු තර කිරීමට පියවරගත් අතර, පවතින ආරක්ෂක පිරිස් ඌණතාවය හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාම ගිය ආරක්ෂක පිරිස් නැවත සේවයට කැඳවා ඔවුන්ගේ සේවයක් නොපැවතියද, අඛණ්ඩ ආරක්ෂක සේවා පෙර පැවති ත්තවයෙන්ම මේ දක්වා පවත්වාගෙන යාමට අනුමත පුද්ගලික ආරක්ෂක සේවාවකින් කාන්තා ආරක්ෂක නිලධාරිනියන් දෙදෙනෙකු යොදවා ගනිමින් ආරක්ෂක කටයුතු සිදුකරන ලදී.

iii. 2019 ජනවාරි මස වනවිට ආරක්ෂක කාර්ය මණ්ඩලය 68 දක්වා අඩු වූ අතර, තත්වය එසේ තිබියදීත්. ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.

iv. ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කිහිපයක් සඳහා ආරක්ෂක නිලධාරීන් විවිධ ක්‍රම උපායන් යොදා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සිදුවිය.

ආරක්ෂක නිලධාරීන් යෙදවූ සේවා ස්ථාන

1. ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය

2. සොයිසාපුර කලාප කාර්යාලය

3. මිහිඳුපුර නිවාස යෝජනා ක්‍රමය

02. ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

i. ප්‍රධාන කාර්යාලය හා නිවාස මහලේකම් කාර්යාලය ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල සඳහා පැමිණෙන වාහන/පුද්ගලයින්, ගමන්මලු ආදිය පරීක්ෂාවට ලක් කිරීම හා අදාල අංශ වෙත යොමුකිරීම.

ii. ආරක්ෂක නිලධාරීන් වෙත උපදෙස් පංති පැවැත්වීම, දිස්ත්‍රික් කාර්යාල හා සියළුම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරි උපදෙස් ලිඛිතව නිකුත් කිරීම, එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමනාකරුවන් දැනුවත් කිරීම, ආරක්ක නිලධාරීන් සම්බන්ධ වගකීම් හා කාර්ය භාරය සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම හා දැනට අනුමත පුද්ගලික ආරක්ෂක සේවා යොදා ගෙන ඇති දිස්ත්‍රික් කාර්යාල වල ආරක්ෂක කටයුතු පවත්වාගෙන හා අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් එම කාර්යාලවල පාලන අංශය දැනුවත් කිරීම.

iii. සේවක/සේවිකාවන්ගේ රාජකාරි පැමිණීම හා පිටවීම සම්බන්ධව සටහන් පවත්වාගෙන යාම සහ වේලා සටහන යන්ත්‍ර ආරක්ෂාව සඳහා පියවර ගැනීම.

iv. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැළැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභ කිරීමේ චේතනාවෙන් කෙරෙන ක්‍රියාවන් සොයාබලා වාර්තා කිරීම සහ විනය පවත්වාගෙන යාමට සහාය වීම.

v. කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මූලිකව පවත්වාගෙන යනු ලබන අධි ආරක්ෂිත කලාපයෙහි පිහිටි ආයතන, ආරක්ෂක කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා එහිදී ගනු ලබන තීරණ හා උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

vi. පාලන අධිකාරියේ තීරණ මත සේවා ස්ථාන සඳහා පිරිස් යෙදවීම අවම මට්ටමක පවත්වාගෙන යාම, අතිකාල අවම කර ගැනීමට කටයුතු කිරීම හා ඒ තුලින් අධිකාරියේ මූල්‍ය තත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළත්, පවතින ආරක්ෂක පිරිසගේ ඌණතාවය හේතුවෙන් එය පාලනය කිරීම අපහසු වී ඇත.

vii. නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිණි අවි සන්නද්ධ ආරක්ෂක පිරිස් යෙදවීම.

viii. හදිසි ගිණි ආපදාවකදී මුහුණ දීම සඳහා අවශ්‍ය අධි බල ගිණි නිවාරණ ජල නල පද්ධතියක් අවශ්‍යතාවය නැවත නැවත අවධාරණය කරන අතර, එය ක්‍රියාත්මක කර ගැනීම සඳහා නැවතත් ඉල්ලීම් ඉදිරිපත් කලත් 2019 වර්ෂයේදී ද එය ක්‍රියාත්මක නොවීය. දැනට ගොඩනැගිල්ලේ සවිකර ඇති විදුලි සෝපාන යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් සොයා බැලීම වැදගත් වන අතර, දැනට අළුතින් විදුලි සෝපාන දෙකක් සවිකිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

ix. ආරක්ෂක කටයුතු පහසු කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම යොදා ගැනීම සුදුසු බැවින් CCTV කැමරා පද්ධතියක් කාර්යාල පරිශ්‍රයේ සවි කිරීම සිදුකර ඇති අතර, ආරක්ෂක කටයුතු වලදී එය ඉතා වැදගත් වේ.

x. අධිකරණ නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ මෙහෙයුම සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගිකරවීම හා හිස් බුක්තිය භාරගත් නිවාස වලට නැවත ඇතුල්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය හා ක්‍රියාවට නැංවීම, මූලික විමර්ශණ වාර්තා සැකසීම.

ඉලක්ක සපුරා ගැනීමේදී මුහුණ දීමට සිදුවූ ගැටළු

i. ප්‍රධාන කාර්යාලය ඇතුළු සේවා ස්ථාන 03 ක ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පැය 24 ම ආවරණය වන පරිදි සේවයේ යෙදවීමට ප්‍රමාණවත් ආරක්ෂක පිරිසක් නොමැතිවීම නිසාත්, සේවා අවශ්‍යතාවය මත අතිකාල සේවයේ යෙදවීමට සිදුවීම. හිමි නිවාඩු ලබා ගැනීම ඉතා අසීරු ලෙස පාලනය කිරීම.

ii. කාන්තා ආරක්ෂක නිලධාරිණී පුරප්පාඩු 05 ක් පැවතියද ඒවා සම්පූර්ණ නොකිරීම නිසා ආරක්ෂක තත්වය පවත්වාගෙන යාමේදී ගැටළු සහගත තත්වයක් මතුවී තිබූ අතර, 2019 අප්‍රේල් මස සිට කාන්තා ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලැබී ඇත.

iii. සමස්ථ ආරක්ෂක පිරිසගෙන් සුළු පිරිසක් පුරුද්දක් වශයෙන් වැටුප් රහිත නිවාඩු වැඩි ප්‍රමාණයක් ලබාගන්නා බැවින්, ඒ සම්බන්ධව පාලන අංශය වෙත යොමු කළද, වැටුප් රහිත නිවාඩු සේ සැලකීම හැර වෙනත් ක්‍රියාමාර්ගයක් නොගැනීම

iv. යෝජනා කළ අධිබල ගිණි නිවාරණ පද්ධතිය 2019 වසරේදීත් ක්‍රියාත්මක නොකිරීම.

v. ආරක්ෂක අංශය වෙත පැවරෙන හදිසි රාජකාරි ඉටුකිරීම, අවශ්‍ය ඉදිකිරීම් පරීක්ෂාව හා ඉවත් කිරීම, මූලික විමර්ශණ කටයුතු වැනි විශේෂිත රාජකාරි සඳහා ආරක්ෂක අංශය වෙත වෙන් කරන ලද වාහනයක් නොමැති වීම.

vi. වැඩි සේවක ප්‍රමාණයක් හා විශේෂිත අංශයක් වූ ආරක්ෂක අංශයට ඡායා පිටපත් යන්ත්‍රයක් කොතෙකුත් ඉල්ලීම් කලත් මෙතෙක් එම කටයුත්ත ඉටු වී නැත.

vii. විශේෂිත රාජකාරි යොදවනු ලබන ආරක්ෂක පිරිස පවරන ලද රාජකාරි නිසි පරිදි අවසන් කළ පසු ඇගයීමට ලක් කර ලිපියක් නිකුත් කිරීම වැදගත් වේ.

ඉහළ කළමනාකාරීත්වය විසින් ආරක්ෂක අංශයේ පවතින පිරිස් බල ඌණතාවයට පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ❖ දිවයින පුර සේවයේ යොදවා සිටින ආරක්ෂක පිරිස් තෝරගත් දිස්ත්‍රික් කාර්යාල කිහිපයකට යොමුකරමින් පුරප්පාඩු පවතින දිස්ත්‍රික් කාර්යාලයන්හි ආරක්ෂක රාජකාරි අනුමත පුද්ගලික ආරක්ෂක සේවාවකට පැවරීම.
- ❖ මෙම කාර්යාල වෙනුවෙන් ආරක්ෂක කටයුතු අධීක්ෂණය සඳහා පරිපාලන ආරක්ෂක නිලධාරියෙකු යෙදවීමට සැලසුම් සකස් කිරීම.
- ❖ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පිරිස් බඳවා ගැනීම සම්බන්ධයෙන් වාර්තා සකස් කර ඉහළ කළමනාකාරීත්වය මඟින් අදාළ අංශ දැනුවත් කිරීමට පියවර ගැනීම.

<u>විශේෂිත වූ කරුණු</u>

i. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක පිරිස් විවිධ පුහුණු වැඩසටහන් වලට යොමු කිරීම.

ii. දැනට පවතින ආරක්ෂක නිලධාරී පුරප්පාඩු නිසා රාජකාරි නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බැවින් ඉතා ඉක්මනින් අවශ්‍ය බඳවා ගැනීමේ කටයුතු කළ යුතුවේ. එසේ බඳවා ගැනීමට නොහැකි වේනම්, පුහුණුව ලබන ආරක්ෂක සේවාවකින් පිරිස් යොදා ගැනීම පිළිබඳ ඉදිරි කටයුතු සොයා බැලීම වැදගත් වේ.

iii. වසර ගණනාවක සිට පීව වෙඩි පුහුණු ලබා දීමට නොහැකි වූ අතර, එම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

iv. පුහුණු වැඩසටහන් වලට යොමුකරන ලද ආරක්ෂක පිරිස් විවිධ දක්ෂතා එළි දක්වමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්ති නාමය රැකගෙන ඇත. ආරක්ෂක පුහුණු වැඩසටහන් හා විවිධ පුහුණු වැඩසටහන් වලට ආරක්ෂක පිරිස් යොමු කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා.සම්.කළ.හා පාලන) ගත් පියවරයන් පැසසුමට ලක්විය යුතුය.

v. ආරක්ෂක අංශයට වාර්ෂිකව ලබාදෙන නිල ඇඳුම් නිසි කලට වේලාවට ලබා දීමේදී ගැටළුකාරී තත්වයක් මතුවී ඇති බැවින් එම ගැටළු සම්බන්ධයෙන් අවධානය යොමුකර නිසි කලට නිල අඳුම් ලබාදීමට කටයුතු කිරීම.

vi. ඉදිකිරීම් නිමකොට ආරක්ෂක අංශය භාරගනු ලබන බොහෝ නිවාස ක්‍රමවල නිවාස යලි නිවාස ලාභීන් වෙත භාරදීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ආරක්ෂක නිලධාරීන් වසර 03, 04, 05 පමණ දීර්ඝ කාලයක් සේවයේ යෙදවීමට සිදුවන නිසා අනවශ්‍ය විශාල පිරිවැයක් දැරීමට සිදුවීම

vii. ආරක්ෂක පිරිසගේ සුභ සාධනය සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.

5. පුහුණු අංශය

2019.12.31 දිනට ප්‍රගති වාර්තාව

අයවැය	2019 වර්ෂය සඳහා (රු)
පුහුණු හා ශිෂ්‍යත්ව	9,860,000.00
පුහුණු හා ණය	4,500,000.00
	14,360,000.00

2019 වර්ෂය සඳහා වෙන් කිරීම්				
අනු අංකය	**විස්තරය**	**2019 අයවැය අනුව වෙන් කළ මුදල (රු)**	**පුහුණු ඒකකය මඟින් වෙන්කළ මුදල (රු)**	**මුළු එකතුව (රු)**
1	2019 වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම්	8,230,000.00		
2	අභ්‍යන්තර පුහුණු වැඩසටහන්		4,500,000.00	
3	භාහිර පුහුණු වැඩසටහන් (දේශීය)(90%)			
4	ප්‍රධාන කාර්යාලය		1,360,000.00	
5	දිස්ත්‍රික් කාර්යාල		1,500,000.00	
6	භාහිර පුහුණු වැඩසටහන්- විදේශීය ශිෂ්‍යත්ව		2,500,000.00	9,860,000.00
7	ස්වාභිමත පුහුණු වැඩසටහන	4,500,000.00		4,500,000.00
2019 වර්ෂයේ පුහුණුව සඳහා වෙන්කළ මුළු මුදල				**14,360,000.00**

2019 වර්ෂයට අදාළ ප්‍රගතිය				
වැඩසටහන් විස්තරය		**වැඩසටහන් සංඛ්‍යාව**	**සහභාගිවූ සංඛ්‍යාව**	**වියදම් වූ මුදල (රු)**
1	අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	8	813	374,302.40
2	භාහිර පුහුණු වැඩසටහන් (දේශීය)(90%)			
	ප්‍රධාන කාර්යාලය	20	54	387,810.00
	දිස්ත්‍රික් කාර්යාල		80	268,650.00
3	විදේශ ශිෂ්‍යත්ව	2	10	486,027.00
4	විදේශ සංචාර	1	1	825,494.67
5	ස්වාභිමත පුහුණු ණය වැඩසටහන	3	13	934,500.00
මුළු එකතුව		**34**	**971**	**3,276,784.07**


2019 වර්ෂයට අදාළ වියදම් සාරාංශය				
අනු අංකය	**විස්තරය**	**පුහුණු ඒකකය මඟින් වෙන්කළ මුදල(රු)**	**පුහුණු ඒකකයට දැරීමට සිදුවූ වියදම් (රු)**	**අවසාන ශේෂය (රු)**
1	2019 වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම්			
2	අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	4,500,000.00	374,302,40	4,125,697.60
3	භාහිර පුහුණු වැඩසටහන් (දේශීය)(90%)			
4	ප්‍රධාන කාර්යාලය	1,360,000.00	387,810.00	972,190.00
5	දිස්ත්‍රික් කාර්යාල	1,500,000.00	268,650.00	1,231,350.00
6	භාහිර පුහුණු වැඩසටහන්- විදේශීය ශිෂ්‍යත්ව	2,500,000.00	486,027.00	2,013,973.00
7	ස්වාභිමත පුහුණු වැඩසටහන	4,500,000.00	934,500.00	3,565,500.00
2019 වර්ෂයේ වියදම් වූ මුළු මුදල		14,360,000.00	2,451,289.40	11,908,710.60
විදේශ සංචාර		4,000,000.00	825,494.67	3,174,505.33

2019 වර්ෂය තුල පවත්වන ලද අභ්‍යන්තර පුහුණු වැඩසටහන්				
	වැඩසටහන් විස්තරය	**වැඩසටහන් සංඛ්‍යාව**	**සහභාගිවූ සංඛ්‍යාව**	**වියදම් වූ මුදල (රු)**
1	සැමට සෙවණ ආදර්ශ ගම්මානවල ජනාධිපති කාර්ය සාධන බලකා වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා හරිත ගම්මාන බවට පත් කිරීම	1	120	144,362.40
2	සමාජ කථිකා වැඩපොල සහයෝගීතාවය	1	55	0.00
3	සැමට සෙවණ ආදර්ශ ගම්මාන ජනාධිපති කාර්ය සාධන බලකා වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා හරිත ගම්මාන බවට පත් කිරීම	1	120	0.00
4	Workshop on Recovery Management	1	145	143,440.00
5	Awareness Programme on NVQ-Level 05	1	103	0.00
6	Workshop on File System & Motivation	1	140	20,000.00
7	ජනාධිපති කාර්යාලය හා එක්ව ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සැමට සෙවණ ආදර්ශ ගම්මාන තුල ක්‍රියාත්මක කිරීම	1	100	66,500.00
8	සභාධිපත්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	1	30	0.00
මුළු එකතුව		**8**	**813**	**374,302.40**


6. විනය අංශය

2019.12.31 දිනට ප්‍රගතිය.

සුළු විෂමාචාර



බරපතල විෂමාචාර



3. 2019 වර්ෂය තුළ විධිමත් විනය පරීක්ෂණ 18 ක් පැවති අතර, ඉන් 03 ක් අවසන් කර විනය නියෝග නිකුත් කර ඇත. 2019.12.31 වන විට අවසන් කිරීමට නොහැකි වූ විධිමත් විනය පරීක්ෂණ ගණන 15 ක් වන අතර, 2020 වසර වන විට එම පරීක්ෂණ අතුරින් පරීක්ෂණ 11 ක් අවසන් කර විනය නියෝග මේ වන විට නිකුත් කර ඇත. ඉදිරියේදී පරීක්ෂණ පැවැත්වීමට නියමිත ගණන 02 කි.

විනය කටයුතු අංශය මඟින් සිදුකර ඇති අනෙකුත් රාජකාරි

1. 2019 වසරේදී අධිකරණය/කම්කරු විනිශ්ච සභාව/මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතනවල පැවති නඩුවලට අදාල ගොණු හා ලිපිලේඛණ රැගෙන නඩුවලට සහභාගි වීම

2. විධිමත් විනය පරීක්ෂණ සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සැදීම සිදුකිරීම

3. 2019 වර්ෂය තුලදී විනය අංශයට මුහුණ පෑමට සිදුවූ බාධාවන් හේතුකොට ගෙන නියමිත ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය. ඉලක්ක කරා ළඟා වීමේදී මුහුණ පෑමට සිදුවූ බාධක ලෙස,

   - විගණන හා විමර්ශණ වාර්තාවල පැවැති දුර්වලතාවයන් හේතුකොට ගෙන චෝදනා පත්‍ර සකස් කිරීමේදී මෙන්ම විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමේදී ගැටළුකාරී තත්වයන්ට මුහුණපෑමට සිදුවිය.
   - විනය අංශය සතුව පවතින සීමිත ඉඩ පහසුකම් හේතුකොටගෙන විනය පරීක්ෂණ අවසන් කිරීමට කාලයක් ගතවීම.
   - විධිමත් විනය පරීක්ෂණ අවසන් කර අවසන් පරීක්ෂණ වාර්තා නිකුත් කළද විනය නියෝග ලබාදීම සඳහා කල්ගතවීම හේතු කොටගෙන චූදිත නිලධාරීන් අධිකරණමය ක්‍රියාමාර්ග සඳහා යොමු වී ඇත.
   - 2019 වර්ෂයේදී විධිමත් විනය පරීක්ෂණ පැවැත්වෙන අතරතුර රාජ්‍යතන්ත්‍රය වෙනස් වීම තුළ පරීක්ෂණ දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදුවිය.

ඉහතින් සඳහන් කළ දුර්වලතාවයන් මඟහරවා ගැනීමට හා මෙම අංශයේ කටයුතු වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

1. ආයතනයේ විනය කටයුතු සම්බන්ධයෙන් හා අධිකාරියේ පවතින නීතිරීති/චක්‍රලේඛ හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

2. විනය විරෝධී ක්‍රියාවත් සිදු වූ පසු දඬුවම් ලබාදීමට වඩා වංචා හා වැරදි වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම.

3. විනය විරෝධී සිද්ධීන් සම්බන්ධයෙන් සිදුකරනු ලබන විගණන හා විමර්ශණ අවසානයේදී සම්පූර්ණ කරුණු සහිත වාර්තා ඉදිරිපත් කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

4. විනය ව්‍යවස්ථා මාලාව සංශෝධනය කිරීම.

5. මෙම අධිකාරියේ පවතින නීතිරීති/චක්‍රලේඛ හා කාර්යාල ක්‍රම පිළිබඳව නොදැනුවත්කම හා පරිපාලන දුර්වලතා හේතුවෙන් 2017 වර්ෂයට වඩා 2018 හා 2019 වර්ෂයන්හි විනය විරෝධී ක්‍රියා සිදුවී ඇති බවට සමස්ථයක් වශයෙන් වාර්තා වී ඇත.

6. ආයතනයේ අරමුණු කරා ළඟාවීමේදී ඉහත සඳහන් කරුණු පිළිබඳව මීට වඩා සැලකිල්ලක් දැක්වීම තුලින් හා සේවක පිරිසගේ පුද්ගල සංවර්ධනය සිදුවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් විනයගරුක සේවක පිරිසක් බිහි කිරීම.

7. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පුස්තකාලය

අතීතයේ පුස්තකාල තුළ මුද්‍රිත පොත පත පමණක් තිබුණද, මේ වනවිට එම තත්වයෙන් පරිභාහිරව ගොස්, පුස්තකාල තාක්ෂණයෙනුත් ඉදිරියට ගොස් පුස්තකාල තොරතුරු කේන්ද්‍ර බවට පත් වී ඇත. මේ අනුව වර්තමානය වනවිට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් ද තොරතුරු ගබඩා ඇති අතර, ඉඩකඩ ප්‍රමාණය අවමවීම හා ඉක්මනින් තොරතුරු සොයා ගැනීමේ හැකියාව ද ඇත.

1979 වසරේ හිටපු ජනපති අතිගරු දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආරම්භ කරනු ලැබූ අතර, 1987 වසරේ අධිකාරිය තුළ එහි නිළධාරීන්ගේ හා සේවකයන්ගේ ද ප්‍රයෝජනය මෙන්ම ද විශ්ව විද්‍යාල සිසුන් හා ආචාර්යවරුන්, රජයේ හා පුද්ගලික ආයතන වල සේවකයන්ගේ ද ප්‍රයෝජනය සඳහා ද මෙහි නිවාස විෂයට අදාළ විශේෂ පුස්තකාලයක් පිහිටුවන ලදී. මෙහි නිවාසීකරණයට සම්බන්ධව විෂයන්ට අදාළ රජයේ ප්‍රධාන ආයතනයක් වන අධිකාරියට එයට අන්තර්ගත කොට ඇති ප්‍රකාශන අතරෙහි නිවාස, ගොඩනැගිලි හා සම්බන්ධික ඉදිකිරීම්, ඉංජිනේරු, ගෘහ නිර්මාණ, ප්‍රමාණ සමීක්ෂණ, ඉඩම් මෙන්ම ඒ යටතේ ඇති අනු විෂයයන් සඳහා ද එකතුවක් ගොනු කොට ඇත.

තව ද තොරතුරු එක් රැස්කර ගැනීමේ දී පොත පත පමණක් නොව විෂයනට සම්බන්ධ සඟරා, පුවත්පත් කැපුම් ද නිවාස යෝජනා පිළිබඳ ඵල වූ තොරතුරු ද මීට අමතරව නීති චාර්තා, රජයේ පනත් ආදී එකතුවකුත් ද මෙහි ගබඩා වී ඇත.

පුස්තකාලයෙහි ඇති තොරතුරු නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ යුතු ස්ථීර නිළධාරීන් හා සේවකයන් හට පොත පත බැහැර දීම සඳහා ලබාදෙන නමුත් අනෙකුත් පාඨකයින් හට විමර්ශන කටයුතු සඳහාත් ලබා දෙනු ලබයි.

වටිනා ග්‍රන්ථ 7000 ක පමණ එකතුවකින් යුතුව කොළඹ නගර උතුර කාර්යාල පරිශ්‍රයේ පිහිටා තිබුණු මෙම පුස්තකාලය නැවතත් ප්‍රධාන කාර්යාලයෙහි ස්ථාපිත කර ඇත.

8. සුභ සාධක සංගමය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සුභ සාධක සංගමයේ 2019 වර්ෂය තුළ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු මෙසේය.

1. සුභ සාධක සංගම් සාමාජිකයන් හට සහන පොළී පදනමක් යටතේ මාස 10 ක ගෙවීම් කාලයකට යටත්ව සාමාජිකයන් වෙත 2019 වර්ෂය තුළ ගෙවනු ලැබූ මුළු ණය සඳහා වැය වී ඇති මුදල් ප්‍රමාණය රුපියල් 1,3012,500/- කි.

2. නව වසර ආරම්භවීමත් සමඟ දිස්ත්‍රික් කාර්යාල ද ඇතුළුව නිවාස අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය වෙත තේ පැන් සංග්‍රහයක් ලබා දීම.

3. සාමාජික සාමාජිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කිරීම සඳහා සමස්ථ ලංකා කැරම් තරඟාවලියක් පැවැත්වීම.

4. සුභ සාධක සංගම් සාමාජිකයන් සඳහා පොළී රහිතව අවුරුදු රෙදිපිළි ණය සහන පදනම යටතේ ලබා දීම හා වෙනත් විදුලි උපකරණ, රන් භාණ්ඩ වට්ටම් සහන යටතේ ගෙවීම් පදනම මත ලබා දීම.

5. සුභ සාධක සංගමයේ සාමාජිකයන්ගේ 05 වසර ශිෂ්‍යත්වය සමත් දරු දරියන් හට ත්‍යාග කට්ටලයක් ලබා දීම.

6. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් විශ්‍රාම ගන්වනු ලබන සාමාජිකයන් හට තිළිණ ප්‍රධානය. (සමරු තිළිණයක් ද ඇතුළුව) 2019 වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වැය වූ මුළු මුදල රුපියල් 1173250/- කි.

7. සුභ සාධක සංගම් සාමාජිකයන් ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයට සහන මිලට භාණ්ඩ මිල දී ගැනීම සඳහා "අළුත් අවුරුදු පොළ" පැවැත්වීම.

8. සෑම වැටුප් දිනයකදීම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් හට වෙනත් ආයතන මඟින් අලෙවි කරනු ලබන භාණ්ඩ (කිරිපිටි/බැංකු හා රක්ෂණ ජගම සේවා/රෙදිපිළි/බිස්කට්/අනෙකුත් ද්‍රව්‍ය) සහන මිලට වට්ටම් මුදලක් යටතේ ලබාදීම.

9. 2019 වර්ෂය තුල සාමාජික, සාමාජික ඥාති මරණයකදී ගෙවා ඇති මුළු අවමංගල්‍යාධාර ප්‍රතිලාභ සඳහා වැය වී ඇති මුදල රුපියල් 1,545,000.00 කි.

10. සුභ සාධක සංගම් සාමාජිකයකු සේවයේ නියුතුව සිටියදී මියගිය විට ඉහත සඳහන් රු.20,000.00 ක මුදලට අමතරව වැන්දඹු අනත්දරු ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ රුපියල් 440,000.00 ක මුදලක් අදාළ සාමාජිකයාගේ යැපෙන්නන් වෙත පිරිනමා ඇත.

11. සාමාජිකයෙකුගේ මරණයක් සඳහා අදාළ අංශයෙන් හෝ අදාළ දිස්ත්‍රික් කාර්යාලය මඟින් ගෙනයනු ලබන මල්වඩම් හා අදාළ වියළි ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් දරණු ලබන වියදම් වෙනුවෙන් රුපියල් 88,480.00 න මුදලක් සාමාජිකයින් වෙත ගෙවා ඇත.

12. සුභ සාධක සංගමගේ අරමුදල් තරකර ගැනීම සඳහා ලොතරැයිපත් මුද්‍රණය කරනු ලැබූ අතර ඉන් ලැබූ මුළු ආදායම රුපියල් 460,590.00 කි.

9. ප්‍රවාහන අංශය

ප්‍රවාහන අංශයේ කාර්ය මණ්ඩලය.

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය - 20
- රියදුරු - 42
- රිය සහායක - 02

64

ජාතික නිවස සංවර්ධන අධිකාරියේ රියදුරු තනතුරේ සේවයේ නියුතු සේවක තොරතුරු

විස්තර	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාලය	එකතුව
ස්ථීර	19	33	52
දෛනික	02	06	08
කොන්ත්‍රාත්	21	14	35
	42	53	95

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රවාහන සංචිතයේ 2019.12.31 දිනට ඇති වාහන විස්තරය

විස්තරය	**කාර්**	**ජීප්**	**ඩබල් කැබ්**	**වෑන්**	**ලොරි**	**කෲ කැබ්**	**එකතුව**
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන	06	08	48	03	09	02	75
මෙහෙයුම් කල්බදු පදනමට ලබාගත් වාහන	-	03	15	-	-	-	18
මාසික කුලී පදනමට ලබාගත් වාහන	06	-	11	01	-	-	18
එකතුව	**12**	**11**	**74**	**04**	**09**	**02**	**111**

02. මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබාගත් ජීප් රථ 03 ක් ප්‍රධාන කාර්යාලයේ ඉහල කළමනාකාරිත්වයේ රාජකාරී සඳහා යොදවන ලද අතර, කැබ් රථ 15 ක් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් දිස්ත්‍රික් කාර්යාල සඳහා අනුයුක්ත කර ඇත. මෙම වාහන සඳහා 2019 වර්ෂය තුල බදු කුලිය ලෙස රු.43,912,543/= ක් වැය කර ඇත.

03. 2019 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.10,927,242.11 ක් වැය කර වාහන 36 ක් අලුත්වැඩියා කර ධාවනයට එක් කර ඇත. ධාවනයෙන් ඉවත්කර තිබූ වාහන 06ක් 2019 වර්ෂයේ දී අපහරණය කර රු. 5,338,792.20 මුදලකට විකුණා ඇත.

04. වාහන රක්ෂණය කිරීම සඳහා අදියර 02කදී රක්ෂණ වාරික මුදල් ලෙස රු.190,980/= ක් වැය කර ඇති අතර 2019 වර්ෂය තුලදී රක්ෂණ වන්දි මුදල ලෙස රු.217,432.50 ක් ලබා ගෙන ඇත.

05. සියළුම වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා රු.598,000/= ක් වැය කර ඇත. බලපත්‍ර ලබා ගැනීමට පෙර දුම් පරීක්ෂණ වාර්තා ලබා ගැනීම වෙනුවෙන් රු.53,565/= ක් වැය වී ඇත.

06. 2019 වර්ෂය සඳහා සංචිත වාහන වලට ඉන්ධන සැපයීම සඳහා අයවැය ප්‍රතිපාදන රු.මි. 60.857 ක් වෙන් වී ඇති අතර, 2019 වර්ෂයේදී රථ ධාවනයේ යොදවා ගැනීම වෙනුවෙන් ඉන්ධන සැපයීම සඳහා රු.11, 611,878.53 ක් වැය වී ඇත.

07. වාහන වාර සේවා කිරීමේදී දළ වශයෙන් ධාවන කි.මී.4000 කට පසුව වාර සේවාව සිදු කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ රාජකාරි යොදවා ඇති වාහන පමණක් වාර සේවා කිරීම සඳහා 2019 වර්ෂයේදී රු.2,922,541.09 ක් වැය කර ඇත.

08. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සංවර්ධන වැඩ සටහන් වර්ධනය වීම සහ ඉහල තනතුරු සඳහා ප්‍රවාහන අවශ්‍යතා ඉහල යාමට අනුව ප්‍රවාහන සේවා සැපයීමට නොහැකි වීම නිසා 2019 වර්ෂය තුලද මාසික කුලී පදනම මත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර වාහන කුලියට ගැනීමට සිදු විය. ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ පමණක් නිලධාරීන් 16 දෙනෙකුට ප්‍රවාහන පහසුකම් සැපයීමට හා වෙනත් විශේෂ කාර්යයන් සඳහා කුලී වාහන ලබාගෙන ඇති අතර ඒ සඳහා රු.20,854,378.51 ක මුදලක් වැය කර ඇත.

09. ප්‍රවාහන අංශයේ වාහන අළුත්වැඩියා සහ අනෙකුත් නඩත්තු වියදම් සඳහා රු.75,000/= ක් බැගින් මාසික වාර දෙකකදී අක් මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යනු ලැබේ. 2019 වර්ෂයේදී අක් මුදල් ලෙස රු.1,690,759.11ක් වියදම් කර ඇත. ප්‍රවාහන අංශයේ ගරාජය සඳහා රු. 5,000/= ක උපරිමයට යටත්ව අමතර කොටස් මිලදී ගැනීම හා සුළු අළුත්වැඩියා සිදු කිරීමත් , අධිවේගී මාර්ගයේ වාහන ගමන් කිරීම වෙනුවෙන් ලද බිල්පත් පියවීමත් අක් මුදලින් සිදු කර ඇත.

10. සුළු අළුත්වැඩියාවන් ප්‍රවාහන අංශයේ ගරාජයේ සිදු කිරීම මගින් අළුත්වැඩියා වියදම අවම කර ගැනීමට කටයුතු කර ඇත.

11. අළුත්වැඩියා හා නඩත්තු වියදම ඉහල යාම හා ඉන්ධන කාර්යක්ෂමතාව අඩුවීම නිසා ඉතා පාඩු සහගත පැරණි වාහන 16 ක් අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර තවත් වාහන 04 ක් ධාවනයෙන් ඉවත් කරන ලදී.

12. ප්‍රවාහන සංචිතය සතු වාහන ඉතා පැරණි වාහන බැවින් ප්‍රවාහන සේවා කාර්යක්ෂම කර ගැනීම හා කුලී වාහන ලබා ගැනීම අවම කර ගැනීම සඳහා අවම අවශ්‍යතාවය මත අළුතින් වාහන මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කල ද අදාල චක්‍රලේඛන අවලංගු වීම නිසා මිලදී ගැනීමට නොහැකි විය.

13. එබැවින් ප්‍රවාහන සංචිතය සතුව පවතින වාහන ඉතා පැරණි වුවද, අළුතින් වාහන එකතු නොවීම නිසා පැරණි වාහන අපහරණය කිරීම ප්‍රමාද වී ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන සංචිතය වයස් ප්‍රමාණය අනුව වර්ගීකරණය.

අනු අංකය	වාහන වර්ගය	05 ට අඩු	5-10	10-15	15-20	20 ට වැඩි	එකතුව
01	කාර් රථ	-	-	04	01	-	05
02	ජීප් රථ	-	-	-	-	08	08
03	වෑන් රථ	-	-	01	-	02	03
04	ඩබල් කැබ්	-	17	05	20	06	48
05	ලොරි	-	-	-	-	09	09
06	කෲ කැබ්	01	-	01	-	-	02
	එකතුව	**01**	**17**	**11**	**21**	**25**	**75**

14. සංචිතය සතුව පවතින වැඩි වාහන ප්‍රමාණයක් අවුරුදු 15,20 ඉක්මවා ඇති බැවින් ප්‍රවාහන සේවා සැපයීමේදී බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇති අතර ආයතනයේ සංවර්ධන කාර්යයන් වලදී ද බලපා ඇත.

15. මෙම පැරණි වාහන රාජකාරි සඳහා යෙදවීමේදී ඉතා අකාර්යක්ෂම බැවින් දුර බැහැර රාජකාරි හා නිලධාරීන්ට ප්‍රවාහන සේවා සැපයීම සඳහා කුලී පදනමින් වාහන ලබා ගැනීමට සිදුවී ඇති අතර 2018 වර්ෂයට වඩා 2019 වර්ෂයේදී කුලී මුදල් ලෙස වැඩිපුර මුදලක් වැය කිරීමට සිදුවී ඇත. එමෙන්ම වාහන අළුත්වැඩියා වියදමද 2018 වර්ෂයට වඩා වැඩි වී ඇත.

2019 වර්ෂය තුලදී ප්‍රවාහන අංශයේ අය වැය ලේඛනය.

අනු අංකය	**විස්තරය**	**අයවීම (රු)**	**වැයවීම (රු)**
1	වාහන බලපත්‍ර ගාස්තු		598,000.00
2	වාහන සඳහා		53,565.00
3	සියළු වාහන රක්ෂණය කිරීම		190,980.00
4	වාහන විකිණීම	5,338,792.20	-
5	මෙහෙයුම් කල්බදු වාහන සඳහා ගෙවීම් ජීප් 03 කැබ් 15		 8,741,656.00 35,170,887.00
6	කුලී වාහන සඳහා ගෙවීම		20,854,378.27
7	ඉන්ධන වියදම		11,611,878.00
8	වාහන අළුත්වැඩියා කිරීම		10,927,242,11
9	වාහන වාර සේවා කිරීම		2,922,541,09
10	ටයර්,ටියුබ්,බැටරි යෙදීම		2,578,00
11	වාහන මිලදී ගැනීම		-
12	අක් මුදලින් වාහන අළුත්වැඩියා කිරීම		1,690,759.11
13	අධිවේගී හා අධිවේගී බිල්පත් ඇතුළුව අනෙකුත් බිල්පත් පියවීම (අක් මුදලින්)		189,800.00
14	රක්ෂණ වන්දි මුදල් ලැබීම්/ගාස්තු ගෙවීම	217,432.50	-
එකතුව		**5,556,224.70**	**95,529,949.58**

නීති කොට්ඨාශය

කාර්යයන් විග්‍රහය

ජාතික නිවාස සංවර්ධන ්ධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේදි අනෙකුත් අංශ වලින් මෙන්ම නීති අංශයෙන් ද ඊට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි.

01 ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.
02 මහල් නිවාස වල ඔප්පු ලබා දීම සඳහා අවශ්‍ය වන සහාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරිම.
03 ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළ දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාළව කටයුතු කිරිම.
04 අවශ්‍ය අවස්ථාවලදී යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට එරෙහිව නීති කටයුතු කිරිම.
05 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්ති විඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබා ගැනීම.
06 බාහිර පාර්ශවයන් හා මෙම අධිකාරිය අතර, කටයුතු වලදි කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරිම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරිම.
07 සියලුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය වන පරිදි අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
08 ණය හා කුළි වාරික නෙගෙවන, හිග ණය වාරික හිමියන්ට නීති මගින් කටයුතු කර අධිකාරියට අයවිය යුතු මුදල් ලබා ගැනීම.
09 නීති නිවේදන හා නෙරපීමේ නියෝග ක්‍රියාත්මක වීම තුළින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකිරිම් සඳහා දායකත්වය ලබාදීම ආදී විවිධ කාර්යයන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි.

ඔප්පු නිකුත් කිරිම :-

සම්පූර්ණ මුදල් ගෙවු නිවාස ක්‍රමවල නිවාස ලාභීන් වෙත සින්නක්කර ඔප්පු පිරිනැමීමේ කාර්යය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන කාර්යයකි. මෙහිදී සහාධිපත්‍ය නොවන දේපළ හා ඉඩම් සඳහාද සින්නක්කර ඔප්පු ලබාදේ.

2019 වර්ෂ සඳහා ඔප්පු නිකුත් කිරිමේ වාර්ෂික ඉලක්කය 3000 ක් වුවද ඔප්පු නිකුත් කිරිම සඳහා නීති අංශය වෙත ලැබුණේ ලිපිගොනු 1363 ක් පමණක් වන අතර, එයින් ලිපිගොණු 1165 ක වැඩ නිම කර ඇත.

සින්නක්කර ඔප්පු ලබාදීමට නොහැකි අයට 2016 වර්ෂයේ සිට නව වැඩ සටහනක් වශයෙන් දිවයින පුරා පිහිටි සියලුම දිස්ත්‍රික් කාර්යාල වලින් බදු ඔප්පු නිකුත් කිරිමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේදි ලබාදී ඇති බදු ඔප්පු සංඛ්‍යාව පහත පරිදි වේ.

බදු ඔප්පු නිකුත් කිරිම :-

දිස්ත්‍රික්කය	ලබාදුන් බදු ඔප්පු ගණන
කොළඹ දිස්ත්‍රික්කය	44
සොයිසාපුර	20
ලබාදී ඇති බදු ඔප්පු ගණන	64

ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවන ලද නඩු පිළිබඳ විස්තර :-

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අණපනත්වලට අනුව නිවාස ණය ගෙවීම් පැහැර හරින අයට, නාගරික කුලී ගෙවීම් පැහැර හරින අයට ජාතික නිවාස සංවර්ධ අධිකාරිය සතු ඉඩම් වල සහ ගොඩනැගිලි වල අනවසරයෙන් රැඳී සිටින අයට එරෙහිව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවරනු ලබන නඩු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විරුද්ධව වෙනත් පාර්ශවයන් විසින් පවරනු ලබන නඩු කටයුතු මෙහෙයවීම.

- නීති උපදෙස් ලබා දීම.
- මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම්
- නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර ඇති නඩු සම්බන්ධයෙන් සහාය වීම.

එහිදී 2019 වර්ෂය තුළ දී ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවන නඩු හා එම නඩු පැවරීමට මුල් වූ කරුණු පහත පරිදි වේ.

❖ **ශ්‍රේෂ්ඨාධිකරණය**

ඉඩම් සම්බන්ධව	02
නිවාස ගැටලු	01
සේවයෙන් පහ කිරීමට එරෙහිව	01
එකතුව	**04**

❖ **අභියාචනාධිකරණය**

ඉඩම් සම්බන්ධව	03
අර්ථ සාධක ගැටලු සම්බන්ධව	02
ඉදිකිරීම් කටයුතු සම්බන්ධව	01
එකතුව	**06**

❖ **කම්කරු විනිශ්චය සභාව**

සේවයෙන් පහ කිරීමට එරෙහිව	04
ස්ථාන මාරුවීම් සම්බන්ධ ගැටලු	01
හිග වැටුප් ගෙවීමට අදාළ ගැටලු	01
එකතුව	**06**

❖ **මහාධිකරණය/වානිජ මහාධිකරණය**

සේවයෙන් පහ කිරීමට එරෙහිව	01
ඉදිකිරීම් සම්බන්ධ ගැටලු	02
ඉඩම් සම්බන්ධ	01
එකතුව	**04**

❖ **මහෙස්ත්‍රාත් අධිකරණය**

මුදල් වංචා කිරීම් සම්බන්ධව	01
සෞඛ්‍යමය ගැටලු සම්බන්ධව	01
අර්ථ සාධක ගැටලු	01
එකතුව	**03**

❖ **මානව හිමිකම් කොමිෂන් සභාව**

ඉඩම් සම්බන්ධ ගැටලු	02
එකතුව	**02**

❖ **දිසා අධිකරණය**

ගිවිසුම් කඩකිරීම් සම්බන්ධ ගැටලු	02
බදු කුලි ගැටලු	01
එකතුව	**03**

මුලු නඩු සංඛ්‍යාවේ එකතුව **28**

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය

තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගනිමින් පවත්නා රජයේ ප්‍රතිපත්ති වලට අනුව ඉදිරිපස් අවුරුදු කාල සීමාව තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන උපාය මාර්ග, සැලසුම් හා ඉලක්ක ඇතුලත් සංයුක්ත සැලැස්ම සැකසීම, මධ්‍යකාලීන සැලැස්ම අනුව වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වලට අදාල භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමත්, වර්ෂය ආරම්භ වීමට පෙර සිදුකරනු ලබයි.

සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් හා ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල මගින් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සෑම මාසයක් අවසානයේම ලබාගෙන ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය හා ඉලක්ක සපුරා නොගත් අවස්ථා පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය වෙත හා අමාත්‍යාංශය, භාණ්ඩාගාරය ඇතුළු භාහිර පාර්ශව වෙත වාර්තා කිරීම මෙම කොට්ඨාසය මගින් සිදුකරනු ලබයි. එසේම වර්ෂය තුළ ආයතනයේ ක්‍රියාකාරීත්වය, ඉටුකළ කාර්යභාරය ඇතුලත් වාර්ෂික වාර්තාව, මහ බැංකු වාර්තාව සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු ලබාදීම, අයවැය විවාද අවස්ථාව සඳහා අවශ්‍ය තොරතුරු පාර්ලිමේන්තුව, අමාත්‍යාංශය හා ඉහළ කළමනාකාරීත්වය වෙත ලබාදීම සිදුකරනු ලබයි.

2019 වාර්ෂික ඉලක්කය

භෞතික ඉලක්කය

නිවාස ඒකක	-	64,336
වැඩ නිමිකිරීම්	-	60,277

(2018 න් අවිච්ඡේද නිවාස 35,941 ක් ද ඇතුලත් වේ.)

වර්ෂය සඳහා මූල්‍ය ඇස්තමේන්තුව - රු.මි.20,632.61

භාණ්ඩාගාර අරමුදල්	-	රු.මි. 18,831.13
අභ්‍යන්තර උත්පාදන	-	රු.මි. 510.00
භාහිර අරමුදල්	-	රු.මි. 1291.48

ඉලක්ක ළඟා කර ගැනීම
භෞතික හා මූල්‍ය ප්‍රගතිය (ණය වැඩසටහන)

වැඩ ආරම්භ කිරීම්	නව නිවාස	-	14,137
	වැඩිදියුණු නිවාස	-	39,149
වැඩ අවසන් කිරීම්	නව නිවාස	-	3,698
	වැඩිදියුණු නිවාස	-	25,466
වැයකළ මුදල (රු.මි)		-	6,680.78

භෞතික හා මූල්‍ය ප්‍රගතිය (ආධාර වැඩසටහන)

වැඩ ආරම්භ කිරීම්	- නව නිවාස	-	21,988
	- වැඩිදියුණු නිවාස	-	2,481
වැඩ අවසන් කිරීම්	- නව නිවාස	-	1,659
	- වැඩිදියුණු නිවාස	-	1010
වැයකළ මුදල (රු.මි)		-	4,941.86

භාණ්ඩාගාර අරමුදලින් වැයකල මුදල - රු. මි. 11,069.553
(නිවාස ආශ්‍රිත සේවා සඳහා වැයකල රු. මි. 907.623 ඉහත භාණ්ඩාගාර ප්‍රතිපාදන වැය කිරීම් තුල ඇතුලත්ය.)

සැමට සෙවණ නිවාස සංවර්ධන වැඩසටහන - 2019.12.31 දිනට කාර්ය සාධනය

නිවාස වැඩසටහන	වාර්ෂික ඉලක්ක		ළඟාවීම	
	භෞතික	මූල්‍ය (රු මිලි)	භෞතික	මූල්‍ය (රු මිලි)
භාණ්ඩාගාර අරමුදල්				
1. අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම				
උදාගම්මාන වැඩසටහන (ආදර්ශ ගම්මාන)	12843 ව්‍යාපෘති 470	1790.0	9845 ව්‍යාපෘති 454	710.3
ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන / විසිරි	2369 ව්‍යාපෘති 90	430.0	3230 ව්‍යාපෘති 76	225.4
විසිරි නිවාස - නව / වැඩිදියුණු	15000	1100.0	29553	1572.1
විරු සුමිතුරු	500	140.0	680	150.3
වකුගඩු රෝගීන් සඳහා නිවාස	1000	130.0	1189	129.1
ඉන්දියන් නිවාස වැඩසටහන සඳහා අතිරේක ප්‍රතිපාදන	-	30.0	-	-
2. අර්ධ වශයෙන් නිමි නිවාස නිමකිරීම				
විසිරි නිවාස ණය ආධාර	3000	150.0	2345	55.4
3. උතුරු නැගෙනහිර නැවත පදිංචිකිරීමේ වැඩසටහන				
ආදර්ශ ගම්මාන	9192 ව්‍යාපෘති 407	1020.5	11157	1350.5 ව්‍යාපෘති 437
වැලිඔය නිවාස වැඩසටහන	256	66.3	147	33.6
ගංවතුරින් ආපදාවට පත්වූවන් සඳහා නිවාස	4796	1291.7	4818	747.8
4. හොරණ විශේෂ නිවාස ව්‍යාපෘතිය	30	22.0	25	9.8
උප එකතුව (නිවාස) - භාන්ඩාගාර	**48,986**	**6170.5**	**62,989**	**4984.3**
5. නිවාස අශ්‍රිත සහායක සේවා				
ඉඩම් වන්දි	-	100.0	-	44.4
පැරණි නිවාස ක්‍රම නවීකරණය	ව්‍යාපෘති 23	200.0	ව්‍යාපෘති 33	19.1
කිරිදි ඔය ජල ව්‍යාපෘතිය	-	298.0	-	50.7
මෝදි ගම්මානය ජල ව්‍යාපෘතිය	-	50.0	-	30.4
ආදර්ශ ගම්මාන වල මාර්ග වැඩිදියුණු කිරීම	-	40.0	-	9.2
ප්‍රජා ජල ව්‍යාපෘති	-	100.0	-	132.7
ගම්පෙරලිය	-	300.0	-	63.290
මාලිගාවත්ත බී12 ඒකකය ඉවත් කිරීම	-	20.0	-	-
තංගල්ල නිවාස ව්‍යාපෘතිය	-	100.0	-	-
බේරේ වැව පුනස්ථාපන වැඩසටහන	-	269.0	-	-
ත්‍රිකුණාමලය ආහාර නිෂ්පාදන වැඩසටහන	-	0.2	-	0.2
6. සනීපාරක්ෂක පහසුකම් සැපයීම	53333	4000.0	-	-
7. නාරංගල ඉන්දියන් නිවාස ව්‍යාපෘතිය	-	6.9	-	3.7
උප එකතුව	**53,335**	**5,484.1**	**-**	**353.69**
භාණ්ඩාගාර - එකතුව	**102319 ව්‍යාපෘති 968**	**11,654.1**	**62989 ව්‍යාපෘති 1009**	**5,337.99**
බාහිර අරමුදල්				
8. ආදර්ශ ගම්මාන සඳහා ඉඩම් මිලදී ගැනීම	ඉඩම් 27	410.0	ඉඩම් 27	409.9
9. ආදර්ශ ගම්මාන සඳහා අතිරේක ප්‍රතිපාදන	-	250.0	-	-
10.ඉන්දියානු නිවාස වැඩසටහන	1200 ව්‍යාපෘති 50	600.0	797 ව්‍යාපෘති 32	82.8
11.සෙවණ ආධාර	200	30.0	131	17.1
12.සම්පත් සෙවණ	2000	400.0	356	39.5
13.සිරස නිවාස හා වෙනත්	25	12.5	27	6.4
14.සොදුරු පියස බැංකු ණය	5000	-	6474	999.8
උප එකතුව බාහිර (නිවාස)	**8425**	**1702.5**	7785	1555.5
එකතුව	**110744 ව්‍යාපෘති 1018**	**13377.1**	70774 **ව්‍යාපෘති 1041**	6893.49
15.අවිච්ඡේද වැඩසටහන - වැඩ නිමකිරීම (වැඩ ආරම්භ කිරීම් - ඒකක 6925)	35941 ව්‍යාපෘති 556	74687.6	23248 ව්‍යාපෘති 280 වැ.ආ.කි. 6981	6018.2
16. තාක්ෂණ නිළධාරීන් සඳහා පුහුණු වැඩමුළු	-	10.0	-	2.4
17. ඔප්පු නිකුත් කිරීම්	3000	-	1224	-

මීට අමතරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලදී පැන නැගෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමත් මෙම කොට්ඨාසය මඟින් කරනු ලබන රාජකාරි අතර වේ.

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය පියවර ගැනීම සිදුකරන අතර, සෙවණ අරමුදලට ලැබෙන අරමුදල් යෙදවීම සඳහා අරමුදල් ලබාගැනීමට සෙවණ පාලක මණ්ඩලය කැඳවීම හා අදාළ පාලක මණ්ඩල පත්‍රිකා අදාළ කොට්ඨාස වෙතින් ලබාගෙන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකෙරේ. ඒ අනුව වර්ෂය තුල සෙවණ පාලක මණ්ඩල රැස්වීම් වාර 05ක් පවත්වා ඇත.

ඉදිරි වර්ෂ සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා වැඩසටහන්, ඇස්තමේන්තු හා ව්‍යාපෘති යෝජනා සකස්කර සැලසුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් වාර්ෂිකව සිදුකරනු ලබන රාජකාරි අතර වේ. ඒ අනුව 2019 වර්ෂය තුල ආයතනය වෙත ලැබුණු ඉහළම භාණ්ඩාගාර අරමුදල් ප්‍රමාණය එනම්, රු.මි.11,375.688 ක මුදල වෙන්කර ලබාගැනීමට හැකිවීම ලැබූ ජයග්‍රහනයකි. එම ප්‍රමාණය 2018 වර්ෂයට සාපේක්ෂව 33% ක වැඩිවීමකි.

මීට අමතරව 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය සඳහා ආයතනයට අදාළ තොරතුරු ලබාදෙමින් එම තොරතුරු යාවත්කාලීන කිරීම හා රජයෙන් තෝරාගත් තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ සම්බන්ධීකරණය මෙම කොට්ඨාසය මඟින් ඉටුකළ රාජකාරි අතර වේ.

දිවයිනේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින පුහුණු ශ්‍රම හිඟයට පිලියමක් ලෙසත්, විරැකියාවෙන් පෙළෙන තරුණ කොටස් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථා උදාකරදීමේ අරමුණින් සහෝදර ආයතනයක් වන වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව 2019 වර්ෂය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකරනු ලබන උදාගම්මානවල, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් යටතේ වඩු, මේසන්, ජලනල, වැද්දුම්කරු, විදුලි වැනි සෑම ක්ෂේත්‍රයකම ශිල්පීන් බිහිකිරීමට හැකිවිය. මෙම පුහුණුලාභීන් සඳහා මාස 03 ක පූර්ණ කාලීන පහුණුවක් ලබාදුන් අතර, පුහුණුව අවසානයේ ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් ඔවුන්ගේ කුසලතාවය ආයතනයේද සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය ගොඩනැගිළි ද්‍රව්‍ය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ මැදිහත්වීමෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා මිලදී ගැනීම කරන ලදී. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ප්‍රගති කොට්ඨාසය වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කරමින් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබාදෙන ලදී.

පුහුණු කාලය සාර්ථකව අවසන් කරන පුහුණුලාභීන් වෙත පැමිණීමේ දීමනාවක් වශයෙන් මාසයකට රු.10,000.00 බැගින් රු.30,000.00 ක මුදලක් ගෙවීම සිදුකළ අතර, වැඩසටහන අධීක්ෂණය කරමින් පහසුකම් සැලසූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරුවන්ට පුහුණුලාභීන් සංඛ්‍යාව අනුව මසකට උපරිමය රු. 30,000.00 කට යටත්ව දීමනාවක් හා ව්‍යාපෘතිවලදී පුහුණුව ලබාදුන් තාක්ෂණ නිලධාරීන්ටද එක් පුහුණුලාභියෙකු වෙනුවෙන් දිනකට රු.160.00 බැගින් දීමනාවක්ද ලබාදෙන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරුවන් වෙත හා තාක්ෂණ නිලධාරීන් වෙත ඔවුන් මෙහිදී ලබාදුන් දායකත්වය පරීක්ෂාකර බලා ඔවුන් වෙත අදාළ දීමනා මුදල් ලබාදීම නිර්දේශ කිරීම හා අදාළ ප්‍රතිපාදන ලබාගැනීම හා නිදහස් කිරීම සඳහා අනුමැතීන් ලබාදීම් සම්බන්ධීකරණ කටයුතු සැලසුම් හා ප්‍රගති අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතු හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය ප්‍රජාව විසින් විමසනු ලබන තොරතුරු ලබාදීමේ තොරතුරු නිලධාරී ලෙස සැලසුම් හා ප්‍රගති කොට්ඨාසයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කටයුතු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂය තුල මහජන ඉල්ලීම් හා ඒ සඳහා කටයුතු කළ ආකාරය පහත පරිදි වේ.

<u>2019 වර්ෂය</u>

මුළු ඉල්ලීම් ගණන	-	123
පිළිතුරු ලබාදුන් ගණන	-	89
අභියාචනා සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් ගණන	-	12

5. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

අයකිරීම් ක්‍රියාකාරිත්වය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර ආදායම් එකතු කිරීම්.

නිවාස ණය (උපහාර ණය හා විසිරි ණය)


2019 **(රු.මි.)**

අනු අංකය	දිස්ත්‍රික්කය / කාර්යාලය	වාර්ෂික ඉලක්ක - ණය	ණය ළභාවීම	%
1	කොළඹ නගර (උ)	31.398	14.315	46
2	කොළඹ නගර (ද)	27.348	20.175	74
3	කොළඹ දිස්ත්‍රික්	766.781	449.833	59
4	ගම්පහ	350.070	218.075	62
5	කලුතර	452.227	270.933	60
6	මහනුවර	376.130	251.944	67
7	මාතලේ	166.497	142.927	86
8	නුවරඑළිය	258.913	126.966	49
9	ගාල්ල	279.905	184.418	66
10	මාතර	237.969	191.680	81
11	හම්බන්තොට	702.997	544.455	77
12	කුරුණෑගල	399.163	299.125	75
සටහන [27] ආදායම	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.	රු.	රු.	රු.
නිවාස විකිණීම්	3,150,465.20	3,150,465.20	55,522,273.12	91,522,273.12
ඉඩම් විකිණීම්	70,085,155.01	70,085,155.01	68,329,659.84	137,679,659.84
	73,235,620.21	73,235,620.21	123,851,932.96	229,201,932.96

සටහන [28] විකුණුම් පිරිවැය

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.	රු.	රු.	රු.
නිවාස				
ආරම්භක තොගය	69,827,146.35	69,827,146.35	99,071,241.51	99,071,241.51
නොනිමි වැඩ හා අනෙකුත් ඒවායින් පැවැරුම්		-	(109,730.62)	(109,730.62)
	69,827,146.35	69,827,146.35	98,961,510.89	98,961,510.89
අවසාන තොගය	(68,751,810.35)	(68,751,810.35)	(69,827,146.35)	(69,827,146.35)
විකුණුම් පිරිවැය - ජා.නි.ස.අ.	1,075,336.00	1,075,336.00	29,134,364.54	29,134,364.54
වෙනත්	2,523.12	2,523.12		
ඕවිඩීසී	-	-	-	31,817,166.00
	1,077,859.12			
ඉඩම්				
ඉඩම් පිරිවැය -ජා.නි.ස.අ.	57,500.00	57,500.00	61,500.00	61,500.00
ඕවිඩීසී		-		51,638,471.00
මුළු විකුණුම් පිරිවැය	1,135,359.12	1,135,359.12	29,195,864.54	112,651,501.54

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
සටහන [29] වෙනත් ආදායම්	රු.	රු.	රු.	රු.
කුලී ආදායම සටහන [29] උප 1	180,103,949.76	271,168,129.76	170,536,952.53	269,587,815.53
පොළියෙන් ලත් ආදායම සටහන [29] උප 2	1,849,473,602.04	1,854,693,873.04	1,854,100,405.78	1,863,036,316.78
වෙනත් දැයෙන් ලත් ආදායම සටහන [29] උප 3	5,767,308,996.62	5,820,358,503.62	4,226,918,932.98	4,323,875,374.98
ආපසු නොගෙවන තැන්පතු සටහන [29] උප 4	515,351.75	515,351.75	2,599,750.00	2,599,750.00
	7,797,401,900.17	**7,946,735,858.17**	**6,254,156,041.29**	**6,459,099,257.29**

6,458,679,987.29

සටහන [29] උප 1 කුළී ආදායම

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.	රු.	රු.	රු.
ජා.නි.දෙ. නිවාස කුලිය	1,350,587.86	1,350,587.86	713,821.23	713,821.23
නේවාසික නිවාස	58,990,500.93	58,990,500.93	63,734,776.27	63,734,776.27
රාජ්‍ය සේවක නිල නිවාස	4,743,156.22	4,743,156.22	4,640,860.42	4,640,860.42
වාණිජ ගොඩනැගිලි	67,493,399.07	158,557,579.07	60,134,772.68	159,185,635.68
කල්බදු කුලිය	44,664,200.61	44,664,200.61	38,751,657.96	38,751,657.96
සංචාරක බංගලා කුලිය	2,862,105.07	2,862,105.07	2,561,063.97	2,561,063.97
	180,103,949.76	**271,168,129.76**	**170,536,952.53**	**269,587,815.53**

සටහන [29] උප 2 පොළී ආදායම

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		**2018**	
	රු.	රු.	රු.	රු.
ස්ථාවර තැන්පතු	-	3,745,223.00	-	4,850,204.00
ආපදා ණය	6,418,528.89	6,418,528.89	6,845,507.53	6,845,507.53
නිවාස විකුණුම් වාරික මත පොළිය	8,747,006.47	8,747,006.47	29,641,448.20	29,641,448.20
ඉඩම් විකුණුම් වාරික මත පොළිය	2,968,682.87	2,968,682.87	4,211,836.69	4,211,836.69
NHFS ණය මත පොළිය	327,462.42	327,462.42	633,181.32	633,181.32
භාණ්ඩාගාර බිල්පත් මත පොළිය	150,619,628.42	150,619,628.42	245,549,718.22	245,549,718.22
දිරිපියස යටතේ ණය මත පොළිය	528,978.56	528,978.56	858,240.96	858,240.96
ගමනැගුම වැඩසටහන මත පොළිය	5,412,900.15	5,412,900.15	12,165,165.82	12,165,165.82
ජනසෙවණ 1 12% මත පොළිය (බැංකු)	87,770,534.11	87,770,534.11	104,249,274.58	104,249,274.58
භාණ්ඩාගාර අරමුදල හා & IG ණය පොළිය 2011	193,800,616.97	193,800,616.97	251,386,287.94	251,386,287.94
ජනසෙවණ II පොළිය 10% (බැංකු)	404,137,516.17	404,137,516.17	515,690,139.72	515,690,139.72
කාර්යමණ්ඩල නිවාස ණය	11,553,466.66	11,553,466.66	8,758,656.84	8,758,656.84
ධීවර නිවාස හා වතු මත පොළිය	7,052,061.87	7,052,061.87	11,775,320.24	11,775,320.24
ණය වැඩසටහන	13,683,559.41	13,683,559.41	12,593,600.85	12,593,600.85
2015 ණය වැඩසටහන	926,213,743.35	926,213,743.35	631,421,342.71	631,421,342.71
මැදි ආදායම් නිවාස ව්‍යාපෘතියෙන් පොළිය	10,589,794.43	10,589,794.43	16,934,116.64	16,934,116.64
අනෙකුත් පොළි	19,649,121.29	19,679,182.29	1,386,567.52	1,419,852.52
ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ		1,444,987.00		4,052,422.00
	1,849,473,602.04	**1,854,693,873.04**	**1,854,100,405.78**	**1,863,036,316.78**

සටහන [29] උප 3 අනෙකුත් දැයින් ආදායම්

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.	රු.	රු.	රු.
විවිධ ආදායම්	-	130,338.00	-	194,266.00
නිවාස ණය මත සේවා ගාස්තු	213,309.91	213,309.91	699,323.25	699,323.25
නිවාස පැවැරුම් ගාස්තු	10,503,230.52	10,503,230.52	15,097,490.34	15,097,490.34
පරිපාලන වියදම්	14,196,914.99	14,196,914.99	10,587,597.82	10,587,597.82
ලේඛන, පොත් හා වෙනත් දෑ විකිණීම	2,609,925.99	2,609,925.99	1,729,616.13	1,729,616.13
අලුත්වැඩියා කළ නොහැකි අයිතම විකිණීම	828,025.92	828,025.92	218,974.36	218,974.36
පරිශ්‍රය කුලියට දීම	24,653,235.44	24,653,235.44	18,102,675.50	18,102,675.50
වාහන විකිණීම්	8,076,152.20	8,076,152.20	-	-
වාහන කුලියට දීම්	222,922.37	222,922.37	193,104.84	193,104.84
පිරියත හා යන්ත්‍රෝපකරණ කුලියට දීම්	884,061.74	884,061.74	-	-
දඩ හා අධිභාර	22,541,310.37	22,541,310.37	26,568,176.39	26,568,176.39
නිවාස හා ඉඩම් සඳහා වන්දි	-	-	87,527,000.00	87,527,000.00
හිමිකම් නොපෑ ටෙන්ඩර් තැන්පතු හා රැඳවුම් ගාස්තු	1,024,353.02	1,024,353.02	788,645.71	788,645.71
සෙවන මාධ්‍ය	14,715,263.74	14,715,263.74	13,113,060.01	13,113,060.01
ලැබුණු සෙවන ප්‍රදානය	160,972,500.00	160,972,500.00	66,738,478.64	66,738,478.64
ප්‍රදානය - සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය	178,171,480.15	178,171,480.15	281,545,936.54	281,545,936.54
කාලික වකුගඩු රෝග ප්‍රදානය ප්‍රතිශෝධිත	214,490,000.00	214,490,000.00	317,933,000.00	317,933,000.00
උතුරු පළාත් ප්‍රදාන වැඩසටහන	773,755,000.00	773,755,000.00	135,470,639.78	135,470,639.78
බෝගස්වැව ප්‍රදාන වැඩසටහන	72,495,000.00	72,495,000.00	227,770,000.00	227,770,000.00
ග්‍රාමශක්ති ප්‍රදාන වැඩසටහන	743,533,279.26	743,533,279.26	573,352,504.22	573,352,504.22
විරුසුමිතුරු ප්‍රදාන වැඩසටහන	250,788,544.00	250,788,544.00	214,251,500.00	214,251,500.00
මඩකලපුව ප්‍රදාන වැඩසටහන	218,355,000.00	218,355,000.00	50,000,000.00	50,000,000.00
කොට්යාගල ප්‍රදාන වැඩසටහන	-	-	12,813,000.00	12,813,000.00
වැලිඔය නිවාස වැඩසටහන	25,982,000.00	25,982,000.00	-	-
ආදර්ශ ගම්මාන සඳහා යටිතල පහසුකම්	977,235,644.72	977,235,644.72	184,599,910.04	184,599,910.04
ලැබුණු සෙවන අරමුදල්	13,554,702.28	13,554,702.28	3,514,726.92	3,514,726.92
විසිරි ප්‍රදාන වැඩසටහන	16,171,760.00	16,171,760.00	26,711,762.50	26,711,762.50
උතුර හා නැගෙනහිර නව ප්‍රදාන වැඩසටහන 2018	1,185,564,520.00	1,185,564,520.00	1,954,420,610.46	1,954,420,610.46
සම්පත් පියස ප්‍රදාන වැඩසටහන	8,607,434.00	8,607,434.00	1,416,021.50	1,416,021.50
ගංචතුර සහස සඳහා ප්‍රදානය	820,400,000.00	820,400,000.00	-	-
ලෙජර් වත්ත හා නාරංගල නිවාස ව්‍යාපෘතිය සඳහා යටිතල පහ	6,458,055.00	6,458,055.00	-	-
ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය	212,371.00	212,371.00	-	-
ඉඩම් වන්දි මත පොළිය	-	-	1,564,678.03	1,564,678.03
උපදේශන ගාස්තු හා වෙනත්	93,000.00	93,000.00	137,500.00	137,500.00
අධිප්‍රතිපාදනය වන්දි (නෛතික)	-	-	53,000.00	53,000.00
නෛතික ගාස්තු	-	939,584.00	-	722,132.00
ඇන්ටෙනා ආදායම	-	26,953,881.00	-	26,610,753.00
රථවාහන ගාල්කිරීමේ ආදායම	-	183,300.00	-	183,600.00
උපකරණ කාමර ආදායම	-	1,726,531.00	-	1,494,560.00
සේවා ගාස්තු	-	5,106,997.00	-	5,807,317.00
භාණ්ඩාගාර බිල්පත් ආයෝජන මත සාධාරණ වටිනාකම් ලාභ	-	139.00	-	-
ආයෝජන දේපළේ සාධාරණ වටිනාකමේ වැඩිවීම	-	8,846,243.00	-	60,647,263.00
දේපළ, පිරියත හා උපකරණ අපහරණය මත ලාභ		9,156,235.00	-	-
හානිකරණ ප්‍රතිපාදනයේ ප්‍රතිවර්තනය	-	-	-	877,281.00
විශ්‍රාම ප්‍රතිලාභ නැවැත මැණීමට අදාළ විලම්බිත බදු	-	6,259.00	-	-
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත නැවැත මැණීමේ (අලාභය)/ලාභය	-	-	-	419,270.00
	5,767,308,996.62	**5,820,358,503.62**	**4,226,918,932.98**	**4,323,875,374.98**

සටහන [29] උප 4 ආපසු නොගෙවන තැන්පතු

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ
	2019		2018	
	රු.	රු.	රු.	රු.
ටෙන්ඩර් තැන්පතු	505,351.75	505,351.75	2,584,750.00	2,584,750.00
ආපසු නොගෙවන තැන්පතු - නාගරික නිවාස වාණිජ ගොඩන	10,000.00	10,000.00	15,000.00	15,000.00
	515,351.75	**515,351.75**	**2,599,750.00**	**2,599,750.00**

සටහන [30] ආයතනික හා පරිපාලන වියදම්

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	Rs.	Rs.	Rs.	Rs.
අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	611,000.00	611,000.00	227,400.00	227,400.00
වැටුප් හා වේතන	1,530,626,104.12	1,590,460,279.12	792,112,221.58	846,271,831.58
ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පාරිශ්‍රමිකය	2,107,000.00	2,107,000.00	2,080,142.54	7,332,530.54
අතිකාල	103,302,016.37	103,302,016.37	64,445,934.34	64,445,934.34
වෙනත් දීමනා	88,368,405.44	88,368,405.44	447,941,276.89	447,941,276.89
ජීවන වියදම් දීමනා	389,161,029.79	389,161,029.79	219,522,480.12	219,522,480.12
දිරි දීමනා ගෙවීම්	33,200,104.63	33,200,104.63	39,612,435.44	39,612,435.44
ප්‍රසාද දීමනා	4,315,969.56	4,315,969.56	11,491,316.61	11,491,316.61
දිරිදීමනා ගෙවීම් - ප්‍රසාද දීමනා	1,815,699.87	1,815,699.87	11,874,546.86	11,874,546.86
සේ.අ.අ. දායක මුදල්	235,508,133.04	239,585,441.04	135,433,015.16	139,542,019.16
සේ.හා.අ. දායක මුදල්	59,644,632.70	60,460,094.70	34,440,295.16	35,262,096.16
වන්දි	2,080,012.00	2,080,012.00	176,232.50	176,232.50
නිවාඩු දින සඳහා ගෙවීම	34,554,115.31	34,554,115.31	22,046,359.51	22,046,359.51
පුහුණු හා ශිෂ්‍යත්ව	1,198,353.40	1,198,353.40	5,044,989.91	5,044,989.91
විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම	23,464,836.07	23,464,836.07	20,602,821.22	20,602,821.22
සාමාජික ගාස්තු ප්‍රතිපූරණය	64,467.00	64,467.00	33,592.00	33,592.00
කාර්යමණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය	30,569,108.41	30,569,108.41	32,891,601.67	32,891,601.67
වෛද්‍ය වාර්තා ගාස්තු	37,227.00	37,227.00	58,732.50	58,732.50
පාරිතෝෂික ප්‍රතිපාදනය	109,044,858.93	110,560,092.93	-	1,393,791.00
භාණ්ඩ සමීක්ෂණය සඳහා දීමනාව	1,218,910.00	1,218,910.00	154,500.00	154,500.00
ගමන් වියදම් -දේශීය	83,174,569.06	85,461,333.06	56,030,282.50	58,076,797.50
ගමන් ගාස්තු - විදේශීය	1,339,871.01	1,339,871.01	2,100,322.81	2,100,322.81
ආරක්ෂක සේවා සඳහා ගෙවීම	22,006,822.19	22,006,822.19	11,522,500.73	11,522,500.73
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	57,839,027.73	66,695,249.73	50,174,342.96	60,105,560.96
රථවාහන සඳහා ඉන්ධන	47,874,357.03	47,874,357.03	48,442,658.76	48,442,658.76
ප්‍රවාහන හා යන්ත්‍රෝපකරණ හා උපකරණ කුලියට දීම	3,477,332.00	3,477,332.00	1,512,062.00	1,512,062.00
සෞඛ්‍ය, සනීපාරක්ෂක හා අනෙකුත් සේවා	4,235,846.17	4,235,846.17	3,492,704.05	3,492,704.05
මුද්‍රණ ගාස්තු	54,478,058.81	54,478,058.81	37,887,970.38	37,887,970.38
පුවත්පත් හා වාර ප්‍රකාශන	1,246,660.12	1,246,660.12	1,365,428.90	1,365,428.90
නිල ඇඳුම්	997,262.50	997,262.50	1,155,714.32	1,155,714.32
සේවා- තේ සැපයීම් සේවක සුබසාධනය	7,318,303.83	7,318,303.83	7,556,435.07	7,556,435.07
සුබසාධනය	16,595,621.03	16,595,621.03	9,639,013.10	9,639,013.10
නාම පුවරු	62,859,625.75	62,859,625.75	35,453,644.00	35,453,644.00
නඩත්තුව - ගොඩනැගිලි හා ව්‍යුහ	12,767,460.30	29,079,367.30	14,079,315.21	28,775,904.21
පිරියක, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් උපක	10,588,490.91	14,649,830.91	10,368,936.51	13,155,701.51
රථ වාහන	18,648,659.21	18,648,659.21	20,471,836.06	20,471,836.06
ලි බඩු	81,883.50	81,883.50	130,613.00	130,613.00
නිවාස යෝජනා ක්‍රමය	6,376,863.73	6,376,863.73	9,087,016.95	9,087,016.95
සංවාරක බංගලා වියදම්	1,787,490.99	1,787,490.99	1,712,793.12	1,712,793.12
සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය	178,171,480.15	178,171,480.15	281,545,936.54	281,545,936.54
ටෙන්ඩර් ලේඛන ගාස්තු	-	-	1,000.00	1,000.00
රථවාහන කුලියට දීම්	77,384,590.56	77,384,590.56	82,456,124.49	82,456,124.49
දුරකථන	16,367,341.36	16,367,341.36	18,564,696.29	18,564,696.29
විදුලිය	17,785,639.74	17,785,639.74	17,031,656.86	17,031,656.86
ජලය	3,934,105.76	3,934,105.76	3,785,326.77	3,785,326.77
කාර්යාල ගොඩනැගිලි සඳහා කුලී	4,527,231.47	4,527,231.47	4,450,771.40	4,450,771.40
වරිපනම්	8,343,604.20	8,343,604.20	8,502,364.23	8,502,364.23
වෙළඳ ප්‍රචාරණය	3,761,020.83	3,761,020.83	2,012,415.78	2,012,415.78
නෛතික ගාස්තු	19,197,958.89	22,497,785.89	4,880,299.76	6,595,355.76
තැපැල්	10,716,316.09	10,716,316.09	13,247,611.45	13,247,611.45
රක්ෂණ	3,998,989.06	5,482,847.06	5,273,589.95	6,380,720.95
බලපත්‍ර ගාස්තු	575,560.00	575,560.00	529,992.86	529,992.86
තොරතුරු හා ප්‍රචාරණය	188,669,767.88	188,669,767.88	150,609,035.32	150,609,035.32
දඩ හා අධිභාර	-	-	203,669.00	203,669.00
පරිපාලන වියදම්	-	9,356,401.00	-	4,563,006.00
	3,598,019,795.50	**3,709,918,293.50**	**2,755,467,975.14**	**2,858,050,849.14**

සටහන [31] මූල්‍ය වියදම්

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.		රු.	
බැංකු ගාස්තු	2,688,473.59	5,366,606.59	2,064,607.57	2,601,960.57
කුලී නිවැසියන් සඳහා ප්‍රතිදානය	1,154,309.55	1,154,309.55	1,623,352.06	1,623,352.06
පොළී ගෙවීම - දිරිපියස ණය මත වාණිජ බැංකු	40,795.26	40,795.26	525,523.91	525,523.91
පොළී ගෙවීම් වැංකු ණය උපහාර	544,177,246.22	544,177,246.22	691,291,931.25	691,291,931.25
පොළී ගෙවීම් අනෙකුත් ණය	3,195,866.76	3,221,017.76	1,223,176.89	2,060,171.89
ආර්ථික සේවා ගාස්තු (බද්ද)	6,219,531.59	6,219,531.59	5,392,113.53	5,392,113.53
අගය එකතුකළ බද්ද	1,953,562.19	1,953,562.19	8,758,710.23	8,758,710.23
ලාභ හා අලාභ හරහා වටිනාකම	-	-	-	2,342.00
කල්බදු මත පොළිය	-	713,632.00	-	816,871.00
ආදායම් බදු ණය / (වියදම්)	-	3,004,957.00	-	18,699,614.00
හිමිකරු පදිංචි දේපළ මත ප්‍රත්‍යාගණන අලාභය	-	1,800,000.00	-	350,000.00
නිර්වචිත ප්‍රතිලාභ බැරකම මත නැවත මැණීම් (අලාභය)/ලාබය	-	22,352.00	-	-
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මැණීම් ආශ්‍රිත විලම්බිත බදු	-	-	-	117,396.00
	559,429,785.16	**567,674,010.16**	**710,879,415.44**	**732,239,986.44**

සටහන [32] අනෙකුත් වියදම්

	ජා.නි.ස.අ.	ඒකාබද්ධ	ජා.නි.ස.අ.	ඒකාබද්ධ නැවත ප්‍රකාශිත
	2019		2018	
	රු.	රු.	රු.	රු.
ජංගම කාර්යාල වියදම්	2,315,904.25	2,315,904.25	1,160,409.50	1,160,409.50
විගණන ගාස්තු	2,500,000.00	3,004,000.00	3,405,716.00	3,855,716.00
මුද්දර බදු	354,076.13	354,076.13	570,275.99	570,275.99
මැනීම් වියදම් /තක්සේරුව	20,284,933.02	20,284,933.02	3,065,150.99	3,065,150.99
රඳවාගැනීමේ බද්ද හා වෙනත්	14,393,659.94	14,393,659.94	36,210,707.76	36,210,707.76
ජා.ගො.බ.	1,316,117.15	3,562,990.15	1,925,582.43	4,551,854.43
CHP සමාලෝචන මණ්ඩල වියදම්	527,000.00	527,000.00	1,032,500.00	1,032,500.00
උපදේශන ගාස්තු	-	-	25,000.00	25,000.00
දිස්ත්‍රික් නිවාස කමිටු වියදම්	1,831,235.00	1,831,235.00	3,077,907.00	3,077,907.00
ප්‍රදර්ශන සඳහා වියදම්	7,107,821.32	7,107,821.32	2,969,049.05	2,969,049.05
මහජන උත්සව ක්‍රියාකාරකම්	129,240,743.39	129,240,743.39	63,593,444.17	63,593,444.17
අනවසර කුලී නිවැසියන් ඉවත්කිරීම	144,611.00	144,611.00	31,640.00	31,640.00
ආදර්ශ ගම්මාන සඳහා යටිතල පහසුකම්	977,235,644.72	977,235,644.72	184,599,910.04	184,599,910.04
බොල් හා අඩමාණ ණය	455,747,610.07	466,108,529.07	-	-
අනෙකුත් වැඩසටහන් සඳහා යටිතල පහසුකම්	57,314,384.07	57,314,384.07	21,421,473.04	21,421,473.04
ගෙවනු ලැබූ කොමිස් මුදල් - ණය එකතු කිරීම	135,571,878.64	135,571,878.64	135,435,261.78	135,435,261.78
ගෙවනු ලැබූ කොමිස් මුදල් - කුලී එකතු කිරීම	3,908,388.84	3,908,388.84	6,222,410.52	6,222,410.52
සෙවන ප්‍රදාන වියදම්	33,117,500.00	33,117,500.00	70,253,205.56	70,253,205.56
කාලික වකුගඩු රෝග ප්‍රදාන වැඩසටහන	214,490,000.00	214,490,000.00	317,933,000.00	317,933,000.00
උතුරු පළාත් ප්‍රදාන වැඩසටහන	825,805,000.00	825,805,000.00	135,476,639.78	135,476,639.78
බෝගස්වැව ප්‍රදාන වැඩසටහන	72,495,000.00	72,495,000.00	227,770,000.00	227,770,000.00
ග්‍රාමශක්ති ප්‍රදාන වැඩසටහන	743,533,279.26	743,533,279.26	573,352,504.22	573,352,504.22
විරුසුමිකුරු ප්‍රදාන වැඩසටහන	250,788,544.00	250,788,544.00	214,251,500.00	214,251,500.00
මඩකලපු ප්‍රදාන වැඩසටහන	218,355,000.00	218,355,000.00	50,000,000.00	50,000,000.00
ගංචතුර සහන සඳහා ප්‍රදානය	869,500,000.00	869,500,000.00	-	-
කොටියාගල ප්‍රදාන වැඩසටහන	-	-	12,813,000.00	12,813,000.00
වැලිඔය නිවාස වැඩසටහන	25,982,000.00	25,982,000.00	-	-
විසිරි ප්‍රදාන වැඩසටහන	16,171,760.00	16,171,760.00	26,711,762.50	26,711,762.50
උතුර හා නැගෙනහිර නව ප්‍රදාන වැඩසටහන -2018	1,212,269,520.00	1,212,269,520.00	1,954,420,610.46	1,954,420,610.46
සම්පත් පියස ප්‍රදාන වැඩසටහන	8,607,434.00	8,607,434.00	1,416,021.50	1,416,021.50
වන්දි ප්‍රතිපාදනය (නෛතික)	356,670,620.85	356,670,620.85	-	-
ලෙජර් වත්ත හා නාරංගල නිවාස ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම්	6,458,055.00	6,458,055.00	-	-
ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය	212,371.00	212,371.00	-	-
ස්ථාවර වත්කම් හානිකරණය	59,587,578.34	69,556,609.34	57,144,358.38	66,604,219.38
විකුණුම් කොමිස් මුදල්	-	-	-	1,000,000.00
සෙවර අරමුදල් වියදම්	13,554,702.28	13,554,702.28	860,845.42	860,845.42
	6,737,392,372.27	**6,760,473,195.27**	**4,107,149,886.09**	**4,120,686,019.09**

2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා හිමිකාරත්වය වෙනස්වීමේ ප්‍රකාශනය

රු. මිලියන

	ප්‍රාග්ධනය	ප්‍රාග්ධනය සංචිත	සමුච්චිත අතිරික්තය/ හිඟය	එකතුව	සුළු කොටස්කරුවන්ගේ හිමිකම ඕවිඩිසි
	40.000	32,515.869	(12,693.039)	19,862.830	1,047.360
2018 සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීම්		4,663.050		4,663.050	
කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය			(999.356)	(999.356)	
			61.096	61.096	47.020
			0.452	0.452	0.196
සුළු කොටස්හිමියන්ගේ හිමිකම ඕවිඩිසි			0.069	0.069	0.030
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	40.000	37,178.919	(13,630.778)	23,588.141	1,094.606
ඕවිඩිසි හි විගණිත ගිණුම්වල වෙනස්කම්			(10.784)	(10.784)	(8.269)
2018 දෙසැම්බර් 31 දිනට නැවැත ප්‍රකාශිත ශේෂය	40.000	37,178.919	(13,641.562)	23,577.357	1,086.337
පෙර වසර සඳහා ගැලපුම් (ඕවිඩිසි)				-	
2019 ජනවාරි 01 දිනට ශේෂය	40.000	37,178.919	(13,641.562)	23,577.357	1,086.337
2019 සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීම්		5,910.876		5,910.876	
කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය			(3,025.340)	(3,025.340)	
කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය ඕවිඩිසි			3.458	3.458	2.652
				-	
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	40.000	43,089.795	(16,663.443)	26,466.352	1,088.989

පාතක වගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එවියුඩි/ඒ/එන්එවඩිඒ/01/19/07

මගේ අංකය / எனது இல. / Your No.

දිනය / திகதி / Date: 2021 ජනවාරි 15 දින

සභාපති කාර්යාලය
21 JAN 2021
ජා.නි.සං. අධිකාරිය
762

සභාපති

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 1. ලේකම්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එවියුඩි/ඒ/එන්එච්ඩීඒ/01/19/07 | ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජනවාරි 15 දින

සභාපති

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාඛ්‍යානය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 49.73 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවත් එම සමාගම ආශ්‍රිත සමාගමක් ලෙස සලකා ගිණුම් පිළියෙල කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණු අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම වූ සීමාසහිත ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි මාසය දක්වා විගණනයට ලබාදී නොතිබුණු බැවින් එම සමාගමේ විගණනය නොකල මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) අධිකාරිය විසින් නුවමාරු නොවන ගනුදෙනුවක් යටතේ 1987 හා 1988 වර්ෂවල අත්පත් කරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්වස් 170.56 ක ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,520ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 27 හා 47 ඡේදය ප්‍රකාරව සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 65 ඡේදය අනුව " වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් වාර්ෂිකව වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කර කලින් සිදුකර තිබුණු ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ගිණුම් ගතකල යුතුය. එසේ වුවත් 1985 වර්ෂයේ සිට මිලදී ගත් පිරිවැය රු.මිලියන .251.72 ක ක්ෂය කර අවසන් වාහන 136 ක් පිළිබඳව එසේ ගැලපීම් කර නොතිබුණු අතර දැනට එයින් වාහන 98 ක් භාවිතයේ පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබන තොගයෙහි අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වෙළඳ තොගයේ ඇතුළත් පාර්ක්රෝඩ් කඩසාප්පු 08 ක් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය වූ රු.මිලියන 6.1 කට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම රු. මිලියන 62.65 ක් වූ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කර තිබුණු නිවාස හා කඩසාප්පු 35 ක එම ශුද්ධ උපලබ්ධි අගය ගණනය කල ආකාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2014 හා 2016 වර්ෂයන්හි වාහන අපහරණය සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී අදාල අගයන් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම් තැබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව ගලපා නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. මිලියන 1.41 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) අධිකාරියේ ඉඩම්වල වටිනාකම රු.මිලියන 55.3 ක් ලෙස හඳුනාගෙන තිබුණද වර්ග ප්‍රමාණය දක්වා නොතිබුණු කාර්යාල හා කුලී ගොඩනැගිලි පිහිටි ඉඩම් කොටස් 112 ක් හා නිවාස යෝජනා ක්‍රම වලින් ඉතිරිවූ ඉඩම් හෙක්ටයාර් 437.7 ක් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) 1981 සිට 1995 දක්වා අධිකාරියට විදේශ ආධාර ලෙස ලැබී තිබුණු එකතුව රු. මිලියන 131.68 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ප්‍රදානයන්ට අදාල වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර ප්‍රදාන වලින් නියෝජනය වන වත්කම් ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි. එසේම වර්ෂ 05 කට වැඩි කාලයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේශීයව ලැබුණු ප්‍රදාන ලෙස සටහන් කර ඇති රු. මිලියන 637.33 ක ශේෂය හා 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාල 09 ක අනෙකුත් ප්‍රදාන ශේෂය වූ රු.මිලියන 27.19 හඳුනා ගැනීමට අවශ්‍ය විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවිය.

(උ) සේවණ අරමුදල සඳහා මහාභාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් පාර්ශවයන්ගෙන් ලද මුළු අරමුදල් වලින් 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 978.82 ක් වූ අතර සෙවණ අරමුදල වෙනුවෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ එදිනට ශේෂය රු.281,943 ක් විය. ඒ අනුව රු. මිලියන 978.53 ක්වූ අරමුදලේ ආයෝජන සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. එසේම සෙවණ අත්වැල අනුව අරමුදලේ මුදල් ආයෝජනය කර එම ආදායම් අරමුදලට බැර කලයුතු වුවද ආයෝජන ආදායම් අදාල අරමුදල් ගිණුම්වලට බැරවී තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය විසින් ලබාගත් මුළු ණය වටිනාකම රු.මිලියන 4,147.04 ක් වූ අතර, රු.මිලියන 316.52 ක ණය ශේෂයන් සඳහා ශේෂ සනාථන විගණනයට ලැබී නොතිබුණි. එසේම වෙනත් ආයතන වලින් ලැබෙන ප්‍රදාන ලෙස රු. මිලියන 572.24 ක ආරම්භක ශේෂයක් 2010 වර්ෂයට පෙර සිට පැවතුණද එම ශේෂය හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(එ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ "වෙනත් ලැබිය යුතු ශේෂය" තුල ඇතුළත් එකතුව රු.මිලියන 41.5 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඒ) 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියේ නිවාස සංකීර්ණ, ගොඩනැගිලි කුලී හෝ බදු පදනම මත රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත ලබාදී රු. මිලියන 177.24 ක ආදායම් උපයා තිබුණද ඒ සම්බන්ධ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඔ) 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ රු.මිලියන 1,396.58 ක ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 35.18 ක් ක්ෂය ලෙස ගිණුම්ගත කර තිබුණද එම ගොඩනැගිලි ජංගම නොවන වත්කම් ලෙස හඳුනාගත් කාලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකිවූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ), (ආ), (ඇ) හා (ඉ) ඡේදවල සඳහන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනු ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය	එකතුව රු.මිලියන 1,514.6 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII හි 13:2 හා 22:1:1 ඡේදයන්හි සංශෝධන හා 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ I හා III ඡේද	මූලික විමර්ශනයක් මාස 02 කින්ද චෝදනා පත්‍රයක් සහිත විනය පරීක්ෂණයක් මාස 06 කින්ද අවසන් කල යුතු වුවද අධිකාරියේ පැවති මාස 06 සිට මාස 56 ක් දක්වා කාලය ඉකුත්වූ විනය විමර්ශන කටයුතු 14 ක් ද විමර්ශන කාලය හදුනාගත නොහැකි විමර්ශන කටයුතු 13 ක් ද අධිකරණ වල නඩු කටයුතු අවසන් නොවූ විමර්ශන 03 ක් ද 2020 ජූනි 30 දක්වා අවසන් කර නොතිබුණි. තවද චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට වසරකට වැඩි කාලයක් ගතවී තිබූ හා එම චෝදනා පත්‍රය සංශෝධනය කිරීමට තවත් වසරක් ආසන්න කාලයක් ගතවී තිබූ අවස්ථාද විය.
(ඇ) ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 3.1 ඡේදය	සමාලෝචිත වර්ෂය තුලදී කොන්ත්‍රාත් පදනම මත අධිකාරියේ සේවය කල ඉංජිනේරුවරයෙකු හා ගෘහනිර්මාණ ශිල්පියෙකු සඳහා දින 12 ක විදේශ පුහුණුවක් ලබාදී තිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 90 ඡේදය	අධිකාරියේ නව පත්වීම් ලබාදීම, තනතුරු භාර ගැනීම සම්බන්ධ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි අංක 169(2) හා 188 (2)	අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 10 ක ගිණුම් 13 ක මාස 01 සිට අවුරුදු 02 කට වැඩි කාලයක් ගතවී තිබුණු තැම්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ගණන 234 ක් වූ අතර ඒ වටිනාකම රු.මිලියන 9.98 ක් විය.

(ii)	මු.රෙ.371 (2) හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 හි "ආ" ඡේදය	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදිය යුතු වුවද දිස්ත්‍රික් කාර්යාල 04 ක් විසින් මාණ්ඩලික නොවන නිලධාරීන් 36 දෙනෙකු වෙත එකතුව රු.මිලියන 1.6 ක අත්තිකාරම් ලබාදී තිබුණු අතර නිලධාරීන් 08 දෙනෙකු වෙත රු.100,000 ඉක්මවා එකතුව රු.මිලියන 1.16 ක අත්තිකාරම් ලබාදී තිබුණි.
(iii)	මු.රෙ.371 (5) හා යටෝක්ත චක්‍රලේඛයේ "ඇ" ඡේදය	අතුරු අග්‍රිමයක් අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවත් අවස්ථා 74 කදී ලබාගත් එකතුව රු.මිලියන 3.67 ක අත්තිකාරම් පියවීමට මාස 01 සිට වසර 03 දක්වා කාලයක් ගතවී තිබුණි.
(iv)	මු.රෙ. 396	අධිකාරිය සතු බැංකු ගිණුම් 25 ක නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ට වැඩි වෙක්පත් 140 ක්ද අවුරුදු 01 ට වැඩි වෙක්පත් 28 ක් ද සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර එහි වටිනාකම පිළිවෙලින් රු.මිලියන 4.89 ක් හා රු.667,455 ක් විය.
(ඊ)	2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය	අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය	අධිකාරිය විසින් වසර 03 ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් යාවත්කාලීනව සකස් කර නොතිබුණි.
(ඌ)	2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය --- (i) 9.4 ඡේදය	කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන වෙත නිලධාරීන් හා සේවකයින් 39 දෙනෙකු මුදාහැර නිවාස සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 14.84 ක් ගෙවීම් කර තිබුණි.

(i) 9.5.1 ඡේදය	අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 1.19 ක පුහුණු හා ශිෂ්‍යත්ව ව්‍යාපෘතියක් දරා තිබූ නමුත් පුහුණු අවශ්‍යතා සකස් කර නොතිබුණි.
(ඇ) 2013 ජනවාරි 15 දිනැති අංක 1/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2018 දෙසැම්බර් 19 දිනැති නිවාස් හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ අංක 2/1/176/23 ලිපිය	අධිකාරියේ සේවය කල නිලධාරීන් හා සේවකයන් 44 දෙනෙකු වෙත 2017, 2018 හා 2019 වර්ෂයන්හි වසර 60 ඉක්මවා සේවා දිගු, සේවා ගිවිසුම් හා කොන්ත්‍රාත් පදනමින් පත්වීම් ලබාදී තිබුණි. එයින් නිලධාරීන් හා සේවකයින් 41 දෙනෙකු වෙත 2019 වර්ෂයේදී පමණක් අධිකාරිය විසින් රු. මිලියන 28.64 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.
(ඈ) 1997 සැප්තැම්බර් මස 24 දිනැති අංක 04/97/06 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.4 ඡේදය	ලබාගත් අත්තිකාරම් මුදලක් පියවීමට පෙර නැවත අත්තිකාරම් නිකුත් නොකල යුතු වුවද නියැදි පරීක්ෂාවේදී දිස්ත්‍රික් කාර්යාල 02 ක අවස්ථා 08 කදී කලින් ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර එකතුව රු.718,000 ක අත්තිකාරම් නැවත නිකුත් කර තිබුණි. එසේම එකම නිලධාරියා වෙත එකම දිනයකදී අත්තිකාරම් එකකට වඩා වැඩියෙන්ද නිකුත් කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

වෙනත් විගණන නිරීක්ෂණ

(අ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සමස්ථ ණයගැති ශේෂය (අඩමාණ ණය වෙන්කිරීමට පෙර) රු.මිලියන 5,762.62ක් විය. එම ණය ශේෂය තුළ වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු ණය ශේෂවල එකතුව රු.මිලියන 2,881.9 ක් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 50 ක් විය. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුළුණය හා අත්තිකාරම් ශේෂය රු.මිලියන 153.3 ක් වූ අතර, එයින් වර්ෂ 05 ට වැඩි අයනොවී පවතින ශේෂය රු.මිලියන 5.9 ක් වුවද එම සේවකයන් සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) අධිකාරිය විසින් 2019 වර්ෂයේදී රු.මිලියන 13,387 ක වියදමින් නිවාස හා යටිතල පහසුකම් සැපයීමේ ණය හා ආධාර ලෙස නව ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් රු. මිලියන 4,539 ක් වූ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ඇ) ආරම්භ කල ව්‍යාපෘති 09 ක නිවාස ඒකක 17,550 ක් සඳහා ණය හා ආධාර ලබාදී නිවාස නිම කිරීමට සැලසුම් කලද නිම කිරීමේ ප්‍රගතිය සියයට 01 සිට සියයට 33 ක් දක්වා විහිදී තිබුණි. එසේ වුවද සැලසුම් කල වියදමින් සියයට 89 ක් වියදම් වී තිබුණි.

(ඉ) 2019 වර්ෂයේදී හොරණ, වැලිඔය (විශේෂ) සහ දකුණු හා උතුරු පළාත් ඉන්දියානු ආධාර නිවාස ව්‍යාපෘතිවල රු.මිලියන 688 ක ණය හා ආධාර මගින් නිවාස ඒකක 1,486 ක වැඩ නිමකිරීමට ඇස්තමේන්තු කලද එකඳු නිවසක හෝ ඉදිකිරීම් නිමකිරීමට නොහැකි වී තිබුණි. ඒ සඳහා රු.මිලියන 126 ක් වියදම් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට සම්පත් සෙවණ නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 2,000 ක වැඩ ආරම්භ කිරීමට හා සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද නිවාස ඒකක 356 ක වැඩ ආරම්භ කිරීමට ණය හා ආධාර ලබාදී තිබුණු අතර නිවාස ඒකක 64 ක පමණක් වැඩ නිමකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කිරීමට ඉලක්ක ගතකල නිවාස ඒකක ගණන 24,692 ක් වුවද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා නිවාස ඒකක 16,698 ක් සඳහා ණය හා ආධාර ලබාදී තිබුණු බැවින් වැඩ නිම කිරීම සඳහා අවසාන ණය හා ආධාර අදියරයන් ලබාදීමට හැකිවී තිබුණේ ඒකක 3,355 ක් සඳහා පමණි. එසේම රු.මිලියන 2,260 ක් වියදම් කිරීමට සැලසුම් කලද රු.මිලියන 3,073 ක් එම ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කර තිබුණි.

(උ) නිවාස ව්‍යාපෘතිවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පාලම් 10 ක් ඉදිකිරීමට හා ප්‍රජා ජල ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ එකතුව රු.මිලියන 120 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 39 හා සියයට 24 ක් විය. එසේ වුවද වර්ෂය අවසානයට එහි ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.මිලියන 43 ක් වියදම් කර තිබුණි.

(ඌ) අධිකාරිය වෙත ලැබෙන වෙනත් අරමුදල් මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති 03 ක් සඳහා රු.මිලියන 612.5 ක් වියදම් කිරීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 82.82 ක් වියදම් කර තිබුණු අතර එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේම වෙනත් අරමුදල් මගින් වියදම් කිරීමට සැලසුම් කර නොතිබුණු සොඳුරු පියස වැඩ සටහන වෙනුවෙන් එම අරමුදල් මගින් රු.මිලියන 999.8 ක්ද වියදම් කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපල 145 ක නිවාස ඒකක 4,054 ක් සඳහා ඔප්පු නිකුත් කර නොතිබුණු අතර ඒ තුල ඇති දේපල 81 ක ඒකක 1,913 ක ඉඩම් අධිකාරියට පවරා ගෙන නොතිබුණි. අධිකාරිය වෙත දේපල පවරා ගෙන තිබුණු නමුත් සහාධිපත්‍ය පිඹුර සකස් නොකිරීම, සහාධිපත්‍ය ප්‍රකාශන සකස් නොකිරීම හා සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචිය සිදු නොකිරීම ආදී හේතූන් මත සහාධිපත්‍ය දේපල 63 ක් එනම් ඒකක 1,821 ක් සඳහා ඔප්පු ලබාදී නොතිබුණි. එසේම දේපළ 02 ක ඒකක 272 ක් සඳහා සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචිකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඔප්පු නිකුත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කුලී සින්නක්කර ක්‍රමයට නිවාස ලබාදුන් ප්‍රතිලාභීන් 3,000 ක් වෙනද ඔප්පු නිකුත් කිරීමට සැලසුම් කලද බදු ඔප්පු 64 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඒ) අධිකාරිය විසින් සකස් කල ආදර්ශ ගම්මාන පිළිබඳ පසු විපරම් වාර්තාව (2019 නොවැම්බර්) අනුව ප්‍රතිලාභීන් 10,117 කින් ප්‍රතිලාභීන් 805 ක් වන අලි තර්ජන, පොදු පහසුකම් නොමැතිවීම, හා වෙනත් හේතු මත ඉදිකරන ලද නිවාසවල පදිංචි වී නොතිබුණු අතර වෙනත් නිවසක් තිබීම හා ආදර්ශ ගම්මානවල නිවාස විකිණීම මත ප්‍රතිලාභීන් 183 ක් අදාල නිවාසවල පදිංචි වී නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

(ඔ) ආදර්ශ ගම්මාන ක්‍රියාත්මක කිරීමේ අත්වැලේ 05 ඡේදය ප්‍රකාරව පළමු ණය වාරිකය ලබාදී මාස 06 ක් ඉක්මයාම හෝ අවසාන වාරිකය ලබා දීමෙන් පසුව එළඹෙන පළමු මාසය යන කරුණු දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේ සිට ණය මුදල් ආපසු අයකිරීම ආරම්භ කල යුතු වුවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. මිලියන 25.3 ක ණය ලබාදුන් ප්‍රතිලාභීන් 66 දෙනෙකුගෙන් එක් වාරිකයක් හෝ ආපසු අයකර නොමැති අවස්ථා විගණනයේදී නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂණය අනුව දිස්ත්‍රික්ක 05 ක ගම්මාන 50 ක ප්‍රතිලාභීන් 1,460 කට ලබාදී තිබූ රු.මිලියන 493.77 ක් වූ මුළු ණය ප්‍රමාණයෙන් වාරික 03 ට වැඩි හිඟ ණය ප්‍රමාණය රු.මිලියන 39.39 ක් විය.

(ඕ) 2015 නොවැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා ආදර්ශ ගම්මාන සඳහා මුල්ගල් තැබීමේ හා විවෘත කිරීමේ උත්සවයන්හි ප්‍රචාරක කටයුතු වෙනුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා ප්‍රධාන කාර්යාලය විසින් එකතුව රු.මිලියන 461.71 ක් වියදම්කර තිබුණු අතර එම වියදම් වලට අමතරව ආදර්ශ ගම්මානවල විවෘත කිරීමේ උත්සව සඳහා තවත් රු. මිලියන 353.64 ක් ද වැයකර තිබුණි. එසේම විගණනය විසින් කරන ලද නියැදි පරීක්ෂාවට අනුව දිස්ත්‍රික් කාර්යාල 05 ක් මගින්ද මුල්ගල තැබීම, ගම්මාන විවෘත කිරීමේ උත්සව කටයුතු හා ශිලා ඵලක සඳහා 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 20.51 ක් වියදම් කර තිබුණු බවද නිරීක්ෂණය විය.

(ක) නියැදි විගණන පරීක්ෂාව අනුව දිස්ත්‍රික් කාර්යාලවලට ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් නොලැබීම හා ලබාගත් ණය අදියරයන්ට අදාලව ඉදිකිරීම් සිදුකර නොතිබීම ආදී හේතූන් මත කුරුණෑගල, මොණරාගල හා මුලතිව් දිස්ත්‍රික්කයන්හි ආරම්භ කල පිළිවෙලින් ගම්මාන 86 ක, 56 ක හා 10 ක ඉදිකිරීම් අතරමග නවතා තිබූ බව නිරීක්ෂණය විය. එසේම වර්ෂයකට වැඩි කාලයක් මුළුල්ලේ

මුල්ගල් පමණක් තබා තිබුණු ආදර්ශ ගම්මාන 11 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂාවේදී නහවුරු විය.

(ග) අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව සමඟ සසඳා බැලීමේදී තනතුරු 05 ක පුරප්පාඩු 96 ක්ද තනතුරු 07 ක අතිරික්තතා 515 ක්ද විගණනයේදී නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ කොන්ත්‍රාත් පදනම මත අනුමත කාර්ය මණ්ඩලය 1,486 ක් වුවද සේවකයින් 1,685 ක් බඳවාගෙන තිබුණු අතර අධිකාරිය ඔවුන් වෙත රු. මිලියන 608.71 ක දීමනා ගෙවීම් කර තිබුණි.

(ච) නිවාස සංවර්ධන අධිකාරිය සතු යාබද ඉඩම් හා හිස් ඉඩම් වල මැනුම් කටයුතු හා තක්සේරු කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව සිදුකර අධිකාරියට හිමි ඉඩම් විධිමත්ව හඳුනාගෙන එම ඉඩම් ඵලදායී කාර්යයක යෙදවීමට හෝ බැහැර කිරීමට නොහැකිවීම තුලින් අධිකාරියට උපයාගත හැකි ආදායම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඡ) බාහිර පාර්ශවයන් විසින් ඉඩම් හා නිවාස පැවරීම, නිවාස ඉදිකිරීම, පාරිතෝෂික ගෙවීම් හා සේවා සේවක හිඟවළු හේතුවෙන් එකතුව රු.මිලියන 3,618.09 ක වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව නඩු 10 ක් අධිකරණයේ ගොනුකර ඇති අතර, වන්දි සංඛ්‍යාව තීරණය නොවූ නඩු සංඛ්‍යාව 05 ක් විය. අධිකාරිය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 901 ක් ගොනුකර තිබුණු අතර ඒ වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 105.93 ක් ලැබිය යුතුව තිබුණි.

(ට) මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් බාහිර පාර්ශවයන්, කොන්ත්‍රාත්කරුවන් හා කාර්ය මණ්ඩලය වෙත ලබාදුන් අත්තිකාරම්, තැන්පතු හා ලැබිය යුතු ශේෂයන් හි එකතුව රු.මිලියන 1,299.89 ක් වූ අතර එහි ඇතුලත් වසර 03 ට හා 05 ට වැඩි කොන්ත්‍රාත්කරුවනගෙන් හා බාහිර පාර්ශවයන්ගෙන් නිරවුල් කරගත යුතු අත්තිකාරම් ශේෂය පිළිවෙලින් රු.මිලියන 205.47 ක් හා රු.මිලියන 64.29 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ශේෂයන් නිරවුල් වී නොතිබුණි.

(ඩ) 2019 දෙසැම්බර් 31 දිනට දැන්වීම් පලකිරීම වෙනුවෙන් සෙවණ මාධ්‍ය අංශය වෙත ලැබිය යුතු රු.මිලියන 67.83 තුල වසර 05 ට වැඩි හිඟ මුදල රු.මිලියන 12.32 ක් විය. එසේම අධිකාරියේ දැන්වීම් පලකිරීම වෙනුවෙන් සෙවණ මාධ්‍ය අංශය වෙත ලැබිය යුතු හිඟ මුදල රු.මිලියන 44.61ක් ඒ තුල ඇතුළත් වූ අතර එයින් රු.මිලියන 42.61 ක් 2019 වර්ෂයේ මාධ්‍ය කටයුතු වෙනුවෙන් පමණක් වියදම්වී තිබුණි. එසේම නියෝජිත ආයතන සමඟ කටයුතු කිරීමේදී මාධ්‍ය ආයතන වෙත දින 45 ක් ඇතුළත මුදල් ගෙවිය යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට මාස 03 ඉක්මවූ ගෙවිය යුතු මුදල රු.මිලියන 3.46 ක් විය.

(ත) 2003 වර්ෂයේදී ලිබර්ටි ප්ලාසා සංචාරක බංගලාව (OVDC) ආයතනයට රු. මිලියන 09 කට විකුණා තිබූ අතර, ඒ සඳහා රජයේ තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තක්සේරුව අනුව එය රු.මිලියන 12.9 ක් වූ අතර, අධිකාරියේ සභාපති විසින් පත්කල මිල කමිටුව අනුව එම අගය රු.මිලියන 11.52 ක් වුවද මෙම මිල ගණන් සඳහාඅධිකාරියේ මිල කමිටුවේ අනුමැතියකින් තොරව එම සමාගම විසින් සිදුකරන ලද අළුත්වැඩියා වියදම වූ රු.මිලියන 2.52 ක් අඩුකර යථෝක්ත වටිනාකමට විකුණා තිබුණි. මෙම අළුත්වැඩියා වියදම් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ද) 1999 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 99/1165/21/122 ට අනුව අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමේදී වර්තමාන තක්සේරුව පදනම් කරගත යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා අභ්‍යන්තර චක්‍රලේඛ පදනම් කරගෙන අධිකාරිය සතු නිවාස, ඉඩම් හා සාප්පු සංකීර්ණ අනවසර පදිංචිකරුවන් වෙත ඔවුන් පදිංචි වූ වර්ෂයන්හි තක්සේරු අගයන්ට පැවරීම සිදුකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(න) 1979 අංක 17 දරන නිවාස සංවර්ධන අධිකාරී පනතේ 9 වන වගන්තියට අනුකූල නොවන පරිදි නිවාස සංවර්ධන අධිකාරිය විසින් එකම පුද්ගලයෙකු වෙත මත්තේගෙඩ හා මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමයන්හි නිවාස දෙකක් ලබාදී තිබුණු අතර, 9855 (4/2020) දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ඔහුගේ ඉල්ලීම් මත පළමුව ලබාදුන් නිවස නැවත අධිකාරියට පවරා ගැනීමට තීරණය කර තිබූ අතර 2020 ජූනි 30 වන විටද එම ගැටළුව විසඳා ගෙන නොතිබුණි.

(ප) 80/90 දශකය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බදු පදනම් යටතේ ලබාදුන් ගම්මාන 12 කට අදාල හෙක්ටයාර් 60.59 ක්වූ ජනඋදාන ඉඩම් කොටස් 413 ක තක්සේරු ඉඩම් වටිනාකම රු.මිලියන 13.48 ක් වූ අතර මේම මුදල් අයකරගෙන ප්‍රතිලාභීන්ට එම ඉඩම් පවරාදීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද, එම දශකයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජන උදාන ගම්මාන 03 ක වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 7.459 ක් වූ ඉඩම් කොටස් 44 ක් තක්සේරුකර එහි වටිනාකම හඳුනා ගැනීමටද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(බ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ගම්පහ, කොළඹ, ගාල්ල, මාතර, පුත්තලම, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්කවල හිස් ඉඩම්වල පදිංචි, අනවසර පදිංචිකරුවන් 121 දෙනෙකුගෙන් අයකර ගැනීමට අපේක්ෂිත මුළු තක්සේරු වටිනාකම රු.මිලියන 43.55 ක් වූ අතර, අඩු ආදායමලාභී නොවන අනවසර පදිංචිකරුවන් 25 දෙනෙකුගෙන් අයකර ගැනීමට අපේක්ෂිත තක්සේරු වටිනාකම් රු.මිලියන 25.85 ක්ද ඒ තුල විය. එසේ වුවද අධිකාරිය විසින් එම අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ම) අධිකාරිය විසින් තම පරිපාලන සමාගමේ රු.මිලියන 120 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2013 වර්ෂයෙන් පසු අධිකාරිය වෙත කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. එසේ වුවත් 2015 සිට 2019 වර්ෂය දක්වා පරිපාලන සමාගම විසින් එකතුව රු. මිලියන 615 ක ලාභ උපයාගෙන තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති